288 වන කාණ්ඩය - 12 වන කලාපය
தொகுதி 288 - இல. 12
Volume 288 - No. 12

2022 පෙබරවාරි 25වන සිකුරාදා
2022 பெப்ருவரி 25, வெள்ளிக்கிழமை
Friday, 25th February, 2022

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
අධිභාර බද්ද පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා**

**ශෝක ප්‍රකාශ:**
ගරු ආනන්ද රත්නායක මහතා
ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මහතා
ගරු සෝමවීර චන්ද්‍රසිරි මහතා
ගරු පී.බී. දිසානායක මහතා
ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
மிகைக்கட்டண வரி சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்**

**அனுதாபத் தீர்மானங்கள்:**
மாண்புமிகு ஆனந்த ரத்னாயக்க
மாண்புமிகு ஆர்.ஆர்.டப்ளியூ. ராஜபக்ஷ
மாண்புமிகு சோமவீர சந்திரசிறி
மாண்புமிகு பி.பீ. திசாநாயக்க
மாண்புமிகு எச்.ஆர். மித்ரபால

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Surcharge Tax Bill: Petitions to the Supreme Court

AUDITOR-GENERAL'S REPORT

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

VOTES OF CONDOLENCE:
Hon. Ananda Ratnayake
Hon. R.R.W. Rajapakshe
Hon. Somaweera Chandrasiri
Hon. P.B. Dissanayake
Hon. H.R. Mithrapala

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2022 පෙබරවාරි 25වන සිකුරාදා***
*2022 பெப்ருவரி 25, வெள்ளிக்கிழமை*
*Friday, 25th February, 2022*

**පූ.භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### අධිභාර බද්ද පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
### மிகைக்கட்டண வரி சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
### SURCHARGE TAX BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "අධිභාර බද්ද" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් හතරක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව,

- 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XIX සහ XX කොටස්;
- 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XXIX හා XXX කොටස් සහ සිව්වැනි කාණ්ඩයේ XIX, XX හා XXI කොටස්; සහ
- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XXIII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX හා XXXI කොටස් සහ සිව්වැනි කාණ්ඩයේ X, XI, XII, XIII, XIV හා XV කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## II

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ,

- හම්බන්තොට, අනුරාධපුර, වවුනියාව සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හි ඛනිජ ද්‍රව්‍ය (කළුගල්) කැණීම සඳහා රජයේ ඉඩම් බදු දීම, පාලනය සහ රාජ්‍ය භාගය අය කිරීම පිළිබඳ කාර්ය සාධන විගණන වාර්තාවේ - VII කොටස - 2021;
- ශ්‍රී ලංකාවේ භූගත ජල කළමනාකරණයේ නීතිමය යන්ත්‍රණය හා එහි ක්‍රියාකාරිත්වය ඇගයීම සම්බන්ධ විගණන වාර්තාවේ - I කොටස - 2022;
- ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු වීමේ කාර්ය සාධන වාර්තාව සම්බන්ධ විගණන වාර්තාවේ - II කොටස - 2022; සහ
- නව පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ඇගයීම සම්බන්ධ විගණන වාර්තාවේ - III කොටස - 2022 මම ඉදිරිපත් කරමි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු චින්තක අමල් මායාදුන්න මහතා**
(மாண்புமிகு சிந்தக அமல் மாயாதுன்ன)
(The Hon. Chinthaka Amal Mayadunna)

ගරු කථානායකතුමනි, ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, කිතුල්ගල, මිරිස්වලතැන්න, අංක ඕ/28/1 දරන ස්ථානයෙහි පදිංචි හේනගෙදර රත්නවංශ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දුමින්ද දිසානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා (කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியல் நிஷாந்த த சில்வா - மகளிர் மற்றும் சிறுவர் அபிவிருத்தி, முன்பள்ளி மற்றும் ஆரம்பக்கல்வி, பாடசாலைகள் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் கல்விச் சேவைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Piyal Nishantha De Silva - State Minister of Women and Child Development, Preschools and Primary Education, School Infrastructure and Education Services)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) වස්කඩුව, මහ වස්කඩුව, ශ්‍රී ධීරානන්ද මාවත, "අරුණ" යන ලිපිනයෙහි පදිංචි අසුරමුනි දර්ශන ෆොන්සේකා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ
(2) පන්නිපිටිය, කළල්ගොඩ පාර, අංක 63/ටී/1 දරන ස්ථානයෙහි පදිංචි එම්.බී. ද එස්. ජයතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு சாரதீ துஷ்மந்த)
(The Hon. Sarathi Dushmantha)

ගරු කථානායකතුමනි, යටියන්තොට, වී ඔය, 4 කණුව යන ලිපිනයෙහි පදිංචි එම්.එන්. මුතුනායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

ගරු කථානායකතුමනි, නුගේගොඩ, ගංගොඩවිල, පරණ කැස්බෑව පාර, පළමුවැනි පටුමග, අංක 12 දරන ස්ථානයෙහි පදිංචි පී. සෝමාවතී දාබරේ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු මිලාන් ජයතිලක මහතා**
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) වග, බ්‍රන්ඩිගම්පල, අංක 56/3 දරන ස්ථානයෙහි පදිංචි ඒ.එල්.එස්. පද්මිණී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ
(2) කිරිඳිවැල, මැද්දේගම, සිරියා මාවත, අංක 125 දරන ස්ථානයෙහි පදිංචි එම්. ගබෝනා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2022 පෙබරවාරි 17 දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී තීරණය කළ පරිදි අද දිනට නියමිත වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වෙනත් දිනයකට යොමු කරනු ලැබේ.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2022 ජනවාරි 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා 1.30 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අද දින ශෝක ප්‍රකාශ යෝජනා පැවැත්වෙන හෙයින් සාමාන්‍යයෙන් වෙනත් කරුණු විවාදයට ගන්නේ නැහැ. නමුත්, ඊයේ දිනයේ ඔබතුමාගේ අවධානයට යම් යම් බරපතළ කරුණු ටිකක් ඉදිරිපත් කරන්න අපට සිද්ධ වුණා. ගරු කථානායකතුමනි, ඒ බරපතළ කරුණු පිළිබඳව ඔබතුමා අදාළ පියවර ගනීවි කියා අපි බලාපොරොත්තු වෙනවා. මුළුමහත් පාර්ලිමේන්තුවේම යහපත පිණිස එවැනි තීරණයකට එළඹීම ඉතාම වැදගත් කියා මම හිතනවා. එහෙම නැත්නම්, හදිසි පක්ෂ නායක රැස්වීමක් හෝ කැඳවා මේ ගැන තිබෙන තත්ත්වය සාකච්ඡා කරලා කටයුතු කිරීම අතිශය හදිසි කටයුත්තක් ලෙස සැලකීම වැදගත් වෙනවා. ශෝක ප්‍රකාශ යෝජනාවලට නියමිත අභාවප්‍රාප්ත ගරු මන්ත්‍රීවරුන්ට ගරු කිරීමක් වශයෙන් අපි දෙපාර්ශ්වයම මේ කාරණය සම්බන්ධයෙන් අද කථා කරන්නේ නැහැ. නමුත්, මීළඟ පාර්ලිමේන්තු දිනය එන්නේ තව දින 10කට පසුව. ඒ නිසා මේ බරපතළකම වෙනුවෙන් මැදිහත් වෙන්න කියා යළිත් ගරු කථානායකතුමාගෙන් මේ අවස්ථාවේදී මම ඉල්ලා සිටිනවා. මොකද, මේ කාරණයට මුල් තැන දෙන්න ඕනෑ නිසා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඔබතුමාත්, ගරු සභානායකතුමාත්, මමත් සෑහෙන කාලයක සිට මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඇත්ත වශයෙන්ම කිව්වොත්, මේ වාගේ සිද්ධි හැම පාර්ලිමේන්තුවකම වුණා. මට මතකයි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ ගරු සභාවේ වාඩිවෙලා ඉන්නකොට එක් වතාවක් මල් වඩමක් ගෙනැල්ලා තැබුවා. මේ වාගේ සිද්ධි වෙනවා. ඇත්ත වශයෙන්ම මෙවැනි සිද්ධි අපේ පාර්ලිමේන්තු සම්ප්‍රදායේ කොටසක් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ සිද්ධිය සම්බන්ධයෙන් ඔබතුමා අවසන් තීරණය ගන්න. නමුත්, මීට වඩා බරපතළ දේවල් මේ පාර්ලිමේන්තුව ඇතුළේ වෙලා තිබෙනවා. කෙසේ නමුත්, ඔබතුමාගේ තීරණයට අපි ගරු කරනවා. නමුත්, ඒ තීරණය ගන්නකොට පොඩ්ඩක් කිරලා, මැනලා ඒක කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මටත් විනාඩියක් දෙන්න.

ගරු සභානායකතුමා විශේෂයෙන්ම කියන මේ කාරණාව ගත්තාම අපි දන්නා විධියට නම් ඇමතිවරුන්ට, නියෝජ්‍ය ඇමතිවරුන්ට සහ රාජ්‍ය ඇමතිවරුන්ට මේ ටෝච් එක කියන එක ඔවුන්ගේ සන්තකයේ තබා ගන්න හිමිකමක් තිබෙනවා. අපි දැක්කා, සමහර රාජ්‍ය ඇමතිවරු එය ලිඛිතව ඉල්ලා තිබුණු බවත්. ඒ අනුව, තමන්ට නීත්‍යානුකූලව හිමිකමක් තිබෙන කාර්යයක්, ටෝච් එකක් ගෙන ඒම පිළිබඳවයි මේ ගැටලුව මතු වෙලා තිබෙන්නේ. ඊයේ ටෝච් ගෙන ඒමෙන් මේ පාර්ලිමේන්තුවට හානියක් වුණාද? කාගේ හෝ ජීවිතයකට හෝ දේපළකට හානි සිදු වෙලා තිබෙනවාද? මිරිස් කුඩු ගහලා, පුටු පෙරළා වුණා වාගේ දැවැන්ත හානියක් මේ තුළින් සිදු වුණාද, ගරු කථානායකතුමනි?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, ඒ සිද්ධිය පිළිබඳව දිගින් දිගටම කථා කරන්න අපි බලාපොරොත්තු වන්නේ නැහැ. විශේෂයෙන්ම ශෝක ප්‍රකාශ යෝජනා ගන්නා දවසේ මම බොහොම අකැමැතියි, වෙනත් දේවල් ගැන කථා කරන්න. හැබැයි, මෙතැන තිබෙන ප්‍රශ්නය ටෝච් එක නොවෙයි. ඊයේ මම ගේට්ටුව ළඟින් යද්දි පොලිස් නිලධාරින් පැය භාගයක් විතර මා සමඟ කථා කරලා මාව දැනුවත් කළා, හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ඔවුන්ගේ වැඩ තහනම් කරන්න හදනවා කියලා. ඒක වැරදියි. ඒ පොලිස් නිලධාරින් කිව්ව විධියට, හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ බෑග් එකේ ටෝච් එකක් තිබිලා, එය එතුමාගේ පෞද්ගලික දෙයක් කියලා Serjeant-at-Armsටත් දන්වා, එතුමා කොහොම හරි ඒ ටෝච් එක ඇතුළට අරගෙන ගිහින් තිබෙනවා. හැබැයි, ඒ අවස්ථාවේදී ඊට වඩා බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඉන් පසු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාත්, මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමාත් නැවත වාරයක් එළියට ගිහින් පාර්සලයක් ගෙනැල්ලා තිබෙනවා. ඒ පාර්සලය ගෙන යන්න එපා කියද්දි scanner එකට දමලා එය පාර්ලිමේන්තුව ඇතුළට බලහත්කාරයෙන් ගෙන ගොස් තිබෙනවා. මේකයි ගැටලුව.

කිරිඇල්ල මන්ත්‍රීතුමා කියපු කාරණයට මමත් එකඟ වෙනවා. අපිත් රණ්ඩු වෙලා තිබෙනවා. අපිත් ඒ කාලයේ කොළ හංගාගෙන මෙහාට ඇවිල්ලා තිබෙනවා. ඔබතුමා කියපු විධියට ඒක සාමාන්‍ය දෙයක්. ඒක අපටත් ගැටලුවක් නොවෙයි. ගරු කථානායකතුමනි, ඉතිහාසයේ මේ පාර්ලිමේන්තුවට බෝම්බ ගහලාත් තිබෙනවා. ඒක කළේ බත් පැකට් එක ඇතුළේ බෝම්බ හංගාගෙන ගෙනැල්ලා බව අපි දන්නවා. ඒ වාගේ සිද්ධීන් මේ පාර්ලිමේන්තුවේ වෙලා තිබෙනවා. එතුමා කිව්වා, මිරිස් කුඩු සිද්ධිය ගැනත්. මම මේ දේවල් නැවත අදින්න කැමැති නැහැ. ඒ වාගේම මීට කලින් මේ පාර්ලිමේන්තුවට පිහියක් පවා අරගෙන ඇවිල්ලා තිබෙනවා. ඒ සිද්ධියට අදාළ වීඩියෝ එක slow motion දමා බලද්දි පේනවා, ප්‍රසන්න රණවීර මැතිතුමාගේ බෙල්ල ළඟින් ඒ පිහිය නතර වන ආකාරය. ඕනෑ නම්, මම ඒ වීඩියෝ එක ගෙනැල්ලා පෙන්වන්නම්. මිරිස් කුඩු සිද්ධිය වාගේ ඒවා පවා ඇති වෙලා තිබෙනවා. අපි නැහැ කියන්නේ නැහැ. හැබැයි, මේ විධියට පාර්සලයක් බලහත්කාරයෙන් ඇතුළට ගෙන යන එක ප්‍රශ්නයක්. මේ සිද්ධියට සම්බන්ධ පොලිස් නිලධාරි මහත්මයා අපට

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

කියනවා, "අපි ගෙනියන්න එපා කියලා කිව්වාට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් එහෙම පාර්සලයක් ගෙනයනකොට අපි මොනවාද කරන්නේ?" කියලා. ඒ ඔක්කොම CCTV camerasවල පටිගත වෙලා තිබෙනවා ලු. පොලීසියේ නිලධාරින් ඉල්ලීමක් කරනවා, ඒ ගොල්ලන් interdict කරන්නේ නැතිව මේ ගැන සොයන්න කියලා. ඒ, නිලධාරින් අහිංසකයි. ඔවුන් අද උදේත් මගෙන් අහනවා, "ගරු ඇමතිතුමනි, අපි බලහත්කාරයෙන් මන්ත්‍රීතුමකු අල්ලා ගෙන නතර කරන්නේ කොහොමද?" කියලා. වැරැද්ද තිබෙන්නේ ඒ මන්ත්‍රීතුමා ටෝච් එක ගෙනියපු එක නොවෙයි, දෙවන වර බලහත්කාරයෙන් පාර්සලයක් ඇතුළට ගෙනියපු එකයි. ඒක කිරිඇල්ල මන්ත්‍රීතුමාත් පිළිගන්නවා, මමත් පිළිගන්නවා. මේකෙන් විශාල විනාශයක් සිදුවන්න පුළුවන්. මේ ගරු සභාවට අතිගරු ජනාධිපතිතුමා එනවා, ගරු අගමැතිතුමා එනවා, විපක්ෂ නායකතුමා එනවා, හිටපු ජනාධිපතිතුමා එනවා, ඇමතිවරු එනවා, මන්ත්‍රීවරු එනවා. ඒ වාගේ දෙයක් ගෙනැල්ලා මීට වඩා විනාශයක් වුණොත් අපි මොකක්ද කරන්නේ? අපි දැක්කා නේ, පාස්කු ප්‍රහාරයේදී සිදු වුණු දේ. 97 වතාවක් කියලාත් කිසි දෙයක් කරන්නේ නැතිව හිටපු නිසා අහිංසක මිනිස්සු විශාල සංඛ්‍යාවක් මැරුණා.

ගරු කථානායකතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ ගැන පරීක්ෂණයක් සිදු කරන්න කියලා. ඒ වාගේම මේ සම්බන්ධව සොයන්න කියා පොලිස්පතිතුමාගෙනුත් ඉල්ලීමක් කරන්න. ඒ නිලධාරින් කියන්නේ තමන්ගේ රාජකාරියට බාධා කිරීමක් සිදු කළ බවයි. ඒ නිසා මේ ගැන හරියට හොයලා, මේ වාගේ දෙයක් නැවත සිදු නොවෙන්න කටයුතු කරන්න, ගරු කථානායකතුමනි. විපක්ෂය මේ ගරු සභාවට ඇවිල්ලා උද්ඝෝෂණ කළා, අපි කවදාවත් ඒවා නතර කළේ නැහැ. ඒ දේවල් ගැන ප්‍රශ්නයක් නැහැ. අපිත් ඒවා කරලා තිබෙනවා, ඔබතුමන්ලාත් ඒවා කරන්න ඕනෑ. ඒක ඇත්ත. හැබැයි, මේ විධියට පාර්සලයක් බලහත්කාරයෙන් ගේනවා කියන්නේ වරදක්. CCTV camerasවල ඒවා පටිගත වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ ගැන වහාම සොයන්න කියා මම ඔබතුමාගෙන් නැවත ඉල්ලා සිටිනවා. මේ වාගේ දෙයක් මතුවට සිදු නොවෙන්න ඕනෑ. ඒ අය, අහිංසක පොලිස් නිලධාරින්. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පාර්සලයක් අරගෙන යද්දී, බලහත්කාරයෙන් අතින් අල්ලාගෙන පරීක්ෂා කිරීමක් කළා නම් එම නිලධාරියාට ලොකු ප්‍රශ්නයක් වෙන්න ඉඩ තිබෙනවා. නමුත් ඔහු කියනවා "දැන් මාව interdict කරන්න හදනවා" කියලා. එතැන ඉදිරියෙන් හිටපු ඔක්කොගේම වැඩ තහනම් කරන්න හදනවා. ඊට වඩා හොඳ, ඒ වැරැද්ද කළා නම් -රාජකාරියට බාධා කළා නම්- රාජකාරියට බාධා කරපු එක ගැන සොයලා ඒ සම්බන්ධයෙන් නීත්‍යනුකූලව කටයුතු කරන එකයි. එසේ කටයුතු කරන්න කියලා මා ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි. ඒ වාගේම, මින් මතුවට මේ වාගේ දෙයක් නොවන්නත්, පාර්ලිමේන්තුවේ ආරක්ෂාව තහවුරු කර දෙන්නත් අවශ්‍ය කටයුතු කරන්න කියා මම ඔබතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මම මේ අවස්ථාවේදී පක්ෂ නායකවරුන් සියලුදෙනාට මේ කාරණය මතක් කරනවා. අපි පක්ෂ නායක රැස්වීමේදී යම් යම් තීරණ ගත්තා. ඒ තීරණවලට අනුකූල වීම -අනුගත වීම- ඒ ඒ පක්ෂවල සාමාජික මන්ත්‍රීවරුන්ගේ වගකීම හා යුතුකම වෙනවා. එහෙම නැත්නම්, පක්ෂ නායක රැස්වීමක් පැවැත්වීමේ තේරුමක් නැහැ. එහිදී සිදු වෙලා තිබෙන දේ ගැන මට වාර්තාව ලැබී තිබෙනවා, මේ මොහොත වන කොට. දෙවැනි සැරේට ගෙන ආ පාර්සලය තමයි මේ අරගළයට හේතු වෙලා තිබෙන්නේ. ඒ පොලිස් නිලධාරින්ට කෑ ගහලා, බැණලා තමයි එය ගෙනැල්ලා තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම, මම පොලිස්පතිතුමාට පැමිණිලි කරනවා, මේ ගැන පරීක්ෂණයක් කරන්න කියලා. තමන්ගේ විරෝධතාව ප්‍රකාශ කළාට කිසිම අවුලක් නැහැ. ඒක නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මෙතැන තිබෙන්නේ, රජයේ නිලධාරින්ට බාධා කිරීම. ඒ නිලධාරින් තමන්ගේ රාජකාරියයි කරන්නේ. පක්ෂ නායකයන් වශයෙන් ගත් තීරණ අපි ඒ උදවියට දැනුම් දීලා තිබෙනවා. දැනුම් දුන් ඒ තීරණ ක්‍රියාත්මක කිරීමයි ඒ උදවිය කරන්නේ. ඒ උදවිය අපහසුතාවට පත් වන විධියට අප කටයුතු කරනවා නම් එතැන බරපතළ වැරැද්දක් තිබෙනවා. ඒ ගැන පරීක්ෂණයක් කරලා අප ගත යුතු ක්‍රියා මාර්ගය කුමක්ද කියන එක මම සභාවට දන්වන්නම්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ඔබතුමා ගන්නා තීන්දුව පිළිබඳව අපට ගැටලුවක් නැහැ. හැබැයි ගරු කථානායකතුමනි, මෙහිදී අපට පෙනෙන කාරණය තමයි, දෙවන අවස්ථාවේ පාර්සලයක් ගෙනැවිත් තිබෙනවා, එහිදී යම් බාධාවක් සිදු වෙලා තිබෙනවා කියන එක. දෙවන අවස්ථාවේ පාර්සලය ගෙනැල්ලාත් පාර්ලිමේන්තුව තුළ ඔය කියන්නා වූ කිසිම බෝම්බ පිපිරීමක් හෝ ජීවිත හානි කිසිවක් සිද්ධ වෙලා නැහැ. හැබැයි අපි දකිනවා, හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා පසුගිය කාලයේ කරපු කිසිම දෙයක් සම්බන්ධයෙන් එතුමාව අත් අඩංගුවට ගන්න බැරි වෙලා තිබෙන බව. දැන් මේ හරහා එතුමා අත් අඩංගුවට ගන්න යනවා නම්, පාර්ලිමේන්තු වරප්‍රසාද ඒ සඳහා භාවිත කරන්න එපා කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ඒ ගැන බලමු.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, TV එකේ යන්නේ තමා අත් අඩංගුවට ගන්න හදනවා කියමින් කරන එතුමාගේ කථාව විතරයි. එතුමා අත් අඩංගුවට ගන්න කියලා අපි කවුරුවත් කියලා නැහැ. අප කියන්නේ, එවැනි බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා, ඒ පිළිබඳව සොයන ලෙසට ඔබතුමා නියෝගයක් කරන්න, රාජකාරියට බාධා කර තිබෙනවා නම් නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. ගරු කථානායකතුමනි, ඒ වාගේම තමයි බොරැල්ල පල්ලියේ බෝම්බ තියපු අය, රෝහලේ බෝම්බ තියපු අය, බෙල්ලන්විල පන්සලේ බෝම්බ තියපු අය දැන් හෙළිවේගෙනයි එන්නේ. මේවාට ඉඩ දෙන්න විධියක් නැහැ, මේ රජය යටතේ. පාර්ලිමේන්තුවේ ආරක්ෂාව සඳහා ඔබතුමා මේ පරීක්ෂණ කටයුතු සාධාරණව ඉටු කරයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කිරීම, ගරු අගමැතිතුමා.

**ගරු මිලාන් ජයතිලක මහතා**
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මිලාන් ජයතිලක මන්ත්‍රීතුමනි, ගරු අගමැතිතුමා කථා කරන්න නැඟිට්ටා. ඔබතුමා ඉඳගන්න.

## ශෝක ප්‍රකාශ: ගරු ආනන්ද රත්නායක මහතා, ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මහතා, ගරු සෝමවීර චන්ද්‍රසිරි මහතා, ගරු පී.බී. දිසානායක මහතා සහ ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා

## அனுதாபத் தீர்மானங்கள்: மாண்புமிகு ஆனந்த ரத்நாயக்க, மாண்புமிகு ஆர்.ஆர்.டப்ளியூ. ராஜபக்ஷ, மாண்புமிகு சோமவீர சந்திரசிறி, மாண்புமிகு பி.பீ. திசாநாயக்க மற்றும் மாண்புமிகு எச்.ஆர். மித்ரபால

## VOTES OF CONDOLENCE: HON. ANANDA RATNAYAKE, HON. R.R.W. RAJAPAKSHE, HON. SOMAWEERA CHANDRASIRI, HON. P.B. DISSANAYAKE AND HON. H.R. MITHRAPALA

**[පූ.භා. 10.17]**

**ගරු මහින්ද රාජපක්ෂ මහතා (අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා)**

(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ - பிரதம அமைச்சரும் பொருளாதாரக் கொள்கைகள் மற்றும் திட்டச் செயற்படுத்துகை அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும்)

(The Hon. Mahinda Rajapaksa - Prime Minister, Minister of Economic Policies and Plan Implementation, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරුන් වන ආනන්ද සරත් කුමාර රත්නායක, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ, සෝමවීර චන්ද්‍රසිරි, පී.බී. දිසානායක සහ එච්.ආර්. මිත්‍රපාල යන මැතිතුමන්ලාගේ අභාවයන් පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව මේ අවස්ථාවේ මා ගරු සභාවට ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, පොළොන්නරුවෙන් දේශපාලනයට පිවිසි ආනන්ද සරත් කුමාර රත්නායක මහතා උතුරු මැද පළාත් සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කළ අතර, අභාවප්‍රාප්ත වන විටත් එතුමා එම පළාත් සභාවේ සභානායකවරයා ලෙස කටයුතු කරමින් සිටියා.

1977 වර්ෂයේදී ක්‍රියාකාරී දේශපාලනයට පිවිසි එතුමා උතුරු මැද පළාත් සභාවේ විවිධ තනතුරු දැරුවා. 2001 වසරේදී පැවැති මහ මැතිවරණයේදී පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරමින් එතුමා මැති සබයට පත් වුණා. දේශපාලනයේ කුමන තනතුරක් දැරුවත් එතුමා එම නිලතලවලින් උඩඟු වුණේ නැහැ. ඒ හැම තනතුරක්ම එතුමා භාවිත කළේ ජනතාව වෙනුවෙන් සේවය කිරීමටයි.

පොළොන්නරුව පලුගස්දමන විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපතිවරයා ලෙසත්, උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙසත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙසත් එතුමා පොළොන්නරුව ජනතාවට කළ සේවය අගය කළ යුතු බව මා මෙහිදී සිහිපත් කළ යුතුයි.

ගරු කථානායකතුමනි, මීළඟට මා කථා කරන්නේ, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මහතා ගැනයි. 1965 වර්ෂයේ පැවැති මහ මැතිවරණය සඳහා දොඩම්ගස්ලන්ද ආසනයෙන් තරග කළ ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා එම ආසනයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වුණු පළමුවන ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රීවරයා ලෙසයි පාර්ලිමේන්තුවට පැමිණියේ.

කොළඹ නාලන්දා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකු වූ එතුමා ලංකා විශ්වවිද්‍යාලයේ උපාධිධරයෙකු ද වනවා. නීති විද්‍යාලයේ අධ්‍යාපනයෙන් පසුව එතුමා වසර 50කට ආසන්න කාලයක් නීතිඥයෙකු ලෙසත් කටයුතු කළා. කුරුණෑගල නීතිඥ සංගමයේ සභාපතිවරයා වශයෙන් නීතිඥ ක්ෂේත්‍රයට එතුමා විසින් විශාල කාර්ය භාරයක් ඉටු කරනු ලැබුවා.

1955 වර්ෂයේදී ගම් සභාව නියෝජනය කරමින් දේශපාලනයට පිවිසි රාජපක්ෂ මැතිතුමා 1960 මාර්තු සහ ජූලි මාසවල පැවැති මහ මැතිවරණ දෙකට කොමියුනිස්ට් පක්ෂයෙන් හා ස්වාධීන අපේක්ෂකයෙකු ලෙස දොඩම්ගස්ලන්ද ආසනයට තරග කර දෙවන ස්ථානයට පත් වුණා. 1966 වර්ෂයේදී එතුමාට එරෙහිව ඉදිරිපත් වූ ඡන්ද පෙත්සමකින් එතුමාගේ මන්ත්‍රී ධුරය අහිමි වුණා. නමුත්, 1967 වර්ෂයේදී දොඩම්ගස්ලන්ද අතුරු මැතිවරණයට සිය භාර්යාව වන ලිලියන් ලැටිෂියා රාජපක්ෂ මැතිනිය ඉදිරිපත් කර ජයග්‍රහණය කරවන්නට එතුමාට හැකි වුණා. රාජපක්ෂ මැතිතුමා 2017 වසරේදී තමයි අභාවප්‍රාප්ත වුණේ. එතුමා කැපී පෙනෙන සේවාවක් ඉටු කළ සමාජ ක්‍රියාකාරිකයකු බව මා විශේෂයෙන් සඳහන් කළ යුතුයි.

ගරු කථානායකතුමනි, ඊළඟට මා කථා කරන්නේ අභාවප්‍රාප්ත සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා ගැනයි. සම සමාජ තරුණ ව්‍යාපාරය හා එක්ව දේශපාලනයට එන සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා 1982 වසරේදී පැවති පළමු ජනාධිපතිවරණයේ දී හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ මැතිවරණ ව්‍යාපාරයට විජය කුමාරතුංග මහතා සමඟ එක්ව ක්‍රියාකාරිව සහාය ලබා දුන් බව අපි දන්නවා. 1983 මහරගම අතුරු මැතිවරණයට ඉදිරිපත් වූ දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට සහාය දක්වමින් එවක පටන් මහජන එක්සත් පෙරමුණේ ක්‍රියාකාරී නායකයකු ලෙස එතුමා කටයුතු කළා. ලංකා කම්කරු සමිති මධ්‍ය මණ්ඩලයේ ලේකම් ලෙස කටයුතු කරමින් ලංකා බැංකුව, වානේ සංස්ථාව ආදී රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කිරීමට එරෙහිව වෘත්තීය සමිති සටන් ව්‍යාපාර සඳහා සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා නායකත්වය දුන්නා. ඒ වාගේම මට මතකයි, එදා පාද යාත්‍රාව සාර්ථක කර ගැනීමටත් එතුමා දායක වුණා. 1967 දී මහජන එක්සත් පෙරමුණෙන් කඩුවෙල ප්‍රාදේශීය සභාවට තේරී පත් වූ එතුමා ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් විශාල සේවයක් ඉටු කළා.

2000/2001 කාලයේදී ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙකු ලෙස පාර්ලිමේන්තුවට පිවිසි සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අධීක්ෂණ මන්ත්‍රීවරයා ලෙස මහත් සේවාවක් ඉටු කළ බව අපි දන්නවා. ඒ වාගේම මගේ ජනාධිපතිවරණ ජයග්‍රහණ වෙනුවෙන් ද එතුමා ක්‍රියාශීලීව දායක වූ බව මෙහිදී සිහිපත් කළ යුතුයි. 2019 දී අභාවප්‍රාප්ත වූ සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා කම්කරු ව්‍යාපාරය සහ ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාර ශක්තිමත් කිරීමට සැම විටම උත්සාහ කළා.

අභාවප්‍රාප්ත පී.බී. දිසානායක මැතිතුමා ගැනයි මා දැන් සඳහන් කරන්නේ, ගරු කථානායකතුමනි. 1963 දී ගුරු වෘත්තියෙන් සමාජ සේවය අරඹන පී.බී. දිසානායක මැතිතුමා 1991 වසරේදී ගුරු වෘත්තියෙන් විශ්‍රාම ගත්තා. ඉන් අනතුරුව ක්‍රියාකාරී දේශපාලනයට පිවිසෙන එතුමා 1991 වසරේදී පළාත් පාලන මැතිවරණයට තරග කර, තලාව ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායක ලෙස පත් වුණා.

[ගරු මහින්ද රාජපක්ෂ මහතා]

1993 වසරේදී පැවැති උතුරු මැද පළාත් සභා මැතිවරණයෙන් පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස පත් වුණු එතුමා, 1994 වසරේ පැවැති පාර්ලිමේන්තු මැතිවරණයෙන් පොදු පෙරමුණ නියෝජනය කරමින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත් වුණා. 2003 වසරේ නැවතත් පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත් වුණු දිසානායක මහතා උතුරු මැද පළාත් සභාවේ සභාපති ධුරයට පත් වුණා.

උතුරු මැද පළාතේ ජනතාව වෙනුවෙන් කැපී පෙනෙන සේවාවක් ඉටු කළ පී.බී. දිසානායක මැතිතුමා සෑම විටම මහජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටි බව සඳහන් කළ යුතුයි. ඒ සඳහා එතුමාට ගුරු සේවයේ සිටියදී ලද අත්දැකීම් පන්නරයක් වන්නට ඇතැයි මා සිතනවා. දීර්ඝ කාලයක් මහජන නියෝජිතයෙකු ලෙස කටයුතු කළ එතුමා 2015 වසරේ සිට උතුරු මැද පළාත් ආණ්ඩුකාරවරයා ලෙසත්, 2018 වර්ෂයේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා ලෙසත් කටයුතු කරමින් රජරට සහ මධ්‍යම පළාත්වලට තම සේවාව සැපයූ බව සඳහන් කළ යුතුයි. එතුමා අභාවප්‍රාප්ත වුණේ 2019 වසරේදී. එතුමා දේශපාලන ක්‍රියාකාරිකයෙකු ලෙස කළ සේවය අප හැම විටම අගය කළ යුතුයි.

ගරු කථානායකතුමනි, ඊළඟ ශෝක යෝජනාව මා ඉදිරිපත් කරන්නේ අභාවප්‍රාප්ත එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා වෙනුවෙන්. ලංකා සමසමාජ පක්ෂයෙන් ක්‍රියාකාරී දේශපාලනයට පිවිසි එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා, පළමුව 1988දී සබරගමුව පළාත් සභාවට තේරී පත් වෙමින් එහි විපක්ෂ නායක ධුරයත් දැරුවා. 1993දී නැවතත් කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වැඩිම මනාප ලබා ගනිමින් එතුමා සබරගමුව පළාත් සභාවට පත්වුණා. 1994 වර්ෂයේදී පැවැති මහ මැතිවරණයෙන් එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත් වුණු අතර, නැවතත් 2004 වර්ෂයේ දීත්, 2010 වර්ෂයේ දීත් පැවැති මහ මැතිවරණවලින් කෑගල්ල දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. එතුමා එම කාල සීමාවේදී වෙළෙඳ වාණිජ නියෝජ්‍ය අමාත්‍ය ධුරයත්, පසුව පාරිභෝගික අමාත්‍ය ධුරයත් දරනු ලැබුවා. මා ජනාධිපතිවරයාව සිටියදී අපගේ රජයේ ග්‍රාමීය කර්මාන්ත හා ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙසත් කටයුතු කළා.

1970 මහ මැතිවරණයේදී මගේ මැතිවරණ ව්‍යාපාරයටත් මෙතුමා සක්‍රියව සහභාගී වුණා, මට මතකයි. සබරගමුවේ තුන්කෝරළයේ වතු කම්කරුවන්ගේ අයිතීන් වෙනුවෙන් මිත්‍රපාල මැතිතුමා නිතර හඬ නැඟුවා. ඒ වාගේම එතුමා දුප්පත් ජනතාව වෙනුවෙන් අධිකරණයේ නොමිලේ පෙනී සිටි බවත් මා සඳහන් කරන්න ඕනෑ. බෞද්ධයෙකු වූ එතුමා භික්ෂු අධ්‍යාපනය වැඩි දියුණු කිරීමටත්, වෙහෙර විහාර සංවර්ධනය කිරීමටත් දැඩි උනන්දුවක් හා සැලකිල්ලක් දැක්වූ බව මා පෞද්ගලිකවම දන්නවා.

දේශපාලනය ව්‍යාපාරයක් කර නොගත් එතුමා 2019 වසරේදී අභාවයට පත් වන තෙක්ම ජනතා සේවයට කැප වුණේ තම ජීවිත අවදානම ද සලකන්නේ නැතිවයි.

ගරු කථානායකතුමනි, මා විසින් මෙතෙක් සඳහන් කළ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාගේ අභාවයන් නිසා සංවේගයට පත් එතුමන්ලාගේ පවුල්වල සියලුදෙනාට මගේ හා රජයේ ශෝකය සහ ජනතාවගේ ශෝකය මෙයින් ප්‍රකාශ කරනවා. ඒ බව එම පවුල්වල සාමාජිකයන්ට දැනුම් දෙන ලෙසත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

[පූ.භා. 10.25]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, අභාවප්‍රාප්ත, ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා පිළිබඳව මුලින්ම මම කථා කරන්න කැමැතියි.

1924 දෙසැම්බර් මස 27වැනි දින මෙලොව එළිය දුටු රාජපක්ෂ දේවගේ රණපාල විජේවර්ධන රාජපක්ෂ තරුණයා පළමුව පුස්සැල්ල ප්‍රතිරාජ දේව මහා විද්‍යාලයෙන් ද, ඉන්පසු කොළඹ නාලන්දා විද්‍යාලයෙන් ද සිය පාසල් අධ්‍යාපනය ලැබීය. පසුව විශ්වවිද්‍යාල ප්‍රවේශය හා නීති විද්‍යාල ප්‍රවේශය ලද එතුමා අධිනීතිඥවරයෙකු ලෙස නීති වෘත්තියට පිවිස කුරුණෑගල ප්‍රදේශයේ වෘත්තීය කටයුතුවල නිරත විය.

1955 වසරේදී වැළඩ ගම් සභාවට තේරී පත් වූ එතුමා එහි සභාපතිවරයා බවට ද පත් වූ අතර, වසර නවයක් පුරා එම ගම් සභාවේ සේවය කරන ලදී. 1960 වසරේදී කොමියුනිස්ට් පක්ෂ අපේක්ෂකයෙකු වශයෙන් සිව්වැනි පාර්ලිමේන්තුවට තරග වැදුණු එතුමා ඡන්ද දෙදහසක් වැනි සුළු ඡන්ද සංඛ්‍යාවකින් පරාජයට පත් විය. එම වසරේ ජූලි මාසයේ පැවති මැතිවරණයේදී ස්වාධීන අපේක්ෂකයෙකු වශයෙන් තරග වැදී නැවත ඡන්ද 511ක් වැනි ඉතා සුළු ඡන්ද සංඛ්‍යාවකින් එතුමා පරාජයට පත් විය.

1965 වසරේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයෙකු වශයෙන් හයවැනි පාර්ලිමේන්තුවට තරග වැදුණු එතුමා එවර ඡන්ද දහසකට මඳක් වැඩි ඡන්ද සංඛ්‍යාවකින් නමුත් ජයග්‍රහණය ලැබීය. එතුමාගේ අභාවයෙන් පසුව 1967 ජනවාරි මස 05වන දින පැවති අතුරු මැතිවරණයේදී එතුමාගේ ආදරණීය බිරිඳ ලැටීෂියා රාජපක්ෂ මැතිනිය සාර්ථක තරගයකින් අනතුරුව එතුමාගේ අනුප්‍රාප්තිකයා වශයෙන් දොඩම්ගස්ලන්ද ආසනය ජයග්‍රහණය කරන ලදී.

ඊළඟට, ගරු ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමා ගැනයි මම කථා කරන්නේ. පුලස්තිපුර ප්‍රගතිශීලී දේශපාලන කඳවුරේ කෘතහස්ත දේශපාලනඥයෙකු වූ ආනන්ද සරත් කුමාර රත්නායක මහතා සිය දේශපාලන කර්තව්‍යය උතුරු මැද පළාත් සභාවේ සභානායකවරයා ලෙස අවසන් කරන ලදී. 1977 තරම් ඈතට දිව යන ආනන්ද සරත් කුමාර රත්නායක මහතාගේ දේශපාලන ජීවිත කථාව අලංකාර වන්නේ එතුමා තමන්කඩුව ප්‍රාදේශීය සභාවට තේරී පත් වීමෙනි. කලක් එහි උප සභාපතිවරයා ලෙස කටයුතු කළ ආනන්ද සරත් කුමාර මහතා සිය දේශපාලන ජීවිතය තුළ වැඩිම කාලයක් නියෝජනය කර ඇත්තේ උතුරු මැද පළාත් සභාවයි.

ප්‍රදේශයේ කා අතරත් "රත්නේ" යන ආදරණීය නාමයෙන් හැඳින්වූ ආනන්ද සරත් කුමාර රත්නායක මහතා, සේවා මුක්ත භටයන්ගේ ගොවි ජනපදයේ ගොවි දරුවෙකු ලෙස ප්‍රදේශයේ දේශපාලන නායකත්වය හා එක්ව දේශපාලන කටයුතුවල නිරත විය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ එක් වූ කල ආනන්ද සරත් කුමාර රත්නායක මහතා 2001.12.19 වන දින පස්වන පාර්ලිමේන්තුවේ පොදුජන එක්සත් පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් පත් විය. එතුමා 2004.02.07 වන දින දක්වා සිය මන්ත්‍රී ධුරයේ කටයුතු කරන ලදී. පොළොන්නරුව දිස්ත්‍රික්කයට අමිල මෙහෙවරක් සිදු කරමින්, ප්‍රදේශයේ දියුණුවට මාහැඟි සේවයක් ඉටු කරමින්, පොදු ජන හදවත් තුළ නොමැකෙන මතක සටහන් සනිටුහන් කළ ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමාගේ වියෝවෙන් ශෝකයට පත් පවුලේ සැම වෙත මේ අවස්ථාවේ අපගේ ශෝකය පළ කරනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට, හිටපු වෙළෙඳ නියෝජ්‍ය අමාත්‍ය එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේ අභාවය පිළිබඳව මගේ ශෝකය ප්‍රකාශ කරනවා. එතුමා පිළිබඳවත් මම කරුණු කීපයක් සඳහන් කරන්න කැමැතියි.

සහෝදර සහෝදරියන් අටදෙනෙකුගෙන් යුත් පවුලක හත්වැනියා ලෙස මෙලොව එළිය දුටු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා රුවන්වැල්ල රාජසිංහ මැදි විද්‍යාලෙන් සහ ගම්පහ බණ්ඩාරනායක මැදි විද්‍යාලෙන් සිය අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගන්නා ලදී. සිය අධ්‍යාපන කටයුතු සාර්ථව අවසන් කරන එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා, විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ උපාධිධරයකු මෙන්ම කථිකාචාර්යවරයකු ලෙසත්, වෘත්තියෙන් නීතිඥවරයකු ලෙසත් කටයුතු කරන ලදී. ලංකා සමසමාජ පක්ෂය නියෝජනය කරමින් 1988 වර්ෂයේදී සබරගමුව පළාත් සභාවට තේරී පත්වන එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා, එම පළාත් සභාවේ පළමු විපක්ෂ නායකවරයා ලෙස පත් වෙමින් සිය දේශපාලන ගමන් මඟ ආරම්භ කරන ලදී.

2000 වර්ෂයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්වන එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා, ජනතා හිතවාදී නායකයකු නිසාම 2015 වර්ෂය දක්වාම සිය පාර්ලිමේන්තු දිවිය තුළ ජනතා සේවය සිදු කරන ලදී. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙසත්, අමාත්‍යවරයෙක් ලෙසත් සිය ජනතා සේවය නොපිරිහෙළා ඉටු කරන ලද එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා, සිය දේශපාලන ගමන් මඟ සිය පුතණුවන් වෙත විවර කර, පසු කලෙක නිහඬ දේශපාලන සේවයක් සිදු කරන ලදී. පාර්ලිමේන්තු මන්ත්‍රී සාරතී දුෂ්මන්ත මැතිතුමාගේ දයාබර පියාණන් වන එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා, දරුවන් තිදෙනෙකුගේ පියෙකි. මේ අවස්ථාවේ සහෝදර මන්ත්‍රී සාරතී දුෂ්මන්ත මැතිතුමා ඇතුළු පවුලේ සැම වෙත මාගේ ශෝකය ප්‍රකාශ කර සිටිමි.

ගරු කථානායකතුමනි, ඊළඟට මම හිටපු මන්ත්‍රී සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව සම්බන්ධයෙන් කථා කරන්න කැමැතියි.

මහරගම මධ්‍ය මහා විද්‍යාලයෙන් සහ ලුම්බිණි මහා විද්‍යාලයෙන් සිය අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගන්නා සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා, මරදාන කාර්මික විද්‍යාලයෙන් සහ විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙන් සිය උසස් අධ්‍යාපන කටයුතු තව තවත් ඔපමට්ටම් කර ගන්නා ලදී. එහිදී එතුමා තක්සේරු විද්‍යාව පිළිබඳ උපාධිය ලබා ගැනීම එතුමාගේ දේශපාලන ජීවිතය සාර්ථක කර ගැනීමට උපකාරී වූ බව මාගේ පිළිගැනීමයි.

ලංකා සමසමාජ පක්ෂයේ තරුණ සමිතිය හරහා දේශපාලනයට පිවිසෙන සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා, 1983 වර්ෂයේදී මහජන එක්සත් පෙරමුණ සමඟ සම්බන්ධව සිය දේශපාලන කටයුතුවල නිරත විය. පසුව එම පක්ෂයේ උප සභාපති තනතුරට පත් වන සෝමවීර චන්ද්‍රසිරි මහතා, 1997 වර්ෂයේදී කඩුවෙල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයකු ලෙස තේරී පත් වෙමින් සිය දේශපාලන ගමන වේගවත් කරන ලදී. 2000 වර්ෂයේදී ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තේරී පත් වීමට ද එතුමා වාසනාවන්ත විය.

වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ කැපී පෙනෙන චරිතයක් වූ එතුමා සිය ජීවිතයේ වැඩි කාල පරිච්ඡේදයක් වෘත්තීය සමිති අරගළවල නිරත විය. මේ හේතුවෙන්ම එතුමා ජනාධිපති කාර්යාල වෘත්තීය සමිති අධ්‍යක්ෂ ජනරාල් ධුරයටද පසු කලෙක පත් විය.

සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා ආයුර්වේද සංස්ථාවේ සභාපතිවරයා ලෙසද කටයුතු කරමින් ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසාද අපරිමිත සේවයක් ඉටු කරන ලදී.

එතුමා දයාබර පුතණුවන් දෙදෙනෙකුගේ පියෙකු වන අතර, එතුමාගේ අභාවය හේතුවෙන් ශෝක වන එතුමාගේ ආදරණීය බිරිඳ වන විජයන්ති පෙරේරා මහත්මිය ඇතුළු පවුලේ සැම වෙත මාගේ ශෝකය මේ අවස්ථාවේ පළ කරමි.

ගරු කථානායකතුමනි, ඊළඟට මම පී.බී. දිසානායක මැතිතුමාගේ අභාවය පිළිබඳව වූ ශෝක ප්‍රකාශය සම්බන්ධයෙන් කියන්න කැමතියි.

ඩී.එම්. රන්මැණිකා මැතිනියගේ හා තේවහාමි දිසානායක මැතිතුමාගේ ආදරණීය පුතණුවන් වශයෙන් 1943 පෙබරවාරි මස 08 වන දින අනුරාධපුර දිස්ත්‍රික්කයේ එප්පාවල කෝරළේ, ඉහළ හල්මිල්ලෑව ප්‍රදේශයේ උපත ලද පී.බී. දිසානායක ළදරුවා පසු කලෙක ඉහළ හල්මිල්ලෑව විද්‍යාල හා අනුරාධපුර ශාන්ත ජෝශප් විද්‍යාලය තුළ සිය පාසල් අධ්‍යාපන කටයුතු සිදු කරන ලදී. හිඟුරක්ගොඩ ගුරු විද්‍යාලයට ඇතුළත් වූ එතුමා ඉන් ගුරු වෘත්තියට පිවිස 1963 වසරේ සිට 1990 වසර අවසන් වනතුරු ගුරු වෘත්තියෙහි නියැළී පළමු පෙළ පුහුණු ගුරුවරයෙකු වශයෙන් විශ්‍රාම ගන්නා ලදී. 1965 ජුලි මස 23වන දින හේරත් මුදියන්සේලාගේ බණ්ඩාර මැණිකේ කුල කුමරිය සමඟ විවාහප්‍රාප්ත වූ එතුමා විසින් අනුරුද්ධිකා දිසානායක නැමැති සිය එකම දියණිය මෙලොවට දායාද කරන ලදී.

1991 වසරේ තලාව ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායක ධුරයට පත් එතුමා ඉන් අනතුරුව පැවැති පළාත් සභා මැතිවරණයෙන් ජයග්‍රහණය කොට උතුරු මැද පළාත් සභා මන්ත්‍රීවරයෙකු බවට 1993 වසරේදී පත් විය. ඉන් අනතුරුව සිය දේශපාලන ගමන් මඟෙහි තවත් කඩඉමක් පසු කරමින් 1994 වසරේදී එතුමා අනුරාධපුර දිස්ත්‍රික් මන්ත්‍රීවරයකු වශයෙන් පාර්ලිමේන්තුවට පත් වී 2001 වසර දක්වා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් සිය සේවය තම ප්‍රදේශයට මෙන්ම ව්‍යවස්ථාදායකය හරහා සමස්ත රටටම සලසන ලදී.

ඉන් අනතුරුව 2003 සිට 2008 දක්වා නැවත උතුරු මැද පළාත් සභා මන්ත්‍රීවරයෙකු වූ එතුමා ඉනික්බිති 2008 වසරේ සිට 2013 දක්වා එම පළාත් සභාවේ සභාපති ධුරයෙහිද ඉන් අනතුරුව 2015 වසරේ සිට 2018 වසර දක්වා එම පළාත් සභාවේම ආණ්ඩුකාර ධුරයද හෙබවීය.

සිය දේශපාලන ගමන් මඟෙහි පෙන්නුම් කරන ලද කුසලතා හේතු කොටගෙන 2018 වසරේදී එතුමා නියෝජනය කළ පළාතෙන් පිටත, මධ්‍යම පළාතේ ආණ්ඩුකාර ධුරයටද පත් කරන ලදී.

දේශපාලනික වශයෙන් සියලු ආකාර සමාජ, සංස්කෘතික හා ආගමික කටයුතු සඳහා ඉදිරිපෙළ සාමාජිකයෙකු වශයෙන් සිය දායකත්වය ලබා දුන් මෙතුමා, ඒ සියලු ක්ෂේත්‍රයන්හි ඉමහත් පිළිගැනීමට ද ලක්විය. මෙම කෘතහස්ත දේශපාලන චරිතයේ මහඟු මෙහෙවරෙහි හා දිවි ගමනේ අවසානය සිහිපත් කරන මෙම අවස්ථාවේ එතුමාගේ වියෝවෙන් ශෝකයට පත් ආදරණීය දියණිය අනුරුද්ධිකා දිසානායක ඇතුළු පවුලේ සියලු ඥාති හිතමිත්‍රාදීන් වෙත මගේත්, අප පවුලේත් ශෝකය මේ අවස්ථාවේදී පළ කරමි.

ස්තුතියි.

[පූ.භා. 10.37]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා, ගරු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා, ගරු පී.බී. දිසානායක මැතිතුමා, ගරු ආනන්ද රත්නායක මැතිතුමා සහ ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාගේ අභාවයන් පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන මේ මොහොතේ, එතුමන්ලා පිළිබඳව කථා කරන්න මේ අවස්ථාව ලැබීම ඉතාම අගය කොට සලකනවා. විශේෂයෙන්ම එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා මගේ අසල්වාසියෙක්, මිත්‍රයෙක් වාගේම මගේ ඥාතිවරයෙක්. එතුමා අපට සිහිපත් වෙන බොහෝ මතකයන් තිබෙනවා. එතුමා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තරුණ උපාධිධාරියෙක්. ලංකා සමසමාජ පක්ෂයෙන් තමයි එතුමා දේශපාලනයට පිවිසියේ. එතුමා ලංකා බැංකුවේ නිලධාරියෙකු ලෙස තමයි සිය රාජකාරී ජීවිතය ආරම්භ කළේ. ඉන් පස්සේ නීතිඥවරයෙක් ලෙස ලංකා සමසමාජ පක්ෂයට, විශේෂයෙන්ම ප්‍රගතිශීලීන්ට සුවිශේෂ අභියෝග තිබුණු යුගයක -77න් පසු කාලසීමාව- එතුමා අපේ දිස්ත්‍රික්කයට සුවිශේෂී ශක්තියක් වුණා. එතුමා පරමාදර්ශී දේශපාලනඥයකු ලෙස කැපවීමෙන් කටයුතු කළා. අපි තරුණ පාසල් ශිෂ්‍යයන් විධියට එතුමාගේ ඒ කැපවීම දැක්කා; ඒ දෙස බලා සිටියා. එතුමා මුලින් ගලිගමුව ආසනයේ ලංකා සමසමාජ පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා විධියට කටයුතු කළා. ඉන් පස්සේ යටියන්තොට ආසනයේ ලංකා සමසමාජ පක්ෂයේ සංවිධායකවරයා හැටියට කටයුතු කළා. 1988 සිට ක්‍රියාකාරී දේශපාලනයේ යෙදිලා පළාත් සභාවට පිවිසි එතුමා, ඉන් පසුව දිගින් දිගටම ජයග්‍රාහී දේශපාලනඥයකු ලෙස පළාත් සභාවට සම්ප්‍රාප්ත වෙලා, 1999 වර්ෂයේදී පාර්ලිමේන්තුවට පැමිණියා. එතුමා විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරයා බවට පත්වෙලා දැරණියගල ආසනය තමයි භාර ගත්තේ.

එතුමාගේ චරිත ලක්ෂණ අතර මම දකින ප්‍රධාන කරුණක් තිබෙනවා, ගරු කථානායකතුමනි. චීන කියමනක් තිබෙනවා නේ, ප්‍රගතිශීලියෙක් නම්, ජනතා නියෝජිතයෙක් නම්, මුළු සභාවක්, මුළු සමාජයක් විරුද්ධ වුණත් ඔහුට තමන්ගේ මතය -තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව හරියි කියලා හිතන මතය- ඒ සභාවේ කියන්න පුළුවන් වෙන්න ඕනෑ කියලා; මුළු සභාවම එරෙහි වුණත් ඔහුට ඒ හැකියාව තිබිය යුතුයි කියලා. මම දැක්කා, එච්.ආර්. මිත්‍රපාල අධිනීතිඥතුමාට ඒ හැකියාව තිබුණු බව. එතුමා ජනප්‍රිය දේශපාලනය, ජනප්‍රිය වාක්‍ය, සමහර යුගවල තිබුණු ජනප්‍රිය දේට වඩා හරි දේ තෝරා ගත්ත දේශපාලනඥයෙක්. හරි දේ කථා කරපු දේශපාලනඥයෙක් හැටියට අපි එතුමාව දැක්කා, ගරු කථානායකතුමනි.එතුමා කෑගල්ල දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ලෙස කටයුතු කළත්, එතුමා දැරණියගල ආසනයේ සංවිධායකවරයා වුණා. දැරණියගල කියන්නේ අපේ දිස්ත්‍රික්කයේ තිබෙන අති දුෂ්කර ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ සියලු සංවර්ධන කටයුතු එතුමා සිද්ධ කළා. අද දැරණියගල ප්‍රදේශයේ අස්සක් මුල්ලක් නෑර හැම තැනටම විදුලිය තිබෙනවා. එතුමාගේ කැපවීම තමයි ඒකෙන් පෙන්නුම් කරන්නේ. ඒ කටයුතු එතුමා දැරණියගලට පමණක් සීමා කළේ නැහැ. ඒ කටයුතුවලට එතුමා දක්වපු සුවිශේෂී කැපවීම අදටත් අප ප්‍රදේශයේ ජනතාව ඉතාම ඉහළින් සිහිපත් කරනවා. ඒ සඳහා එතුමා අමාත්‍යාංශ ගානේ යමින් හැම නිලධාරියෙකුටම කථා කරමින් දැවැන්ත වෙහෙසක් ගන්නවා සහෝදර දේශපාලනඥයෙක් හැටියට මම දැක්කා. ඒ වාගේම එතුමාගේ අවංකභාවය පිළිබඳව අපට භය නැතුව කියන්න පුළුවන්. ප්‍රදේශයේ අසල්වැසියෙක් හැටියට මිත්‍රපාල මැතිතුමා අවංක දේශපාලනඥයෙක් කියලා මට කියන්න පුළුවන්. මේ සියලු කාරණාත් එක්ක අපි එතුමා බොහොම හෘදයාංගම ඇගයීමට ලක් කරනවා.

මිත්‍රපාල මැතිතුමා අපට මහත් සේවයක් කළා. එතුමාගේ ඇවෑමෙන් එතුමා වාගේම උගත් තරුණ දේශපාලනඥයෙක් අපේ දිස්ත්‍රික්කයට, අපේ ප්‍රගතිශීලී ව්‍යාපාරයට එතුමා පරිත්‍යාග කළා. ඒ දුෂ්මන්ත මිත්‍රපාල තරුණ නීතිඥතුමා. එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා නියෝජ්‍ය අමාත්‍යවරයෙක් ලෙසත් එක් වතාවක් කටයුතු කළා. එතුමා අපේ දිස්ත්‍රික්කයට, අපේ ප්‍රදේශයට, රටට සේවය කරන්න දුෂ්මන්ත මිත්‍රපාල තරුණ නීතිඥතුමා අපට දායාද කළා. අපි ඒක එතුමා කළ තවත් එක් සුවිශේෂී සේවාවක් හැටියට සලකනවා. එතුමා නිසි කල විශ්‍රාම අරගෙන මේ තරුණයා අපේ ව්‍යාපාරයට යොමු කළා; ලබා දුන්නා; අපේ දිස්ත්‍රික්කයට දායාද කළා. ඒ පිළිබඳවත් අපේ ප්‍රණාමය එතුමාට පුද කරනවා, ගරු කථානායකතුමනි.

සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා ගැනත් මම වචනයක් කිව යුතුයි. සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා මාත් සමඟ සමකාලීනව වර්ෂ 2000දී පාර්ලිමේන්තුවට ආවා. එතුමා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක්. එතුමා හොඳ කම්කරු නායකයෙක්. එය එතුමා තුළ තිබුණු සුවිශේෂී ලක්ෂණයක්.

එතුමා මහජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින්, කැප වීමෙන් කටයුතු කළ කම්කරු නායකයෙක්. මහජන එක්සත් පෙරමුණටත් එතුමා ලොකු ශක්තියක් වුණ බව ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා දන්නවා. සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමාට සුවිශේෂී වාග් ශෛලියක් තිබුණා. මට මතකයි, අපට පසුපසින් තිබෙන පේළියේ ඉඳලා එතුමා අපට රහසින් කරුණු කියනවා. හැබැයි, ඒ අවස්ථාවලදී ගරු කථානායකතුමා මූලාසනයේ ඉඳලා අපි දිහා බලනවා. එවැනි ඉතා සුවිශේෂී වාග් ශෛලියක් එතුමාට තිබුණා.

ගරු කථානායකතුමනි, පී.බී. දිසානායක මැතිතුමා, ආනන්ද රත්නායක මැතිතුමා, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා ඇතුළු ඒ සියලු මන්ත්‍රීතුමන්ලා පාර්ලිමේන්තුවේ ගරුත්වය ආරක්ෂා කරමින් විශේෂයෙන්ම රටටත්, ඒ ප්‍රදේශවලටත් කළ සේවය අපි අගය කරනවා. අවසාන වශයෙන්, එතුමන්ලාගේ අභාවයන් පිළිබඳව එම පවුල්වල සියලුදෙනාට අපේ බලවත් ශෝකය ප්‍රකාශ කර සිටිනවා. ඒ ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාට නිවන් සුව අත්වේවායි කියා හෘදයාංගමව මම ප්‍රාර්ථනා කරනවා.

[පූ.භා. 10.43]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, කෙටි කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කළා වුව ද අපේ රටේ දේශපාලනයේ දීර්ඝ කාලයක් කටයුතු කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමාගේ වියෝව පිළිබඳ ශෝක යෝජනාවට එක් වෙමින් එතුමාගේ බිරිඳ සහ දරුවන්ට පළමු කොට අපගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

වල්ගම ගුණසේකර කනිෂ්ඨ විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනයත්, මහරගම මධ්‍ය මහා විද්‍යාලයෙන් සහ ලුම්බිණි මහා

විද්‍යාලයෙන් ද්විතීයික අධ්‍යාපනයත්, මරදාන කාර්මික විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනයත් හදාරා එතුමා විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙන් තක්සේරු විද්‍යා උපාධිය ලබා ගත්තා. එතුමා ශිෂ්‍ය ව්‍යාපාරයට දැවැන්ත ශක්තියක් හා නායකත්වයක් ලබා දුන්නා. විශේෂයෙන් වාණිජ ක්ෂේත්‍රයේ උපාධිධරයන් අතර ඒකාබද්ධ ශිෂ්‍ය සංවිධානයක් ගොඩනැඟීමටත් විශ්වවිද්‍යාල කාල පරිච්ඡේදයේ එතුමා කටයුතු කළා. ලංකා සම සමාජ පක්ෂයේ තරුණ සමිති සංවිධානය හරහා ක්‍රියාකාරී දේශපාලනයට පිවිසි එතුමා 1983දී මහජන එක්සත් පෙරමුණට බැඳුණා. එතුමා මහජන එක්සත් පෙරමුණේ උප සභාපතිවරයකු ලෙසත් කටයුතු කළා. වෘත්තීය සමිති නායකයෙකු ලෙස එතුමා අපේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ ප්‍රගතිශීලී බලඇණියටත්, ඒකාබද්ධ වෘත්තීය සමිති බලමණ්ඩලයටත් දැවැන්ත හයියක් ලබා දුන්නා. සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා, අධිෂ්ඨානයෙන් සහ කැපවීමෙන් යුතුව වැඩ පිළිවෙළ රාශියකට නායකත්වය දෙන වගකීමට පිවිසුණා.

අපේ ගරු අගමැතිතුමාත් සඳහන් කළ ආකාරයටම, එතුමා අපේ රටේ තීරණාත්මක මැතිවරණ ගණනාවකදී ශක්තිමත් මැදිහත්වීමක් සහිත සටන්කරුවෙක් ලෙස කටයුතු කළා. 2000 වර්ෂයේදී මහජන එක්සත් පෙරමුණ, පොදු පෙරමුණ සමඟ ඒකාබද්ධ වී කටයුතු කළ එතුමා මැතිවරණයෙන් පොදු පෙරමුණේ මන්ත්‍රීවරයෙක් ලෙස පාර්ලිමේන්තුවට පිවිසුණා. පාර්ලිමේන්තුවේ සිටියේ ඉතා කෙටි කාලයක් වුවද, ඒ කාලය තුළ එතුමා නොසැලී සිටියා. ඒ අවස්ථාවේදී අපේ ආණ්ඩුවෙන් කොටසක් කඩාගෙන ගියා. නමුත්, සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා ස්ථාවරව පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරයෙක් හැටියට සිටියා. එතුමා ලංගම අධීක්ෂණ මන්ත්‍රීවරයා ලෙස කටයුතු කරමින් විශාල ප්‍රතිසංවිධානවලට දායක වුණා. මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ, අපේ රටේ ඈත එපිට ගම්මානවලට ගමන් කරන්න පාරවල් තිබුණත්, බස් සේවාවන් ඇති කිරීමට නොහැකි වුණු ගම්මාන රාශියකට එම සේවය ලබා දීමේ වැදගත් කටයුත්තට එතුමා නායකත්වය දෙමින් හවුල් වුණු බව. ඒ වාගේම එතුමා හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව යටතේ ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සභාපති ධුරය දරමින්, මුහුදු වැල්ල ගොඩට ගෙනැවිත් ශුද්ධ පවිත්‍රකොට ඉදිකිරීම් සඳහා ඒවා පාවිච්චි කිරීම සඳහා වූ ව්‍යාපෘතිය මඟින් විශාල පෙරළියකට මඟපෙන්වූවා. පසුව, එතුමා නාවින්නේ පිහිටි ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාවේ සභාපතිවරයා හැටියට ආයුර්වේද ක්ෂේත්‍රයට, අපේ රටේ දේශීය වෙදකම වැඩි වැඩියෙන් ප්‍රචලිත කිරීමේ ක්‍රියා මාර්ගයට නායකත්වය දුන්නා. මම සිහිපත් කරන්න කැමැතියි, වැඩ වර්ජන රාශියකට එතුමා උර දුන් බව. ඒ සෑම සටනකදීම නොසැලී සිටි නායකයෙක් ලෙස සෑම තැනකදීම අපේ රටේ වැඩ කරන ජනතාවගේ ගෞරවය එතුමාට අඛණ්ඩව ලැබුණා. අවසාන කාලයේ එතුමා මහජන එක්සත් පෙරමුණෙන් ඉවත් වී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එක්වුණා. එතුමා දුන් ආදර්ශය, සටන්කාමිත්වය හා නොසැලෙන දේශපාලන කැපවීම අපි කාටත් ශක්තියක් වුණු බව එතුමාගේ වියෝව පිළිබඳ කථා කරන මේ අවස්ථාවේදී මා සඳහන් කරන්න ඕනෑ.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමාගේ වියෝව පිළිබඳව ශෝක යෝජනාවට ද මේ අවස්ථාවේ අපි එක් වෙනවා, ගරු කථානායකතුමනි. පුලතිසිපුර ප්‍රගතිශීලී දේශපාලන කඳවුරේ පැරණි පුරුකක් මෙන්ම ජන හදවත්වලට සමීප කෘතහස්ත දේශපාලනඥයකු ලෙස පොදුජන පෙරමුණ නියෝජනය කරමින් පොළොන්නරු දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් එතුමා මෙම උත්තරීතර සභාවට පැමිණියා.

මහජන විශ්වාසයෙන් පැමිණි එතුමාට, පාර්ලිමේන්තුවට ඒ මහජන හඬ ගෙන එන්න හැකිවුණා. එතුමා පොළොන්නරුවේ සේවා මුක්ත ජාතික පාසලෙන් අධ්‍යාපනය ලැබ ඉහළට ගමන් කර දේශපාලන ක්ෂේත්‍රයේ ප්‍රගතිශීලී කඳවුර සමඟ එක්ව කටයුතු කළා. එතුමාගේ එම වැඩ පිළිවෙළ අප කාටත් ආදර්ශයක් වුණා. ආනන්ද රත්නායක මැතිතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ දයාබර බිරිඳ හා දූ දරුවන් වෙත මේ අවස්ථාවේදී අපේ ශෝකය පළ කර සිටිනවා.

ගරු කථානායකතුමනි, කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා නීතිඥවරයකු වශයෙනුත් කටයුතු කළා. එතුමා තම තරුණ කාලයේ සිටම -කොළඹ නාලන්දා විද්‍යාලයේ සිට- ප්‍රගතිශීලී ජාතික ව්‍යාපාරයටත් එක් වෙලා කටයුතු කළා. එතුමා හවුල් වුණු එම ක්‍රියාවලිය තුළ විශාල සම්බන්ධකම් ජාලාවකටත් උරුමකම් කියනවා. එතුමා ඒ වෙනුවෙන් කැප වුණු යුගය අපේ රටේ ඉතා වැදගත් කාල පරිච්ඡේදයක්. ගරු අගමැතිතුමා සඳහන් කරපු විධියට අපට මතකයි, පාසල් සටනේ විශේෂයෙන්ම 1966-1967 කාලයේ ඇති වූ ඒ මහා අරගළයට ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා සක්‍රියව සහභාගි වී එයට නායකත්වය ලබා දෙන්න අපේ රටේ තරුණ ව්‍යාපාරයට එක් වූ බව. ඒ වාගේම වැඋඩ ගම් සභාවේ සභාපති ලෙසත් නොකඩවාම කටයුතු කරන්න එතුමාට පුළුවන් වුණා. ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යළිත් ජයග්‍රහණය කරවන්න, එතුමාගේ ආදරණීය බිරිඳ 1967 වසරේ පැවැති අතුරු මැතිවරණයට ඉදිරිපත් වී ජයග්‍රහණය අත්පත් කර ගෙන දොඩම්ගස්ලන්ද ආසනයේ මන්ත්‍රීතුමිය බවට පත්වීම සුවිශේෂ සිද්ධියක්. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ඉතා වැදගත් කාල පරිච්ඡේදයකදී ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා ආරම්භ කළ ඒ වැඩ කොටස ඉදිරියට ගෙන යන්නත් එතුමියට පුළුවන් වුණා.

ගරු කථානායකතුමනි, ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාගේ ජයග්‍රහණය විශේෂ වන්නේ එම මැතිවරණ කොට්ඨාසය පළමුවරට ප්‍රගතිශීලී කඳවුර විසින් දිනා ගැනීමේ වෙනස නිසායි. මේ රටේ අග්‍රාමාත්‍ය ධුරයට පත් වුණු, අපේ රටේ දේශපාලනයේ හිටපු යෝධයකු වන ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා දොඩම්ගස්ලන්ද ආසනයේ මන්ත්‍රීතුමා හැටියට දීර්ඝ කාලයක් එම ආසනය නියෝජනය කළා. ඒ.යූ. රොමානිස් මැතිතුමා ඉන් පසු ඒ ආසනය නියෝජනය කළා. පොදු ජනතාවගේ දියුණුව පිණිස ඒ බල කඳවුරෙන් මෙහාට මේ ජයග්‍රහණය ගේන්න පුළුවන් වුණේ, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා ප්‍රගතිශීලී ව්‍යාපාරය තුළ ඇති කළ ඒ දැවැන්ත පෙරළිය නිසායි.

ගරු කථානායකතුමනි, අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පී.බී. දිසානායක මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් පාර්ලිමේන්තුවට පිවිසුණා. මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී එතුමා ඉතාම විශිෂ්ට ලෙස කටයුතු කළා. ඒ වාගේම, සෑම මැතිවරණ සටනකමදීත් ගරු පී.බී. දිසානායක මැතිතුමා අඛණ්ඩව විශාල පරිත්‍යාගයක් සිදු කළා.

1994 සහ 2001 වර්ෂවල පැවැති මහ මැතිවරණවලදී අනුරාධපුර දිස්ත්‍රික්කයට තරග කර පාර්ලිමේන්තුවට තේරී පත් වී මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කළ එතුමාට අනුරාධපුර දිස්ත්‍රික්කයේ පොදු ජනතාවට වැදගත් වූ කාර්ය භාරයකට හවුල් වෙන්න පුළුවන්කම ලැබුණා. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් පාකිස්තානය, චීනය, රුසියාව, දකුණු කොරියාව, ඉන්දියාව, පිලිපීනය වැනි රටවල් රාශියකට සංචාරය කිරීමේ වගකීම අපි වෙනුවෙන් එතුමා භාර ගත්තා. ඒ ක්‍රියාවලිය පාර්ලිමේන්තුවේ සටහන් කිරීම එතුමාට කරන ගෞරවයක් කියා මා හිතනවා.

ඒ විතරක් නොවෙයි. උතුරු මැද පළාතේ ආණ්ඩුකාර ධුරයද, මධ්‍යම පළාතේ ආණ්ඩුකාර ධුරයද, ඌව පළාතේ වැඩබලන

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ආණ්ඩුකාර ධුරයද දැරීම එතුමා කෙරෙහි තිබුණු විශ්වාසයට සහ නායකත්වයට ලැබුණු ශක්තියක් බවත් මා සටහන් කරනවා. එතුමාගේ වියෝව පිළිබඳ අපගේ ශෝකය එතුමාට ගෞරව පිණිස මේ අවස්ථාවේදී යළිත් මා සටහන් කරනවා.

ඊළඟට, අපි කවුරුත් ඉතා කිට්ටුවෙන් ආශ්‍රය කළ, අපේ වමේ ව්‍යාපාරයට නීතිඥවරයකු මෙන්ම සංවිධායකවරයකු හැටියට කටයුතු කළ ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා ගැනත් මම යමක් කියන්න ඕනෑ. එතුමා ලංකා සමසමාජ පක්ෂය සමඟ දීර්ඝ කාලයක් කටයුතු කළා. විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලත් එතුමා ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ වාණිජ අංශයෙන් විශ්වවිද්‍යාලයකට ඇතුළත් වූ ප්‍රථම ශිෂ්‍යයා වශයෙන්ද ඉතිහාසයේ සටහන් වෙනවා. ඒ වාගේම එතුමා බැංකු ක්ෂේත්‍රයේත් කටයුතු කළා. නීතිඥවරයකු ලෙසත් කටයුතු කළ එතුමා මන්ත්‍රීවරයකු ලෙස පත්වීමටත් කලින් කිහිප අවස්ථාවකදීම අපට හමු වී තිබෙනවා. එතුමාත්, එතුමාගේ සහෝදරයාත් කම්කරු උසාවියේ පෙනී සිටිමින් එම ප්‍රදේශවල වැඩ කරන ජනතාව වෙනුවෙන් විශාල කර්තව්‍යයක් ඉටු කළා. ජන ජීවිතය සැහැල්ලු කරන්න, ජනතාවට ලැබිය යුතු වරප්‍රසාද දිනා ගන්න එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේ නායකත්වය සහ උපදෙස් ඒ ජනතාවට විශාල පිටිවහලක් වුණා.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාව, එතුමාගේ වියෝව පිළිබඳව ශෝකය සටහන් කරන අවස්ථාව. නියෝජ්‍ය ඇමතිවරයකු ලෙසත්, ඒ වාගේම දේශපාලන වශයෙන් ගැඹුරු, පරිණත, ප්‍රගතිශීලී අදහස්වලින් පිරි දේශපාලනඥයකු ලෙසත් අපේ සමාජයට ශක්තියක් දීමට එතුමා ඉටු කළ මෙහෙවර මේ අවස්ථාවේදී මා විශේෂයෙන් සිහි කරනවා. ඉන්දියාව, චීනය, බ්‍රිතාන්‍යය, ප්‍රංශය, සෝවියට් රුසියාව වැනි රටවල විදේශ සංචාර ගණනාවක නිරත වූ එතුමා එම රටවල පැවැති සමාජවාදී කඳවුරේ සම්මේලන හා සමුළු රාශියකට එක් වී අපට ලබා දුන් ශක්තියත් මේ අවස්ථාවේදී මා සිහිපත් කරනවා.

අද දිනත් පාර්ලිමේන්තුවේ අපත් සමඟ සිටිනවා, එතුමාගේ ආදරණීය පුත්‍ර රත්නය වන සාරතී දුෂ්මන්ත මන්ත්‍රීතුමා. අපේ රටේ දේශපාලනයට විශාල ශක්තියක් ලබා දෙන්න, දේශපාලන ව්‍යාපාරයට තම පුත්‍ර රත්නය එක් කිරීමටත් ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාට පුළුවන් වුණා. එතුමාගේ වියෝව පිළිබඳ ශෝකයට එක් වෙමින්, එතුමාගේ බිරිඳ හා දරුවන් හැමදෙනාට අපගේ ශෝකය දන්වා යවන ලෙස මේ අවස්ථාවේදී මා ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි.

[පූ.භා. 10.55]

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithreepala Sirisena)

ගරු කථානායකතුමනි, මේ ගරු සභාව නියෝජනය කළ අපේ හිතමිත්‍ර හිටපු පාර්ලිමේන්තු මැති ඇමතිවරු කිහිපදෙනෙකුගේත්, ඒ වාගේම අපට ඇසුරු කරන්න නොලැබුණු දොඩම්ගස්ලන්දේ ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ හිටපු මන්ත්‍රීතුමාගේත් අභාවයන් පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේ, මම ප්‍රථමයෙන්ම පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කළ ගරු ආනන්ද සරත් කුමාර රත්නායක හිටපු මන්ත්‍රීවරයා ගැන කරුණු කිහිපයක් ප්‍රකාශ කිරීමට බලාපොරොත්තු වෙනවා.

ගරු ආනන්ද රත්නායක හිටපු මන්ත්‍රීවරයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් දේශපාලනයට ඇවිල්ලා මගේ ලේකම්වරයකු හැටියට තමයි මුලින්ම කටයුතු කළේ. එතුමා මගේ සහෝදරයකු, ඥාතියකු වාගේ මා සමඟ වැඩ කළ කෙනෙක්. එතුමා මුලින්ම තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ උපසභාපති ධුරයටත්, පසුව එහි සභාපති ධුරයටත් පත් වුණා. ඉන් පසුව උතුරු මැද පළාත් සභාවට තේරී පත් වූ එතුමා එම පළාත් සභාවේ අමාත්‍ය ධුරයක් ද දැරුවා. ඉන් පසුව එතුමා 2001 වසරේ පැවැති මහ මැතිවරණයේදී පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් මේ ගරු සභාවට පැමිණියා.

ගරු කථානායකතුමනි, අද අප මේ ශෝක ප්‍රකාශ යෝජනා මඟින් සිහිපත් කරන ගරු මැතිතුමන්ලා පස් දෙනාම විශේෂයෙන් සිය දේශපාලන ගමන අවසන් කළේ -අභාවප්‍රාප්ත වුණේ- ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්, සාමාජිකයන් විධියටයි. මා එය විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. ඒ නිසා මේ පස්දෙනාම පිළිබඳ කථා කරන විට, ඒ සෑම කෙනෙකුම දැරූ මැති ඇමතිකම්, කළ සේවාව පිළිබඳ කථා කරනවා වාගේම එතුමන්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයන් ලෙස කටයුතු කළ ආකාරය ගැනත් කියන්න ඕනෑ. විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා විධියට මා එතුමන්ලා සියලුදෙනාගේ අභාවයන් පිළිබඳ දැඩි ලෙස ශෝකයට පත් වන අතර, එතුමන්ලාගේ පවුල්වල සියලුදෙනාට අපගේ ශෝකය සහ සංවේගය පළ කරනවා.

ආනන්ද රත්නායක මැතිතුමා විශේෂයෙන්ම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පොදු මහ ජනතාවට ඉතාම සමීපව කටයුතු කළ කෙනෙක්. මෑත යුගයේ දේශපාලනඥයන්ට බොහෝ වෙලාවට නඟන චෝදනා තමයි, පාර්ලිමේන්තුවට පැමිණියාට පසුව ජනතාවගෙන් ඈත් වීම, ඇමතිකම් ගත්තාට පසුව ජනතාවගෙන් ඈත් වීම, ඡන්ද කොට්ඨාසයට නොයෑම ආදිය. නමුත්, අද අප සිහිපත් කරන මේ චරිත පහම ඒ චෝදනාවලට ලක් නොවූ චරිතයි. ඒ සෑම කෙනෙක්ම ඉතාම ජනතාවාදීව, ජනතාවට සමීපව කටයුතු කළ, මළ ගෙදරට, මඟුල් ගෙදරට, පින්කමට සහභාගි වූ අයයි. දේශපාලනය කළා වාගේම ගමේ ග්‍රාම සංවර්ධන සමිතිය, බෞද්ධ සමිතිය, පාසල් සංවර්ධන සමිතිය ආදි පොදු ස්වේච්ඡා සංවිධානවල, ස්වේච්ඡා සේවයේ නියැළුණු මේ පිරිස, ඉතාම ජන හිතකාමී පිරිසක්.

මා හිතන විධියට, ආනන්ද රත්නායක මැතිතුමා පොළොන්නරුවේ නොගිය ගෙදරක් නැතිව ඇති. එතුමා ඕනෑම කෙනෙකුගේ දුකේදී, සැපේදී සිටියා; එවැනි යමක් ආරංචි වුණාම තමන්ගේ අතින් කීයක් හරි දුන්නා. මාසිකව මන්ත්‍රීවරයෙකුට හම්බ වෙන දීමනාවෙන් තමයි එතුමා ඒ සියලු දේවල් කළේ. එතුමා, සල්ලි හම්බ කිරීමේ අරමුණින් කටයුතු කළ කෙනෙක් නොවෙයි. මේ පස් දෙනාම, ලංකාවේ අද දේශපාලනඥයන්ට එල්ල වන චෝදනා එල්ල නොවුණු අය.

එතුමන්ලා මුදල් හම්බ කළේ නැති, දූෂණයට වංචාවට පෙලඹුණේ නැති, තම ජීවිත කාලය තුළ අවංකව සැබෑ ලෙසම ජනතාව වෙනුවෙන් වැඩ කළ අය. බොහෝ තනතුරු දරමින් ඉහළට ගිය ආනන්ද රත්නායක මැතිතුමා මා සමඟ සහෝදරයෙකු විධියට, ඥාතියෙකු විධියට බොහොම ළඟින් කටයුතු කළ කෙනෙක්. ආනන්ද රත්නායක මැතිතුමාගේ අභාවය පිළිබඳව විශේෂයෙන්ම එතුමාගේ මැතිනිය වන රංජනි මහත්මිය, දරුවන් ඇතුළු පවුලේ සියලු දෙනාට පොළොන්නරුව ජනතාවගේත්, පෞද්ගලිකව මගේත් දැඩි සංවේගය ප්‍රකාශ කරනවා.

කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කළ, අභාවප්‍රාප්ත එච්.ආර්. මිත්‍රපාල හිටපු ඇමතිතුමා ගැනත් මා කියන්න ඕනෑ. එතුමා, වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රී අපේ ගරු සාරතී දුෂ්මන්ත

මැතිතුමාගේ පියා. මට පෙර කරන ලද කථාවලදී ප්‍රකාශ වූ ආකාරයට, එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා ලංකා සමසමාජ පක්ෂයෙන් දේශපාලනයට ඇවිත්, අවසානයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වැලඳ ගත්, බොහෝ තනතුරු දැරූ කෙනෙක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයකු ලෙස තමයි එතුමා අභාවයට පත් වුණේ. එතුමා නීතිඥවරයෙකු වශයෙනුත් කටයුතු කළා. ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාත් අවංක, සැබෑ මහජන සේවකයෙක්; සැබෑ ලෙසම මුදලට වහල් නොවූ, වාම ප්‍රගතිශීලී දේශපාලන දර්ශනය තුළ කටයුතු කළ, මානවවාදී සමාජයක දේශපාලනඥයෙකු විසින් ඉටු කළ යුතු වගකීම් සහ කාර්යයන් ඉතා නිහතමානීව ඉටු කළ ඉතා විශිෂ්ට මහජන සේවකයෙක්. එතුමාගේ අභාවය පිළිබඳත් එතුමාගේ පවුලේ සියලු දෙනාට අපගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා. එවැනි දේශපාලනඥයන් තමයි අපට මේ යුගය තුළ අවශ්‍ය වන්නේ.

කුරුණෑගල දොඩම්ගස්ලන්ද ආසනය නියෝජනය කළ, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා ගැනත් මා කියන්න ඕනෑ. මගේ වයස එක්ක බලන කල එතුමා මගේ දේශපාලන ජීවිතය සමඟ සම්බන්ධ වෙලා සිටියේ නැහැ. එතුමා පිළිබඳව මම විශේෂයෙන් අසා තිබෙනවා. එතුමාත් බොහොම අවංක ලෙස තම සේවාව ඉටු කළ මන්ත්‍රීවරයෙක්; ජනහිතකාමී මන්ත්‍රීවරයෙක්. එතුමා දොඩම්ගස්ලන්ද ආසනයේ වාර්තාවක් පිහිටුවා තිබෙනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් පළමුවරට දොඩම්ගස්ලන්ද ආසනය ජයග්‍රහණය කළ මන්ත්‍රීවරයා විධියට.

ඊළඟට, අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, පී.බී. දිසානායක මැතිතුමා ගැනත් මා කිව යුතුයි. ප්‍රාදේශීය සභාව, පළාත් සභාව, පාර්ලිමේන්තුව හා පසුව ආණ්ඩුකාර ධුරය කියන තනතුරු රාශියක් දැරූ එතුමා ඉතාම නිහතමානී මහජන සේවකයෙක්.

එතුමාත් තමන්ගේ අහිංසක ජීවිතය තුළ අනෙක් සිව්දෙනා වාගේම අවකංව ජනතාවට සේවය කරපු කෙනෙක්; සල්ලි හම්බ කළේ නැති කෙනෙක්; දේශපාලන බලය වැරැදි විධියට පාවිච්චි නොකළ කෙනෙක්. අපේ රජරට ප්‍රදේශයේ, උතුරු මැද පළාතේ මන්ත්‍රීවරයෙකු විධියට එතුමා මා සමඟ ඉතාම ළඟින් ඇසුරු කළා. එතුමාගේ අභාවය ගැනත් අපි දැඩි ලෙස ශෝකයට පත් වෙනවා.

අභාවප්‍රාප්ත ගරු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා ගැනත් මා කියන්න ඕනෑ. එතුමා මේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ නායකයෙකු විධියට සැබෑ ලෙස ජනතාවාදී සටන්වලට කැප වෙච්ච කෙනෙක්. කම්කරු සටන්වල, උද්ඝෝෂණවල, පෙළපාළිවල ඉදිරියෙන් කටයුතු කළ එතුමා ඒවාට සැබෑ ලෙස නායකත්වය දුන් කෙනෙක්. එතුමාත් අවසාන කාලයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ වෙලා කටයුතු කළා. එතුමා ඉතාම අවංක, නිහතමානී ජනතා සේවකයෙක්.

ගරු කථානායකතුමනි, අද අප සිහිපත් කරන මේ මහජන නියෝජිතයන් පස්දෙනාම පිළිබඳව කථා කරන විට එතුමන්ලා ගැන පොදු කරුණක් ලෙස කියන්න පුළුවන්, එතුමන්ලා මේ රටේ දේශපාලනයට ඉතාම සුදුසු අය බව. එතුමන්ලා ජනතාවට සමීපව, අවංකව කටයුතු කළා වාගේම කිසිම වෙලාවක බලය සහ ධනය වැරැදි විධියට පාවිච්චි කළේ නැහැ. එතුමන්ලා පස්දෙනාම ධනය රැස් කරලාත් නැහැ. වර්තමාන සමාජය තුළ දේශපාලනඥයා ලක් වන චෝදනාවලින් නිදහස් වෙච්ච පස්දෙනෙකු වන එතුමන්ලා සෑම කෙනෙකුටම අපි අපගේ ගෞරවය පුද කරනවා.

ආනන්ද රත්නායක මැතිතුමා, පොළොන්නරුවේ; එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා කෑගල්ලේ, දැරණියගල; ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා දොඩම්ගස්ලන්දේ; පී.බී. දිසානායක මැතිතුමා අනුරාධපුරයේ හොරොව්පතානේ. මගේ මතකයේ හැටියට, සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුව නියෝජනය කළ කෙනෙක්. එතුමන්ලා සියලුදෙනාගේ අභාවයන් පිළිබඳව ඒ සියලුදෙනාගේ පවුල්වල අයට, මේ පාර්ලිමේන්තුවට පැමිණ අද අප කරන ගුණ කථන අහගෙන ඉන්න පිරිසට වාගේම, මේ පාර්ලිමේන්තුවට නොපැමිණි, අභාවප්‍රාප්ත ඒ ජනතා නායකයන්ගේ සියලු ඥාතීන්ට සහ එතුමන්ලා නියෝජනය කළ ප්‍රදේශවල ජනතාවට අපේ කනගාටුව, ශෝකය ප්‍රකාශ කරනවා.

ස්තුතියි. තෙරුවන් සරණයි!

[පූ.භා. 11.05]

**ගරු සිරිපාල ගමලත් මහතා (මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சிறிபால கம்லத் - மகாவலி வலயங்களை அண்டியுள்ள கால்வாய்கள் மற்றும் குடியிருப்புகள் பொது உட்கட்டமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Siripala Gamalath - State Minister of Canals and Common Infrastructure Development in Settlements in Mahaweli Zones)

ගරු කථානායකතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කළ, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආනන්ද කුමාර රත්නායක මන්ත්‍රීතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන්නයි මා නැඟී සිටියේ. ආනන්ද කුමාර රත්නායක මැතිතුමාගේ පියා දෙවැනි ලෝක යුද්ධය කාලයේ යුද්ධ හමුදාවට බැඳිලා සේවය කළ කෙනෙක්, ගරු කථානායකතුමනි. අපේ රටට නිදහස ලැබෙනවාත් එක්කම, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනපද ව්‍යාපාරය ආරම්භයේම සේවාගම ජනපදලාභියෙකු විධියට තමයි ඒ පියතුමා එම ප්‍රදේශයට ගියේ.

ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමා උපත ලැබුවේ 1956 ජනවාරි 2වැනි දා. දරුවන් පස් දෙනෙකු සිටින එම පවුලේ හතරවැනි දරුවා තමයි, එතුමා. පොළොන්නරුව, සේවා මුක්ත කඳවුර මහා විද්‍යාලයේ අධ්‍යාපනය ලබලා, එතුමා පළමුවෙන්ම පොලිස් දෙපාර්තමේන්තුව තෝරාගෙන, පොලිස් කොස්තාපල්වරයෙකු විධියට කටයුතු කළා. හැබැයි බොහොම කෙටි කාලයක් තමයි එතුමා පොලිස් කොස්තාපල්වරයෙකු වශයෙන් සිටියේ. අපේ හිටපු ජනාධිපතිතුමා කිව්වා වාගේ, ඊටත් ඉස්සෙල්ලා තමයි එතුමා දේශපාලනයට පිවිසිලා තිබුණේ. එතුමා ඉස්සෙල්ලාම දේශපාලනයට ආවේ මැදපත්තු ගම්සභාව නියෝජනය කරමින්. 70 දශකයේ ලීලාරත්න විජේසිංහ මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස සිටියදී මෙතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ සංවිධානයේ සභාපතිවරයා ලෙස පත් වුණා. ඊළඟට, 1986 දී එතුමා පලුගස්දමන විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපතිවරයා වශයෙන් ඒ ප්‍රදේශයේ සමාජ සේවය පටන් ගත්තා. පෙර කථිකයන් කිව්වා වාගේම, එතුමා නොගිය ගෙදරක් නැතුව ඇති; නොගිය මළ ගෙයක් නැතුව ඇති. එතුමා හැම කරදරයකදීම කාටත් උදව් වුණු කෙනෙක්. පොලීසියට කරදරයක් වුණත් එතුමා ඒ අය වෙනුවෙන් පෙනී හිටියා. හැම කෙනෙක්ම ඒ වාගේ වෙලාවක කථා කළා නම් කථා කළේ ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමාට කියන එකත් මේ අවස්ථාවේදී මා මතක් කරන්න ඕනෑ. එතුමා එච්චරටම සාමාන්‍ය ජනතාවත් එක්ක ජීවත් වුණු කෙනෙක්. මේ කාලයේ එතුමාට ලොකු තර්ජනයක් ආවා. ජීවිත තර්ජනයක් ඇවිල්ලා එතුමා අවුරුද්දකට වැඩි කාලයක් පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් පිට වෙලා සිටියා. 88-89 කාලයේ ඇති වූ මරණ තර්ජනත් එක්ක, සියලු දේශපාලන තනතුරුවලින් ඉවත් වෙන්න කියලා එතුමාට කියපු අවස්ථාවේ එතුමා ප්‍රදේශය අත හැරලා නිර්භීතව සිටියා මිසක්, ඒ

[ගරු සිරිපාල ගමලත් මහතා]

තනතුරුවලින් ඉවත් වුණේ නැහැ. එතුමා ඒ වෙලාවේත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ශක්තිමත් කරන්න කටයුතු කළා. 1991 දී එතුමා තමන්කඩුව ප්‍රාදේශීය සභාවට තේරී පත් වුණා. ඒ වාගේම එතුමා එහි උපසභාපතිවරයා විධියටත් කටයුතු කළා. එම කාලය තුළ එතුමා එම ප්‍රදේශයට විශාල මෙහෙවරක් කළා.

ඊළඟට, 1993දී පළාත් සභාවට පත් වුණු එතුමා, පළාත් සභාවේ වැඩ බලන මහ ඇමතිවරයා, මන්ත්‍රීවරයා, උප සභාපතිවරයා වැනි තනතුරු රාශියක් දැරුවා. එතුමා අමාත්‍යාංශ කිහිපයකම කටයුතු කරලා උතුරු මැද පළාතටම විශාල මෙහෙවරක් සිදු කළ බවත් මේ අවස්ථාවේ මා සඳහන් කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, එතුමාගේ දේශපාලන ජීවිතයේ එතුමා දෙවතාවක්ම බන්ධනාගාරගත වුණා. 1999දී පැවැති පළාත් සභා මැතිවරණය සමයේ දී, දේශපාලන හේතුන් මත එතුමා දින 54ක් බන්ධනාගාරගත වෙලා සිටියා මට මතකයි.

ආනන්ද රත්නායක මැතිතුමාට ඉතාම හොඳ කථිකත්වයක් තිබුණා. ඕනෑම තැනකට ගියාම ඒ සියලුදෙනා තමන් වෙත නම්මවා ගැනීමේ හැකියාවක් එතුමාට තිබුණා. එතුමා ඉතාම නිහතමානී කෙනෙක්. චාම්, සරල ජීවිතයක් තමයි එතුමා ගත කළේ. එතුමා මුදල් හම්බ කරන වැඩසටහනේ කිසිදාක නොයෙදුණු කෙනෙක්. එතුමා ඒ ප්‍රදේශයේ ජනතාවට නැතුවම බැරි කෙනෙක් වුණා. මා හිතන විධියට එතුමා අවුරුදු 61ක් පමණ තමයි ජීවත් වුණේ. එතුමා රෝගාතුර වුණා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තිබුණු දේශපාලන පෙරළියත් එක්ක 2014දී එතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ හිටගත්තා. ඒ කාරණය මේ අවස්ථාවේදී මා විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. යම් ප්‍රතිපත්තියක් තිබෙන කෙනෙකු විධියට එතුමා ඒ කාර්ය භාරය ඉෂ්ට කළා පමණක් නොවෙයි, මිය යනතුරුම එතුමා තම ප්‍රදේශයට විශාල සේවාවක් ඉටු කළා.

ගරු කථානායකතුමනි, ආනන්ද රත්නායක මැතිතුමා මගේ මිත්‍රයෙක්. මගේ ගමේ කෙනෙක්. පොඩි කාලයේ ඉඳලාම අපි එකට පාසල් ගියා. එක ගමේ ජීවත් වුණා. අපේ පවුල් අතරත් අන්‍යෝන්‍ය සම්බන්ධකමක් තිබුණා. ඕනෑම කරදරයකදී එන යන කෙනෙකු විධියට තමයි එදා ඉඳලා කටයුතු කළේ. එතුමා දරුවන් තිදෙනාටම හොඳින් අධ්‍යාපනය ලබා දුන්නා. ආනන්ද රත්නායක මැතිතුමාගේ අභාවය පිළිබඳව, එතුමාගේ භාර්යාව වන ටී.එම්. රංජනී මහත්මිය සහ දරු තිදෙනා ඇතුළු පවුලේ ඥාතීන් සියලුදෙනා වෙත මේ අවස්ථාවේ දී අපගේ බලවත් ශෝකය ප්‍රකාශ කර සිටිනවා. එතුමාට අජරාමර නිවන් සුව අත් වේවායි කියාත් මම ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කළ ගරු එච්.ආර්. මිත්‍රපාල හිටපු නියෝජ්‍ය ඇමතිතුමාගේ අභාවය පිළිබඳවත් මම මේ අවස්ථාවේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා. මම 2004 දී පාර්ලිමේන්තුවට ආවේ ඊට පෙර පාර්ලිමේන්තුව හෝ ප්‍රාදේශීය සභාවක් හෝ නියෝජනය නොකරපු කෙනෙක් විධියටයි. ඒ අවස්ථාවේ මට හමු වුණු ඉතාම හොඳ මිත්‍රයෙක් තමයි ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා. එතුමා මේ සභාවේ දැවැන්තයෙක් විධියට කටයුතු කළා. පාර්ලිමේන්තුවේ ඉඳලා සියලු සමාජ මෙහෙවර කරපු කෙනෙක් විධියට පමණක් නොවෙයි, නීතිඥවරයකු විධියට එතුමාගේ ඇසුර මට විශාල ශක්තියක් වුණා. එතුමා නිහතමානී, සරල ජීවිතයක් තමයි ගත කළේ. ඒ වාගේම අවංකව කටයුතු කළා. ඒ වෙලාවේ එතුමාගේ ඒ ගතිගුණ මම දැක්කා.

එතුමා නියෝජනය කළේ, කෑගල්ල දිස්ත්‍රික්කය. එදා අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ වැඩසටහන ක්‍රියාත්මක කරමින්, එතුමා නියෝජනය කරපු දැරණියගල ප්‍රදේශයේ කඳු පල්ලම්වල හැතැප්ම ගණන් දුර ගම්වල විදුලිය නැතිව සිටි සියලුදෙනාට විදුලිය ලබා දී අවසන් කරන්න, පාලම් ටික හදලා, ගමේ පාරවල්වල කාපට් අතුරා, ඒ සියලු ප්‍රදේශවලට තමන්ගේ වගකීම ඉෂ්ට කරන්න අවශ්‍යයි කියලා එතුමා මා එක්ක කියා තිබෙනවා. එතුමා ඒ වගේ දැවැන්ත මෙහෙවරක් කරපු කෙනෙක්. ඒ විතරක් නොවෙයි. හැම ඉරිදාවකම ගෙදරට ගිහිල්ලා තමන්ගේ වගාවන් පිළිබඳව, වැවිලි ක්ෂේත්‍රය පිළිබඳව සොයා බලන්න, ඒ සියලු කාර්ය භාරයන් ඉතා හොඳින් පරීක්ෂා කර බලන්න ඉතාම කැමැතියි කියලා එතුමා මට පවසා තිබෙනවා.

එතුමාගේ අභාවය පිළිබඳව එම මැතිනිය සහ නීතිඥ සාරතී දුෂ්මන්ත මිත්‍රපාල පුතණුවන් ඇතුළු දරුවන්ටත්, සියලු ඥාතීන් වෙතත් මේ අවස්ථාවේ මගේ බලවත් ශෝකය ප්‍රකාශ කරමින්, එතුමාට අජරාමර නිවන් සුව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරනවා, ගරු කථානායකතුමනි. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.14]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු කථානායකතුමනි, අද දවසේ විශේෂයෙන්ම ගරු මන්ත්‍රීතුමන්ලා පස්දෙනෙකුගේ අභාවයන් පිළිබඳව අපගේ ශෝකය ප්‍රකාශ කරනවා. මුලින්ම මම කැමැතියි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දොඩම්ගස්ලන්ද ආසනය නියෝජනය කළ ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය සඳහා පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු රංජිත් සියඹලාපිටිය මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிட்டிய] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. RANJITH SIYAMBALAPITIYA] *took the Chair.*

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා එතුමාගේ ගමේ පාසල වන පුස්සැල්ල විද්‍යාලයෙනුත්, ඉන් පසුව කොළඹ නාලන්ද විද්‍යාලයෙනුත් අධ්‍යාපනය ලබාගෙන, පසුව එතුමාගේ දක්ෂතාත් එක්ක විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වුණා. ඒ වාගේම එතුමා නීතිඥවරයෙකු හැටියට සේවය ආරම්භ කරලා, තරුණ කාලයේම අධිනීතිඥවරයෙකු වශයෙන් කටයුතු කළා. පසුව එතුමා තමන්ගේ ප්‍රදේශයට දේශපාලන නායකත්වය ලබා දෙන්න 1955 දී වැඋඩ ගම් කාර්ය සභාවට තේරී පත් වෙනවා. ඒ වාගේම එතුමා වැඋඩ විල්ලි හත්පත්තුව ගම් කාර්ය සභාවේ සභාපතිවරයා හැටියට පත්වෙලා තම දේශපාලන වැඩ කටයුතු ගමෙන් ආරම්භ කළා. ඉන් පසුව එතුමා 1960 මහ මැතිවරණයට කොමියුනිස්ට් පක්ෂයෙන් තරග කළා. 1960 වර්ෂයේ ජුලි මාසයේ තිබුණු මහ මැතිවරණයටත් එතුමා ඉදිරිපත් වුණා. නමුත්, ඒකෙදි ඉතාම සුළු ඡන්ද සංඛ්‍යාවක් මදි වීම නිසා

එතුමාට මන්ත්‍රීවරයකු වශයෙන් පත් වෙන්න බැරි වුණා. ඒ වාගේම 1965 දී එතුමාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයා වශයෙන් නාම යෝජනා ලැබිලා, දොඩම්ගස්ලන්ද ආසනයේ පළමුවැනි ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රීවරයා හැටියට පත් වෙනවා.

දොඩම්ගස්ලන්ද ආසනය නියෝජනය කළ ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා මගේ පියාගේ සම කාලීන දේශපාලනඥයෙක්. මොකද, එතුමා වැඩඩ විල්ලි ගම් කාර්ය සභාව නියෝජනය කරනකොට, මගේ පියා රම්බඩගල්ල ගම් කාර්ය සභාව නියෝජනය කළා. මේ දෙදෙනා එකම කාලයේදී තමයි දේශපාලන ගමන ආරම්භ කළේ.

ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාට දීර්ඝ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මැතිවරණ පෙත්සමකින් එතුමාගේ මන්ත්‍රී ධුරය එතුමාට අහිමි වනවා. ඊට පස්සේ එතුමාගේ මැතිනිය වන ලැටීෂියා රාජපක්ෂ මහත්මියට 1967 පැවති අතුරු මැතිවරණයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණා. එතුමාගේ මන්ත්‍රී ධුරය අහිමි වුණත් තමන්ගේ ආදරණීය භාර්යාවට ඒ අවස්ථාව ලබා දෙන්න, එතුමා මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් ක්‍රියා කළ නිසා හැකියාව ලැබුණා. 1965 - 1970 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පැවති කාලයේදී -ඩඩ්ලි සේනානායක මැතිතුමා අගමැතිවරයා හැටියට හිටපු කාලයේදී- තමයි විපක්ෂයේ කටයුතු කරමින් ඒ ජයග්‍රහණය ලබන්නේ. 1967 දී පැවති ඒ අතුරු මැතිවරණයට ලැටීෂියා රාජපක්ෂ මහත්මියත් සමඟ මගේ පියාත් ඉදිරිපත් වුණා. ඡන්ද 300 ගණනකින් මගේ පියා පරාජයට පත් කරමින් තමයි ලැටීෂියා රාජපක්ෂ මැතිනියට පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව ලැබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා බොහොම නිහතමානී, තමන්ගේ ප්‍රදේශයට සමාජයීය වශයෙන් වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න ඉතා උනන්දුවක් තිබුණු බොහොම වැදගත් මන්ත්‍රීවරයෙක් හැටියට තමයි අපි එතුමා ගැන අහලා තිබෙන්නේ. එතුමා මෑතක් වනතුරු කුරුණෑගල උසාවියේ අධිනීතිඥවරයෙකු හැටියට කටයුතු කරමින් ඒ ප්‍රදේශයේ ජනතාවට තම සහයෝගය ලබා දෙමින් ඉතා සාධාරණ විධියට නීතිඥ වෘත්තියේ නියැළෙමින් විශාල කාර්යභාරයක් සිදු කළා කියන කාරණය අපි පැහැදිලිව දන්නවා. පසුකාලීනව අපට එතුමා ආශ්‍රය කරන්න අවස්ථාව ලැබුණා. විශේෂයෙන්ම පහසුකම් අඩු ප්‍රදේශයක තරුණයෙකු හැටියට, දේශපාලනයට ඒමට අවස්ථාව අඩු අවස්ථාවක එතුමාගේ හැකියාවෙන් හා දක්ෂකමින් මේ පාර්ලිමේන්තුව දක්වා එන්න එතුමාට අවස්ථාව උදා වුණා. ඒ වාගේම එතුමාගේ පුතා අද වනකොට අපේ ප්‍රදේශයේම වෛද්‍යවරයෙකු හැටියට සේවය කරනවා. තාත්තා විසින් සිදු කළ සමාජ සේවාව තවදුරටත් එතුමාට ඒ ප්‍රදේශයට කරන්න අවස්ථාව ලැබිලා තිබෙනවා. වෛද්‍යවරයෙකු හැටියට එතුමා දුෂ්කර ප්‍රදේශවලට ගොස් වැඩ කටයුතු කරමින් විශාල සේවාවක් ඉෂ්ට කරන බවත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාගේ ජීවන ගමනේදී එතුමා දේශපාලනඥයෙක් වශයෙන් තරුණ කාලයේදී ගම් සභාව නියෝජනය කළා. අනතුරුව, පාර්ලිමේන්තු මැතිවරණ කීපයකට තරග වැදිලා පාර්ලිමේන්තුව නියෝජනය කළා. එතුමා ඒ කරපු සේවාව අපි මේ අවස්ථාවේදී අගය කරනවා. එතුමා බොහොම වැදගත් විධියට ජීවත් වෙමින් සමාජයට ආදර්ශයක් ලබා දුන් පුද්ගලයෙකු බව මම මේ වෙලාවේ සිහිපත් කරන්න ඕනෑ. එතුමාගේ අභාවය සම්බන්ධයෙන් අපගේ බලවත් ශෝකය එතුමාගේ පවුලේ සියලු දෙනාටම ප්‍රකාශ කරමින්, එතුමාට නිවන් සුව ලැබේවායි මම ප්‍රාර්ථනා කරනවා.

මේ වෙලාවේ මම එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා ගැනත් වචන කීපයක් කථා කරන්න ඕනෑ. මිත්‍රපාල මැතිතුමා ලංකා සමසමාජ පක්ෂයෙන් තමයි දේශපාලනය ආරම්භ කළේ. තුන් කෝරලයෙන් දේශපාලනයට ආපු එතුමා යටියන්තොට ආසනයෙන් තමයි පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වුණේ. අපටත් එතුමා සමඟ සම්බන්ධකම් තිබෙනවා. එතුමාගේ පුතා වන සාරතී දුෂ්මන්ත මැතිතුමා බොහොම නිහතමානී තරුණයෙකු හැටියට තමන්ගේ පියා ගිය මාර්ගයේ යමින් එතුමා ගෙන ගිය දේශපාලනය ඉදිරියට ගෙන යන්න වත්මන් දේශපාලන ක්ෂේත්‍රය තුළ කටයුතු කරමින් සිටිනවා. ඒ පිළිබඳව අපේ සතුට මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. මිත්‍රපාල මැතිතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ පවුලේ සියලු දෙනාටත්, අපේ සාරතී දුෂ්මන්ත හිටපු නියෝජ්‍ය ඇමතිතුමාටත් අපේ ශෝකය ප්‍රකාශ කරනවා.

පී.බී. දිසානායක මැතිතුමා ගැනත් මම වචන කිහිපයක් කථා කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමා අනුරාධපුර දිස්ත්‍රික්කය තමයි නියෝජනය කළේ. එතුමා විවාහ වෙලා ඉන්නේ අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල මැතිවරණ කොට්ඨාසයෙන්. තලාව ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායක ධුරයට පත් එතුමා ඉන් අනතුරුව පළාත් සභාවේ කටයුත කරලා, 1994 වසරේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට පත් වුණා. අපි තරුණයන් හැටියට 1994 වසරේදී පාර්ලිමේන්තුවේ විපක්ෂය නියෝජනය කරන කොට එතුමා ආණ්ඩු පක්ෂය නියෝජනය කළා මට මතකයි. එතුමා බොහොම නිහතමානීව දේශපාලනය කරපු මන්ත්‍රීවරයෙක්. ඊට පසුව එතුමාට උතුරු මැද පළාත් සභාවේ සභාපතිවරයා හැටියත්, එම පළාතේ ආණ්ඩුකාරවරයා හැටියටත් කටයුතු කරන්න අවස්ථාව උදා වුණා. මම හිතන්නේ එතුමාගේ දියණිය මේ වනකොටත් දේශපාලනයේ නිරත වෙලා ඉන්නවා. පියාගේ ආදර්ශය අනුව යමින් එතුමියට ඉදිරි දේශපාලන ගමන සාර්ථක කර ගන්න ශක්තිය ලැබේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා. අපි එතුමියට සුබ පතනවා. පී.බී. දිසානායක මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් අපගේ ශෝකය එතුමාගේ පවුලේ සියලු දෙනාටම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ආනන්ද රත්නායක මැතිතුමා, සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා ඇතුළු අද දවසේ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර ඇති අනික් සියලු මන්ත්‍රීතුමන්ලාගේ අභාවයන් වෙනුවෙන් අපගේ ශෝකය ප්‍රකාශ කරමින්, එතුමන්ලාට නිවන් සුව අත්වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

[පූ.භා. 11.22]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (සමුපකාර සේවා, අළෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு லசந்த அலகியவன்ன - கூட்டுறவுச் சேவைகள், சந்தைப்படுத்தல் அபிவிருத்தி மற்றும் நுகர்வோர் பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)

(The Hon. Lasantha Alagiyawanna - State Minister of Co-operative Services, Marketing Development and Consumer Protection)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ ගරු මන්ත්‍රීතුමන්ලා පස්දෙනෙකුගේ අභාවයන් පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාවට සහභාගී වෙලා, එතුමන්ලා කළ සේවය පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු ආනන්ද රත්නායක මැතිතුමා, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා, සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා, පී.බී.

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

දිසානායක මැතිතුමා සහ එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා යන අයගේ අභාවයන් වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේදී මෙම සභාවට සහභාගී වී සිටින එතුමන්ලාගේ ඥාතීන්ටත්, මේ අවස්ථාවට සහභාගී නොවුණු සියලු ඥාතීන්ටත්, අපගේ ශෝකය, කනගාටුව මුලින්ම මේ අවස්ථාවේදී පළ කරනවා. ඒ වාගේම, මෙම මන්ත්‍රීතුමන්ලා පස්දෙනා පිළිබඳවම ශෝක ප්‍රකාශ යෝජනාවේදී ඉදිරිපත් කරපු ඒ කරුණුත්, මට පෙර ගුණ කථනයන් කළ අපේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඇතුළු සියලු දෙනාගේත් අදහස් හා යෝජනා අනුමත කරමින් මම මගේ කථාව ආරම්භ කරන්නම්.

මම දේශපාලනයට පිවිස, 1999දී පළාත් සභා මන්ත්‍රීවරයෙක් ලෙස පත් වුණා. ඊට පසුව 2004දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙසත් තේරී පත් වුණා. අභාවප්‍රාප්ත වූ මේ ගරු මන්ත්‍රීතුමන්ලා පස්දෙනා අතරින් මම දන්නා තරමින් සෝමවීර චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා විශේෂයෙන්ම පළාත් සභාවත් නියෝජනය කළා. එතුමා 2000 වර්ෂයේදී තමයි පාර්ලිමේන්තුව නියෝජනය කළේ. ඒ වාගේම පී.බී. දිසානායක මන්ත්‍රීතුමා 1994දී පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඊට පසුව එතුමා මෑත කාලසීමාව තුළ ආණ්ඩුකාරවරයෙක් විධියටත් අපත් සමඟ ක්‍රියාකාරීව කටයුතු කළා. එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා සමඟත් අපට මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණා. ඒ අනුව මේ මන්ත්‍රීතුමන්ලා පස්දෙනාගෙන් තුන්දෙනෙක් සමඟම ඇසුරු කරන්න මට අවස්ථාව උදා වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරුන් විධියට මෙතුමන්ලා පස්දෙනාම කටයුතු කළා. ඒ හරහා එතුමන්ලා සමඟ එකතුව වැඩ කරන්නත් අපට අවස්ථාව ලැබුණා. එතුමන්ලා සමඟ වැඩ කිරීම තුළින්, එතුමන්ලාගේ චරිත තුළින් සහ ක්‍රියාකාරකම් තුළින් අපිත් යම්කිසි ආකාරයක උගත යුතු පාඩම් ඉගෙන ගත්තා.

විශේෂයෙන්ම සෝමවීර චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා මේ රටේ වඩාත් ප්‍රසිද්ධ වන්නේ, රටේ ජනතාව දන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුටත් වඩා, අපේ අලවි මවුලානා වෘත්තීය සමිති නායකයා සමඟ ළඟින් හිඳිමින් කටයුතු කරපු වෘත්තීය සමිති නායකයෙක් විධියටයි. එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියටත්, සංස්ථා සභාපතිවරයෙක් විධියටත් කටයුතු කළාට, එතුමා ගැන රටේ ජනතාව දන්නේ විශේෂයෙන්ම වෘත්තීය සමිතිවලට නායකත්වය ලබා දුන් කෙනෙක් විධියටයි. එතුමා සෑම අවස්ථාවකදීම අන් අය වෙනුවෙන් තමන්ගේ කාලය, ධනය, ශ්‍රමය කැප කරමින් කටයුතු කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනාම ප්‍රතික්ෂේප කරන යුගයකට අද මේ රට පත් වෙලා තිබෙනවා. ඒක තමයි දේශපාලනමය වශයෙන් අද අවසානයේදී ඇතිවෙලා තිබෙන දේ. මේ රටේ ජනතාව අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනාම ප්‍රතික්ෂේප කරන්න බලපෑ හේතු දිහා බැලුවොත්, මේ මන්ත්‍රීතුමන්ලා පස්දෙනාට නම් ඒ හේතු එකක්වත් අදාළ වන්නේ නැහැ කියලායි මම හිතන්නේ. ඒ අය මේ රටේ සර්වජන ඡන්දයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා, ජනතා අපේක්ෂා පමණක් ඉටු කරමින්, රටේ අපේක්ෂා පමණක් ඉටු කරමින්, වෙහෙස මහන්සි වෙලා කටයුතු කරපු අය. එම නිසා වර්තමානයේ මෙවැනි දේශපාලනඥයන් අපේ රටට නැවතත් අවශ්‍යයි කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මතක් කරනවා.

මේ අයට සැබෑ ගෞරවයක් අපට දක්වන්න පුළුවන්කමක් ලැබෙන්නේ මේ ආකාරයේ ගුණ කථන කිරීම තුළින් පමණක් නොවෙයි. ඒ අයට යම් දර්ශනයක්, යම් බලාපොරොත්තුවක්, යම් අරමුණක් තිබුණා ද, ඒ අරමුණු ක්‍රියාවට නැංවීමට දායකවීම තුළින් තමයි අපට විශේෂයෙන්ම ඒ අයට සැබෑ ගෞරවයක් දක්වන්න පුළුවන්කමක් ලැබෙන්නේ.

ඒ වාගේම අපේ මිත්‍රපාල මන්ත්‍රීතුමා, අමාත්‍යතුමා සුවිශේෂී වූ චරිතයක්. එතුමා අපේ පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීම්වලදී, ඒ වාගේම රූපවාහිනී විවාදවලට සහභාගි වුණු අවස්ථාවලදී කටයුතු කළ ආකාරය අපි දැකලා තිබෙනවා. ඒ සෑම තැනකදීම එතුමා දරපු මතය සමහර විට රටේ ජනප්‍රිය මතය නොවෙන්න පුළුවන්. පෞද්ගලිකව ගත්තොත්, ඒ වෙලාවේ ජනප්‍රිය මතයට කථා කළේ නැත්නම් දේශපාලනයේදී අවාසි වෙනවා. ඒ අවාසි පිළිබඳව මිත්‍රපාල මැතිතුමා මොනම ආකාරයකටවත් සැලකුවේ නැහැ. පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීමේදී වෙන්න පුළුවන්, මේ පාර්ලිමේන්තුවේදී වෙන්න පුළුවන්, මාධ්‍ය සාකච්ඡාවකදී වෙන්න පුළුවන් එතුමාගේ ප්‍රතිපත්තිය, දර්ශනය වෙනුවෙන් බොහොම පැහැදිලිව නොබියව, තමන්ට පාඩුවක් වෙනවාද කියන එක පිළිබඳව හිතන්නේ නැතුව කථා කළා. එතුමාගේ කථා කථාවට විතරක් සීමා කළේ නැහැ. එතුමා ක්‍රියාවෙන්, ආදර්ශය තුළින් ජනතාවගේ සිත්සතන් දිනා ගත්තා. විශේෂයෙන්ම එතුමා කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ සිත්සතන් දිනා ගනිමින් කටයුතු කරපු අවංක දේශපාලනඥයෙකු බව මේ අවස්ථාවේ අපි විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා සෑම අවස්ථාවකම වතුකරයේ ජනතාව වෙනුවෙන්, සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් දැවැන්ත සේවයක් ඉටු කළා. අවසාන කාලයේ එතුමා පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට තොණ්ඩමන් අමාත්‍යතුමා සමඟ ඉතාම සුහදව, මිත්‍රශීලිව කටයුතු කරමින් ඒ අමාත්‍යාංශය තුළින් දැවැන්ත සේවයක් ඉටු කළා. ඒ වාගේම මා නියෝජනය කරන පාරිභෝගික කටයුතු අමාත්‍යාංශයෙත් එතුමා කටයුතු කළ බව මට මතකයි. එතුමා ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ අමාත්‍යවරයා සමඟත් දැවැන්ත කාර්යභාරයක් ඉටු කරනු ලැබුවා. එම නිසා අපි අපිත් එක්ක එකට කටයුතු කරපු කෙනෙකු වන ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා මේ අවස්ථාවේ විශේෂයෙන්ම සිහිපත් කළ යුතුව තිබෙනවා. එතුමාත් සමඟ අනික් මන්ත්‍රීවරු හතර දෙනාත් සිහිපත් කරනවා. එතුමන්ලා සියලුදෙනා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරුන්; පක්ෂයට දර දිය ඇදලා වෙහෙස මහන්සි වුණු අය. ඒ සියලුදෙනාගේ පවුල්වලට අපේ ශෝකය හා කනගාටුව මේ අවස්ථාවේදී පළ කරනවා.

අද එක් පැත්තකින් මම සතුටු වෙනවා. මොකද, මම මුලින් සඳහන් කළ ආකාරයට ඒ අයගේ ඒ ප්‍රතිපත්ති, දර්ශනය අනුව අපි ක්‍රියාකිරීම තුළින් ඒ අයට සැබෑ ගෞරවයක් දක්වන්න පුළුවන්කමක් ලැබෙන නිසා. අද මිත්‍රපාල මැතිතුමාගේ පුත්‍ර රත්නය වන අපේ සාරතී දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමා නිහඬව, ආදර්ශවත්ව, පිරිසිදු චරිතයක් විධියට පියාගේ දේශපාලනය, පියාගේ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යනවා. පියා නිසා මම දේශපාලනය කරනවා, පියාගේ ඡන්ද ටික අරගෙන මම පාර්ලිමේන්තු යනවා කියන තැන ඉඳගෙන නොවෙයි එතුමා කටයුතු කරන්නේ. හදවත හොඳ අවංක දේශපාලනඥයකු විධියට, තරුණ මන්ත්‍රීවරයකු විධියට, හොඳ මිතුරකු විධියට සාරතී දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමා අද පියාගේ ප්‍රතිපත්ති අවංකව ක්‍රියාවට නංවමින් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. විශේෂයෙන්ම එතුමා පුතකු විධියට පියාණන්ට දක්වන්න පුළුවන් උපරිම ගෞරවය දක්වනවා. අවංක උගත් බුද්ධිමත් දේශපාලනඥයකු වන දුෂ්මන්ත මිත්‍රපාල අපේ හිතවත් සහෝදර මන්ත්‍රීතුමාගේ දේශපාලන ජීවිතය ඉදිරියේදී සාර්ථක වේවා කියා හදවතින්ම අපි ප්‍රාර්ථනා කරනවා.

අවසාන වශයෙන්, මේ ගරු මන්ත්‍රීතුමන්ලා පස්දෙනාගේම පවුල්වලට, ඒ ඥාති හිතමිත්‍රාදීන්ට, විශේෂයෙන්ම එතුමන්ලා වෙනුවෙන් කැපවුණු දේශපාලන සගයන්ට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත්, පෞද්ගලිකව මගෙත් ශෝකය, කනගාටුව මේ අවස්ථාවේදී පළ කරමින් ඒ සියලුදෙනාට අමා මහ නිවන් සුව අත්වේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

[පූ.භා. 11.32]

**ගරු එච්. නන්දසේන මහතා**
(மாண்புமிகு எச். நந்தசேன)
(The Hon. H. Nandasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජරට දේශපාලනයේ සුවිශේෂී සලකුණු දෙකක් තබපු, මගේ හිතවත් කල්‍යාණ මිත්‍රයන් දෙදෙනෙකු පිළිබඳව පමණක් මම කරුණු ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා. ඒ එක්කෙනෙක්, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ. අනෙක් කෙනා, අනුරාධපුර දිස්ත්‍රික්කයේ. 1991 පළාත් පාලන මැතිවරණයේදී මම පදවිය ප්‍රාදේශීය සභාවේ අපේක්ෂකයෙකු හැටියට ඉදිරිපත් වන කොට, තලාව ප්‍රාදේශීය සභාවේ අපේක්ෂකයෙකු හැටියට ඉදිරිපත් වූ පී.බී. දිසානායක මැතිතුමාත්, තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ අපේක්ෂකයෙකු හැටියට ඉදිරිපත් වුණු රත්නායක මැතිතුමාත් එදා සිට අවසන් ගමන් යන තුරු මගේ කල්‍යාණ මිත්‍රයන් හැටියට තමයි කටයුතු කළේ.

පොළොන්නරුවේ ඉපදිලා සේවා මුක්ත විද්‍යාලයෙන් ද්විතීයික අධ්‍යාපනය අවසන් කරපු රත්නායක මැතිතුමා වෘත්තීය හැටියට පළමුව තෝරා ගත්තේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හසලක ඩිපෝවේ, ඩිපෝ අධිකාරි තනතුර. එම තනතුරේ කෙටි කාලයක් වැඩ කරමින් ඉන්න අතරතුර, එතුමාගේ කුසලතාව හා හැකියාව අනුව උපපොලිස් පරීක්ෂක තනතුරක් ලැබුණා. නමුත්, එදා රටේ පැවතුණ වාතාවරණය තුළ එතුමාට උපපොලිස් පරීක්ෂකවරයෙකු හැටියට කටයුතු කිරීමට හැකියාවක් තිබුණේ නැහැ. නිරන්තරයෙන් ජනතාවගේ පැත්තේ හිටපු, ජනතාව වෙනුවෙන් කථා කරපු, ජනතාව ගැන හිතපු කෙනෙකු වූ එතුමාට 1988, 89 භීෂණ සමයේ රැකියාවත් අත හැරලා ප්‍රදේශයෙනුත් යන්න සිද්ධ වුණා. නමුත්, කෙටි කාලයකට පස්සේ නැවතත් එතුමා ජනතා මෙහෙවරේ යෙදෙන අවස්ථාවේ පලුගස්දමන විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපතිවරයා හැටියට ඒ ප්‍රදේශයේ ජනතාව තෝරා පත් කර ගත්තා. ඒ ස්ථානයේ සිට ඉතා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරපු රත්නායක මැතිතුමා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පළමුවරට තරග කරපු 1991 පළාත් පාලන මැතිවරණයට තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ අපේක්ෂකයෙකු හැටියට ඉදිරිපත් වුණා. ඒ මැතිවරණයේදී වැඩි ඡන්ද ලබාගෙන එතුමා ඒ පළාත් සභාවේ උපසභාපතිවරයා හැටියට පත් වුණා වාගේම, පසුකාලීනව සභාපතිවරයා බවටත් පත් වුණා. ඉන් පසුව 1993 පළාත් සභා මැතිවරණයට -ඒකත් අපේ පක්ෂය පළාත් සභා මැතිවරණයකට ඉදිරිපත් වුණු පළමු අවස්ථාව- පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ඉදිරිපත් වූ එතුමා එදා අපට පළාත් සභාව ජයග්‍රහණය කරන්න බැරි වුණත්, විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට තේරී පත් වුණා. ඉන් පසුව 1999 පළාත් සභා මැතිවරණයේදී ඉතා ඉහළ ඡන්ද සංඛ්‍යාවක් ලබාගෙන ජයග්‍රහණය කළ එතුමාට ඒ පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට පත් වෙන්නත් අවස්ථාව ලැබුණා. ඒ කාලය තුළ කරන ලද කාර්යභාරය නිසා 2001 මහා මැතිවරණයේදී පොළොන්නරුවේ ජනතාව එතුමා ඉතා ඉහළට ඔසවා තබලා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු හැටියට පත් කරන්න කටයුතු කළා. හැබැයි, 2005 පැවැති පළාත් සභා මැතිවරණයට තරග කරලා නැවතත් එතුමා පළාත් සභාවට පත් වුණා. පළාත් සභාව තුළ විවිධ අමාත්‍යාංශවල තනතුරු දරමින් සුවිශේෂී කාර්යභාරයක් කළ එතුමා අවසාන කාලයේදී සභානායකවරයා හැටියට ඒ සභාවේ කටයුතු මෙහෙයවමින් හිටියා. ජනතාවගේ හදවතේ ආදරයක් ඇති වන සේ ඉතා සමීපව කටයුතු කරපු එතුමා, බොහොම මිත්‍රශීලි නායකයෙක් වුණා. ඒ අතරතුර අපි කවුරුත් නොසිතපු ආකාරයට එතුමාගේ වියෝව සිද්ධ වුණා. 2016.12.19වන දා එතුමා අප අතරින් සදහටම වෙන්ව ගියා. එතුමාගේ වියෝව පිළිබඳව අපි ඒ දවසේත් ශෝකය ප්‍රකාශ කළා වාගේම, අද දවසේත් ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම මා නියෝජනය කරන මැදවච්චිය ආසනයේ සියලු ජනතාව ඇතුළු, අනුරාධපුර දිස්ත්‍රික්කයේ මා හිතවත් ජනතාවගේ ශෝකය එතුමාගේ පවුලේ සියලු ඥාතිවරුන්ට මේ අවස්ථාවේ මා පුද කර සිටිනවා.

දිවංගත ගරු පී.බී. දිසානායක මැතිතුමා ඇත්තෙන්ම අපි දැක්කේ ගුරුවරයෙකු හැටියට. අපි හැම වෙලාවේම එතුමාට කථා කළේ, "පී.බී. අයියේ" කියලා. "දිසානායක මහත්තයා" කියලා කිව්වෙත් නැහැ. "පී.බී. අයියා" කියලා තමයි අපි හැම කෙනෙක්ම එතුමා ආමන්ත්‍රණය කළේ. සැබැවින්ම එතුමා ගුරුවරයෙක්. 1964දී පුහුණු ගුරුවරයකු හැටියට පත්වීම් ලබලා ඉතා හොඳ සේවාවක් කරමින් ඉන්න කාලයේ තමයි 80 ජූලි වැඩ වර්ජනයට එතුමා සම්බන්ධ වුණේ. ජූලි වැඩ වර්ජනයට සම්බන්ධ වීම නිසා එතුමාගේ සේවය අත්හිටුවනවා.

ඒ අත්හිටවූ සේවය එතුමාට අහිමි වෙනවා. ඒ අහිමිවීමත් එක්ක තමයි අපේ දිසානායක මැතිතුමා ක්‍රියාකාරී දේශපාලනයට සම්බන්ධ වන්නේ. එතුමා ක්‍රියාකාරී දේශපාලනයට අවතීර්ණ වෙලා, 1991 ප්‍රාදේශීය සභා මැතිවරණයේදී තලාව ප්‍රාදේශීය සභාවට අපේක්ෂකයෙක් හැටියට ඉදිරිපත් වෙලා ජයග්‍රහණය කරලා, එම ප්‍රාදේශීය සභාවේ විපක්ෂ කණ්ඩායම් නායක හැටියට පත් වෙනවා. ඊට පස්සේ, එතුමා 1993 පළාත් සභා මැතිවරණයට තරග කරලා පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට තේරී පත් වෙනවා. 1993දී අපට පළාත් සභාව දිනාගන්න නොහැකි වුණත්, විපක්ෂයේ හිටපු මන්ත්‍රීවරුන් අතර එතුමා ඉදිරියෙන්ම සිටියා. ඊට පසුව පැමිණියේ 1994 මහ මැතිවරණය. 1994 මහ මැතිවරණය ඉතාම තරගකාරී, බිහිසුණු තත්ත්වයක තිබුණු වෙලාවේ අපේ අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් ඉතා ඉහළ මනාප සංඛ්‍යාවක් ලබාගෙන දිසානායක මැතිතුමාට පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව ලැබුණා. 2003 වර්ෂයේදී එතුමා නැවත වතාවක් උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට තේරී පත් වෙලා, ඉන් පසුව එහි සභාපතිවරයා හැටියට පත් වෙලා එම පළාතට ඉතා සුවිශේෂී කාර්ය භාරයක් ඉෂ්ට කළා. 2015 සිට එතුමා උතුරුමැද පළාතේ ආණ්ඩුකාරවරයා ලෙස කටයුතු කළා. ඉන් පසුව ආණ්ඩුකාරවරයෙක් ලෙස වෙනත් පළාත්වලත් කටයුතු කරමින් එතුමා අපේ පළාතට විශාල කීර්තියක් ගෙන දුන්නා. 2019.03.30වන දා එතුමා මේ සියල්ල අතහැර අපෙන් වෙන් වෙලා යන්න ගියා.

උතුරුමැද පළාත තුළ අපේ රජරට දේශපාලන ක්ෂේත්‍රයේ මානව හිතවාදීන් හැටියට, සෑම කෙනෙකුගේම ජයග්‍රහණය අපේක්ෂා කළ අය හැටියට, සෑම කෙනෙකුටම උදව් කළ අය හැටියට, මනුෂ්‍යයන් හැටියට, කල්‍යාණ මිත්‍රයින් හැටියට කටයුතු කළ එතුමන්ලාගේ වියෝව අපේ සමස්ත අනුරාධපුර ජනතාවටම වුණු පාඩුවක් කියා මම හිතනවා. මම නැවත වතාවක් එම පවුල් දෙකේම සියලු ඥාතින්ට, දූ දරුවන්ට, හිතවතුන් සියලුදෙනාටම අනුරාධපුර දිස්ත්‍රික් ජනතාවගේ, විශේෂයෙන්ම උතුරු මැද පළාත් ජනතාවගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා. අවසාන වශයෙන්, එතුමන්ලාට නිවන් සුව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

[පූ.භා. 11.39]

**ගරු අමරකීර්ති අතුකෝරළ මහතා**
(மாண்புமிகு அமரகீர்த்தி அதுகோரல)
(The Hon. Amarakeerthi Athukorala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටට, ජාතියට සේවය කළ මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කළ වැදගත් මහජන නියෝජිතයන් පස්දෙනෙකුගේ අභාවයන් පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන මේ මොහොතේ, එතුමන්ලා පිළිබඳව කථා කරන්න මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

පළමුවෙන්ම, පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කළ ප්‍රගතිශීලී ජන කඳවුරට නායකත්වය ලබාදුන් ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමා පිළිබඳව කථා කරන්න මම කැමතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා අප සමඟ දීර්ඝ කාලයක් දේශපාලන කටයුතු කළ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාවට නායකත්වය දුන් කෘතහස්ත දේශපාලන නායකයෙක්. එතුමා, අපි ගරු කරන දේශපාලනඥයෙක්. ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමා සේවා මුක්ත ජනපද කඳවුරේ ඉපදී, සේවා මුක්ත කඳවුර මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ගත්තා. ඉන් පසුව එතුමා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අනුයුක්තව තම වෘත්තිය තෝරා ගත්තා. 1970 දශකයේ දිවංගත ලීලාරත්න විජේසිංහ මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට කටයුතු කරන අවස්ථාවේදී තමයි ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමා පළමුවෙන් දේශපාලන ජීවිතයට පිවිසුණේ. අපිට මතකයි, එතුමා 1970 දශකයේ සේවාගම කොට්ඨාසයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ බලමණ්ඩලයේ සභාපතිවරයා විධියට පත්වෙලා තමන්ගේ දේශපාලන ගමන ආරම්භ කළ ආකාරය. එතුමා එතැනින් නතර වුණේ නැහැ. 1991 දී පැවති පළමු ප්‍රාදේශීය සභා මැතිවරණයේදී පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ජයග්‍රහණය ලැබූ එකම ප්‍රාදේශීය සභාව වන තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා විධියට පත් වෙන්න එතුමාට අවස්ථාව උදා වුණා. ඒ ඔස්සේ මහජන නියෝජිතයෙක් විධියට එතුමා තමන්ගේ ගමන ආරම්භ කළා. අපට මතකයි, එතුමා එදා සිට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මහ පොළොව සමඟ පොර බදින, මුළු රටටම බත සපයන ගොවි ජනතාවගේ දුක් ගැනවිලිවලට විසඳුම් ලබා දෙමින්, පොළොන්නරු දිස්ත්‍රික්කයේ වසම් 295 තුළම ගම්මානවලට ගිහිල්ලා තමන්ගේ දේශපාලන පරිණතභාවය ඔප්පු කර පෙන්නපු හැටි. එතුමා ශාඛා සංවිධාන හැදුවා; කාන්තා සංවිධාන හැදුවා; තරුණ සංවිධාන හැදුවා. ගොවි සංවිධාන හදලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට දැවැන්ත ශක්තියක් ලබා දුන් කෘතහස්ත දේශපාලන නායකයෙක්, එතුමා. එතුමා කළ ඒ අපරිමිත සේවය කවදාවත් අපේ හදවත් තුළින් ඈත් වන්නේ නැහැ.

එතුමා අපිත් සමඟ දීර්ඝ කාලයක් උතුරු මැද පළාත් සභාව නියෝජනය කළා. 2008 වර්ෂයේදී මම පළාත් සභාව නියෝජනය කරනකොට එතුමා පළාත් සභාවේ කෘෂිකර්ම, වාරිමාර්ග අමාත්‍යවරයා විධියටත්, 2012 වර්ෂයේදී මම උතුරු මැද පළාත් සභාව නියෝජනය කරනකොට එතුමා එහි පළාත් සෞඛ්‍ය අමාත්‍යවරයා විධියටත් අනුරාධපුර දිස්ත්‍රික්කයේත්, පොළොන්නරුව දිස්ත්‍රික්කයේත් ජනතාව වෙනුවෙන් සුවිශාල මෙහෙවරක් ඉටු කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ දිස්ත්‍රික්කයේ වාරිමාර්ග පද්ධතිය, වැව්, අමුණු ටික හදන්න දැවැන්ත මුදල් ප්‍රතිපාදන ලබා දීපු නායකයෙක් විධියට ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමා අපට සිහිපත් කරන්න පුළුවන්. එතුමා රජුන් තනන්නෙක් විධියට පොළොන්නරුවේ ඉතා ජනප්‍රිය චරිතයක්. එතුමා මහ පොළොවේ පය ගහලා දේශපාලනය කරපු නායකයෙක්. දුකේදීත්, සැපේදීත් හැම විටම ජනතාවගේ පැත්තේ ඉඳගෙන කථා කිරීමට ගොස් එතුමා සිරබත් කාපු අවස්ථා අනන්තයි, අප්‍රමාණයි. ඒ නිසා එතුමාගේ වියෝවීම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සමස්ත ජනතාවටම සිදු වෙච්ච විශාල පාඩුවක්.

ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමා 2015 ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් අපිත් සමඟ ඇප කැපවෙලා, ගම් දනව් කරා ගිහිල්ලා, සුවිශාල මෙහෙවරක් කළා. එතුමාගේ දයාබර මැතිනිය වන රංජනී තෙන්නකෝන් මැතිනියත්, පුතණුවන් සහ දියණියන් දෙදෙනාත් අද එතුමාගේ අඩි පාරේ යමින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාවට විශාල සේවයක් ඉටු කරනවා. ඒ අයත් එවැනි යහපත් පවුලක්. ඒක අපි සියලුදෙනාටම ලොකු ගෞරවයක්; එතුමාට ලොකු ගෞරවයක්. එතුමාගේ අභාවය පිළිබඳව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සමස්ත ජනතාවගේ ශෝකය -සංවේගය- රංජනී තෙන්නකෝන් මැතිතුමිය ඒ ප්‍රමුඛ පවුලේ සියලුදෙනාට මේ අවස්ථාවේ මා ප්‍රකාශ කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පී.බී. දිසානායක මැතිතුමා ගැනත් මම වචන කිහිපයක් කථා කරන්න ඕනෑ. එතුමා උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු විධියටත්, එහි සභාපතිවරයා විධියටත්, ඒ වාගේම එම පළාතේ ආණ්ඩුකාරවරයා විධියටත් කටයුතු කරමින් එම ප්‍රදේශවලට දැවැන්ත සේවාවක් ඉටු කළා. අපි පළාත් සභාව තුළ ඉන්නකොට තමන්ගේ කාර්ය භාරය ඉතා ඉහළින් ඉටු කරපු, අනුරාධපුර දිස්ත්‍රික්කය පුරා ජනතා මෙහෙවර දියත් කරපු, නායකත්වයක් දීපු කෙනෙකු තමයි දිවංගත පී.බී. දිසානායක මැතිතුමා. එතුමාගේ දියණිය නාගරික මන්ත්‍රීවරියක්. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාව ඉතා ආදරය කරන කෙනෙකු විධියට එතුමිය අපේ දේශපාලන ගමන් මගේ යමින් සිටිනවා. පී.බී. දිසානායක මැතිතුමගේ අභාවය වෙනුවෙන් ඒ පවුලේ සියලු දෙනාට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාවගේ ශෝකය මේ අවස්ථාවේ මා ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කළ අපේ එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට පොළොන්නරුව දිස්ත්‍රික්කයට දැවැන්ත සේවාවක් ඉටු කළා. ඒ වාගේම වෙළෙඳ හා පාරිභෝගික නියෝජ්‍ය අමාත්‍යවරයා විධියටත් එතුමා පොළොන්නරුව දිස්ත්‍රික්කයට සතොස ශාඛා ලබා දෙමින් විශාල සේවාවක් ඉටු කළා. එතුමාගේ පුත්‍ර රත්නය වන සාරතී දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමා තරුණ දේශපාලනඥයෙකු විධියට, අපේ සහෝදර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට කරන සේවාවත් මේ අවස්ථාවේදී මා සිහිපත් කරනවා. ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේ අභාවය පිළිබඳව අපේ ශෝකය, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාවගේ ශෝකය සාරතී දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමා ප්‍රමුඛ පවුලේ සියලු දෙනාටම ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

[පූ.භා. 11.46]

**ගරු දයාසිරි ජයසේකර මහතා (බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - பத்திக், கைத்தறி துணிகள் மற்றும் உள்நாட்டு ஆடை உற்பத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - State Minister of Batik, Handloom and Local Apparel Products)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ විශාල වැඩ කොටසක් කරපු, රටට සේවයක් කරපු අපේ හිතවත් අමාත්‍යවරුන්, මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුගේ අභාවයන් පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා අද දවසේ මෙම ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. මුලින්ම, අපේ පක්ෂයට විශාල සේවයක් කරපු, අපේ

රටේ හිටපු අවංක දේශපාලනඥයෙකු විධියට අපි ගෞරව කරන, ආදරය කරන අභාවප්‍රාප්ත ගරු එච්.ආර්. මිත්‍රපාල හිටපු නියෝජ්‍ය අමාත්‍යතුමා ගැන කථා කරන්න මම කැමැතියි. එතුමා රුවන්වැල්ල රාජසිංහ මැදි විදුහලෙන් තමන්ගේ අධ්‍යාපනය ආරම්භ කරලා, ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයෙන් ඒ කටයුතු අවසන් කළා.

එතැනින් පසු විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලබා ගත් එතුමා එම විශ්වවිද්‍යාලයේම කථිකාචාර්යවරයකු ලෙසත් සේවය කළා. ඉන් පසු නීතිඥයකු හැටියට දිවුරුම් දුන් එතුමා නීතිඥ වෘත්තියේ යෙදී සිටි ඉතාම දක්ෂ නීතිඥවරයකු වශයෙන් හඳුන්වන්න පුළුවන්. විශේෂයෙන්ම කම්කරු උසාවිවලත්, ඒ වාගේම අනිකුත් උසාවිවලත් ඉතාම හොඳින් තමන්ගේ දක්ෂතාව දැක්වූ එතුමා වැදගත්, උගත්, බුද්ධිමත් නීතිඥවරයෙක්. 1988 දී එතුමා ලංකා සමසමාජ පක්ෂයේ මධ්‍යම කාරක සභිකයකු විධියට කටයුතු කරන අවධියේදී, කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වෙලා, සබරගමුව පළාත් සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත් වී එම පළාත් සභාවේම පළමු විපක්ෂ නායකවරයා බවට පත් වුණා. ඒ වාගේම 1993 දී පැවැති පළාත් සභා මැතිවරණය ජයග්‍රහණය කරමින් පළාත් සභාවට තේරී පත් වූ එතුමා පළාත් සභාවේ හිටපු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු බවටත් පත් වුණා. පසුව, 2000 වර්ෂයේදී පාර්ලිමේන්තුවට තේරී පත් වූ එතුමා 2015 වර්ෂය දක්වාම මන්ත්‍රීවරයකු ලෙසත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයකු ලෙසත් කටයුතු කළා. ඒ විතරක් නොවෙයි. වෙළෙඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙසත් එතුමා කටයුතු කළා.

විශේෂයෙන්ම මා කියන්න කැමැතියි, එතුමාගේ ජීවිත කාලය තුළදී අවස්ථා ගණනාවකදී පාර්ලිමේන්තුවේදී මටත් එතුමා ආශ්‍රය කරන්න අවස්ථාව ලැබුණු බව. එතුමා ඉතාම වැදගත් මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම එතුමා පාර්ලිමේන්තුවේ සිටින නන්දොඩවන සමහර මන්ත්‍රීවරු වාගේ යම් යම් කරුණු කාරණා පිළිබඳව කිසිදු සොයා බැලීමකින් තොරව කථා කරන මන්ත්‍රීවරයකුත් නොවෙයි. යම් කාරණයක් ගැන කථා කරනකොට එතුමා ඒ පිළිබඳව ඉතාම හොඳ අවබෝධයක් ඇතිව, නිවැරදිව තමන්ගේ මතය ඉදිරිපත් කරමින්, කොන්ද කෙළින් තබාගෙන කටයුතු කළ ඉතාම දක්ෂ මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය අමාත්‍යවරයෙක්. විපක්ෂයේ සිටි කාල වකවානුවේ අවස්ථා කිහිපයකදී නොයෙක් කරුණු සම්බන්ධයෙන් එතුමා මා සමඟ පැටලී තිබෙනවා.

එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේ ආදරණීය පුත්‍ර රත්නය වන සාරතී දුෂ්මන්ත මැතිතුමා නියෝජ්‍ය අමාත්‍යවරයකු වශයෙන් කටයුතු කළ අතර, පක්ෂයේ උපලේකම්වරයකු විධියටත්, පක්ෂයේ කටයුතුවලදී විශේෂයෙන්ම වතු අංශය නියෝජනය කරමින් ඒ ක්‍රියාවලියට ශක්තිය දෙන නීතිඥවරයකු විධියටත් කටයුතු කරනවා.

ඒ කාලයේදී එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා සහ මා අතර යම් යම් ප්‍රශ්න ඇති වුණා. ඉස්සර මා නොයෙක් ප්‍රශ්න අහනකොට එතුමා ආණ්ඩු පාර්ශ්වයේ සිටිමින් පුදුම විධියට මා සමඟ රණ්ඩු කරපු කාලයකුත් තිබුණා. නමුත් එතුමා ගෞරව කරන්න පුළුවන්, මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක්. එතුමාත් එක්ක තිබුණු අපේ එකමුතුව, සම්බන්ධීකරණය, එහෙම නැත්නම් අපේ සම්බන්ධතාව එතුමා මිය යනතුරුම තිබුණා. එතුමාගේ ජීවිතය අවසන් වනතුරුම එතුමා දැරණියගල ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා විධියට කටයුතු කළ කරමින්, පක්ෂයට විශාල වැඩ කොටසක්, විශාල සේවයක් කළා. කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ නියෝජ්‍ය කථානායක රංජිත් සියඹලාපිටිය මැතිතුමාත් සමඟ ඉතාම ළඟින් එතුමා කටයුතු කළා. මේ රටේ දේශපාලනය කළ පුද්ගලයන් අතර හොරකම් නොකළ, වැරදි වැඩ නොකළ, තර්ජන ගර්ජන කරලා මිනිසුන් විනාශ නොකළ කෙනෙකු හැටියට අපට එතුමා කෙරෙහි විශාල ගෞරවයක් තිබෙනවා.

එතුමාගේ ආදරණීය පුත්‍ර රත්නයත් අද අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විශාල කැප කිරීමක් කරන ඉතාම වැදගත් නායකයෙක්. පියාගේ අඩි පාරේ යමින් එතුමාත් ඒ ක්‍රියාවලිය නිවැරැදිව ඉෂ්ට කරන අවංක දේශපාලනඥයකු බවත් මම ආදරයෙන් මතක් කරන්න කැමැතියි. අවසාන වශයෙන්, ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාට නිවන් සුව අත් වේවායි කියා ප්‍රාර්ථනා කරමින්, ඒ පවුලේ සියලුදෙනාට මගේ කනගාටුවත්, විශේෂයෙන්ම අපේ පක්ෂයේ කනගාටුවත් මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරනවා.

ඊළඟට, ගරු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා ගැනත් වචන කිහිපයක් ප්‍රකාශ කරන්න මා කැමැතියි. සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා අපේ වෘත්තීය සමිති ක්ෂේත්‍රයට ඉතාම වැදගත් කාර්ය භාරයක් ඉටු කළ නායකයෙක්. විශේෂයෙන්ම කම්කරු නායකයකු විධියට සමසමාජ පක්ෂ තරුණ සංගමය හරහා දේශපාලනයට පැමිණි එතුමා දීර්ඝ කාලයක් මහජන එක්සත් පෙරමුණ හා එක්ව රටේ උන්නතිය වෙනුවෙන් කටයුතු කළා. ඒ වාගේම ලංකා කම්කරු සමිති මධ්‍ය මණ්ඩලයේ ලේකම්වරයා ලෙස ජනතා අරගළ ගණනාවකට එතුමා නායකත්වය දුන්නා.

විශේෂයෙන්ම ලංකා වානේ සංස්ථාව රැක ගැනීම සඳහා වූ සටනේදී අපේ සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා ලබා දුන් නායකත්වය, ඒ වාගේම ලංගම සුරැකීමේ සටනට එතුමා දුන් නායකත්වය මේ අවස්ථාවේදී මම ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ හැම සටනකදීම භය නැතිව වමේ දේශපාලන ව්‍යාපාරයත් එක්ක ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, ප්‍රගතිශීලී දේශපාලනය වෙනුවෙන් එතුමා කළ කාර්ය භාරය මම අදත් ගෞරවයෙන් සිහිපත් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

1997 දී එතුමා මහජන එක්සත් පෙරමුණෙන් කඩුවෙල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයකු ලෙස තේරී පත් වෙලා, ඉන් පසු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂයේ ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පැමිණිලා මන්ත්‍රීවරයකු ලෙසත් කටයුතු කළා. ඒ විතරක් නොවෙයි, එතුමාගේ කාර්ය භාරය තුළ එතුමා වෘත්තීය සමිතිවලට විශාල ශක්තියක් ලබා දුන්නා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපතිවරයා විධියට සිටි කාලයේදී 'ජනාධිපති වෘත්තීය සමිති කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්' ලෙස ගරු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා දීර්ඝ කාලයක් කටයුතු කළා. එතුමා ඒ කාලය තුළ විශාල සේවයක් ඉටු කළා. ඒ වාගේම, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සභාපතිවරයා ලෙසත් අපේ සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා කටයුතු කළා. වර්ෂ 2000 දී එතුමා මන්ත්‍රීවරයකු විධියට පාර්ලිමේන්තුවට පැමිණියා. එතුමා වෘත්තීය සමිති ක්ෂේත්‍රයට කළ සේවය අපි කවදාවත් අමතක කළ යුතු නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙනුත් ගරු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමාගේ පවුලේ සියලුදෙනා වෙත අපගේ ගෞරවය පිරිනමමින්, එතුමාගේ අභාවය වෙනුවෙන් අපගේ කනගාටුවත් ප්‍රකාශ කරමින්, එතුමාට නිවන් සුව අත් වේවායි කියා මම ප්‍රාර්ථනය කරනවා.

දිවංගත ගරු පී.බී. දිසානායක මැතිතුමා ගැනත් මේ අවස්ථාවේදී වචන කිහිපයක් කථා කරන්න මම කැමැතියි. එතුමා ඉහළ හල්මිල්ලෑව විද්‍යාලයෙන් සහ අනුරාධපුර ශාන්ත ජෝශප් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා, 1960 දී කලාවැව හිටපු මන්ත්‍රීවරයකු වන රංබණ්ඩා රත්නමලල මන්ත්‍රීවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා විධියට වැඩ කටයුතු කළා. 1982 දී

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කලාවැව ප්‍රධාන සංවිධායකවරයා වශයෙනුත් එතුමා කටයුතු කළා. ඉන් පසු 1986 දී එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රාජාංගනය, නොච්චියාගම ප්‍රධාන සංවිධායක ධුරය භාරගෙන කටයුතු කළා. 1991 දී තලාව ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායකවරයා වශයෙන් කටයුතු කළ එතුමා 1993 දී උතුරු මැද පළාත් සභාවට පොදුජන එක්සත් පෙරමුණේ මන්ත්‍රීවරයකු ලෙස තේරී පත් වුණා. ඒ වාගේම 1994 දී බටහිර අනුරාධපුර ප්‍රධාන සංවිධායකවරයා විධියට පත් වෙලා, වැඩිම මනාප ලබාගත් මන්ත්‍රීවරු අතර දෙවන ස්ථානය අරගෙන තමයි එතුමා පාර්ලිමේන්තුවට පිවිසෙන්නේ. එතැනින් පස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විපක්ෂයේ සිටි කාලයේදී අවුරුදු ගණනාවක් අපේ පක්ෂය වෙනුවෙන් එතුමා විශාල කැප වීමක් වාගේම විශාල සේවයක් ඉටු කළා. ඒ වාගේම එතුමා මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයා වශයෙනුත්, ඌව පළාතේ වැඩ බලන ආණ්ඩුකාරවරයා වශයෙනුත්, වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා වශයෙනුත් කාලයක් කටයුතු කළා. එතුමා ඉතාම වැදගත් දේශපාලනඥයෙක්. ආණ්ඩුකාරවරයකු හැටියටත් ඉතාම හොඳින් තමන්ගේ කාර්ය භාරය ඉෂ්ට කළ පුද්ගලයකු හැටියටත් අපි එතුමා ආදරයෙන් මතක් කරනවා. එතුමාගේ ඒ ක්‍රියාදාමය තුළ රටට කළ සේවය ගෞරවයෙන් සිහිපත් කරමින්, එතුමාට නිවන් සුව අත් වේවායි කියා මම ප්‍රාර්ථනය කරනවා. එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ සියලුදෙනාට අපේ පක්ෂය වෙනුවෙන් මේ අවස්ථාවේදී අපේ කනගාටුවත් ප්‍රකාශ කරනවා. ඒ වාගේම එතුමාට දක්වන්න පුළුවන් උපරිම ගෞරවය අපි පිරිනමනවා.

ඊළඟට, ගරු ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමා ගැනත් වචන කිහිපයක් සඳහන් කරන්න මා බලාපොරොත්තු වනවා. උතුරු මැද පළාත් සභාවේ සභානායකවරයා හැටියට කටයුතු කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන ගරු ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමා 1977 වර්ෂයේ සිටම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ක්‍රියාකාරී දේශපාලනයේ සිටි කෙනෙක්. 1991 වර්ෂයේදී තමන්කඩුව ප්‍රාදේශීය සභාවට තේරී පත් වෙලා එහි උපසභාපතිවරයා හැටියටත් එතුමා කටයුතු කළා. ඉන් පසු 1993 දී උතුරු මැද පළාත් සභාවට තේරී පත් වෙලා එහි ඇමති ධුර ගණනාවක් එතුමා හෙබවූවා. ඒ වාගේම 2001 වසරේ සිට වසර දෙකක පමණ කාලයක් පොදුජන එක්සත් පෙරමුණු රජයේ මන්ත්‍රීවරයකු හැටියටත් එතුමා කටයුතු කළා. ඒ වාගේම පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරමින් උතුරු මැද පළාත් සභාවේ සභානායකවරයා හැටියටත් එතුමා කටයුතු කළා.

මට මතකයි, අපි තරුණ සංවිධානයේ වැඩ කරන කාලයේදී එහි සංවිධාන කටයුතු කරනකොට එතුමා අපිත් එක්ක එකට වැඩ කළ ආකාරය. ඒ සෑම කටයුත්තකදීම පක්ෂයත් සමඟ ඉතාම ළඟින් වැඩ කළ කෙනෙකු විධියට මේ අවස්ථාවේදී ගෞරවයෙන් එතුමා සිහිපත් කරනවා. අවංක දේශපාලනඥයකු විධියට වාගේම හොරකමට, වංචාවට සම්බන්ධ නොවුණු දේශපාලනඥයකු හැටියටත්, තමන්ගේ ප්‍රදේශයට ආදරය කළ නායකයකු හැටියටත් අපට එතුමා හඳුන්වන්න පුළුවන්. මේ අවස්ථාවේදී එතුමාගේ පවුලේ අය වෙත අපගේ ශෝකය ප්‍රකාශ කරමින්, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනය කරනවා.

ස්තුතියි.

ඊළඟට, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා ගැන මම කථා කරන්න කැමැතියි. 1965 වර්ෂයේ පැවැති මහ මැතිවරණයේදී ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා දොඩම්ගස්ලන්ද ආසනයේ මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත් වුණා. නමුත්, අවුරුද්දක් පමණයි එම ධුරයේ කටයුතු කරන්න එතුමාට අවස්ථාව ලැබුණේ. ඒ කාලයේ එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයා වෙච්ච ඒ.යූ. රොමානිස් මැතිතුමා පරාජය කරලා තමයි, එතුමා පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ. 1960 වර්ෂයේ පැවැති මහ මැතිවරණයේදී තමයි එතුමා දොඩම්ගස්ලන්ද ආසනය සඳහා පළමුව තරග වැදුණේ. 1960 මාර්තු මාසයේ පැවැති මහ මැතිවරණයට සහ එම වර්ෂයේ ජූලි මස පැවැති අතුරු මැතිවරණයට එතුමා තරග කළා. ඒ මැතිවරණවලදී ඒ.යූ. රොමානිස් මැතිතුමා එතුමා පරාජය කරලා ජයග්‍රහණය ලැබුවත්, 1965 දී පැවැති මහ මැතිවරණයේදී රොමානිස් මැතිතුමා පරාජය කරලා එතුමා ජයග්‍රහණය කළා.

වැඩවිල්ලි හත්පත්තු ගම්සභාවේ සභාපතිවරයා විධියට තමයි එතුමා සිය දේශපාලනය ආරම්භ කළේ. විශේෂයෙන්ම එතුමාගේ ආදරණීය පුතුන් අද සමාජයේ ඉතාම ඉහළ තැන්වල කටයුතු කරනවා. අපි ඒ සම්බන්ධවත් මේ අවස්ථාවේදී ගෞරවයෙන් සිහිපත් කරනවා. විශේෂයෙන්ම එතුමාගේ ආදරණීය බිරිඳ වන ලැටීෂියා රාජපක්ෂ මැතිනිය, 1967 වර්ෂයේ පැවැත්වූ අතුරු මැතිවරණයෙන් ජයග්‍රහණය කරලා දොඩම්ගස්ලන්ද ආසනයේ මන්ත්‍රීවරිය ලෙස පාර්ලිමේන්තුවට තේරී පත් වුණා.

අද අප කථා කරන, අපේ රටට විශාල සේවයක් කළ ගරු මැති ඇමතිතුමන්ලා සියලුදෙනා නැවතත් ගෞරවයෙන් සිහිපත් කරමින්, ඒ සියලුදෙනාගේ අභාවයන් පිළිබඳව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ශෝකය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.59]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කළ ගරු මන්ත්‍රීවරුන් පස් දෙනෙකුගේ අභාවයන් පිළිබඳ ශෝක යෝජනා ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන වෙලාවේ එතුමන්ලා ගැන කථා කරන්න මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියටත්, උතුරු මැද පළාත් සභාවේ හිටපු ඇමතිවරයෙකු විධියටත්, තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා විධියටත් කටයුතු කළ, අපේ හිත මිත්‍ර ආනන්ද සරත් කුමාර මැතිතුමා ගැන මා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. එතුමා පූජ්‍ය පක්ෂයේත්, පොළොන්නරුව දිස්ත්‍රික්කයේත් ජනතාවගේ සිත් දිනා ගත් දේශපාලන නායකයෙකු වාගේම උතුරු මැද පළාතට විශාල මෙහෙවරක්, සේවයක් ඉටු කළ මහජන නියෝජිතයෙක්. එතුමාත්, මගේ පියාත් දේශපාලන කඳවුරු දෙකක හිටියත් එතුමා මගේ පියා සමඟ බොහොම සමීපව, මිත්‍රශීලිව කටයුතු කළ දේශපාලන නායකයෙක්. එතුමා 1991 දී තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ නියෝජ්‍ය සභාපතිතුමා විධියටත්, 1993 දී උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු විධියටත්, එම පළාත් සභාවේ කෘෂිකර්ම ඇමතිවරයා විධියටත්, සෞඛ්‍ය ඇමතිවරයා විධියටත්, අවසානයේ සභානායකතුමා විධියටත් කටයුතු කළා.

ආනන්ද සරත් කුමාර මැතිතුමා 2001 වර්ෂයේදී පැවති මහ මැතිවරණයේදී පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. කෙටි කාලයකින් මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන්නට හැකි වූ මන්ත්‍රීවරයකු විධියට එතුමා අපට හඳුන්වන පුළුවන්. එතුමා මිය ගිය විට එක්තරා පුවත් පතක පළ වුණා, "හිත හොඳ මිනිසකුගේ නික්ම යෑම" යනුවෙන්. ඒ පුවත් පතතෙහි, එම ශීර්ෂය සඳහන් ලිපිය ඇතුළත් පිටුව මම **සභාගත*** කරනවා.

එතුමා පිළිබඳ දීර්ඝ විස්තරයක් ඒ කර්තෘවරයා ලියා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආනන්ද සරත් කුමාර මැතිතුමා දේශපාලනමය වශයෙන් මට මුණ ගැසුණේ 2004 වර්ෂයේදී. පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වෙලා පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මා එදා උතුරු මැද පළාත් සභාවට තේරී පත් වුණාට පස්සේ, ආනන්ද සරත් කුමාර මැතිතුමා මට කථා කරලා, "ඔබතුමාගේ පියාත් මමත් දේශපාලන පක්ෂ දෙකක සිටියත් මම ඔබතුමාගේ පියාගෙන් ඉගෙන ගත් හුඟක් දේවල් තිබෙනවා. ඔබතුමාගේ පියාගෙන් ඉගෙන ගත් ඒ දේවල් මම අද ඔබතුමාට කියන්න කැමැතියි" කියලා මගේ අතින් අල්ලාගෙන කියපු දේවල් මට අද වාගේ මතකයි. "ප්‍රදේශයේ ජනතාවට ආදරය කරන්න ඕනෑ. තමන් නියෝජනය කරන මේ උත්තරීතර පාර්ලිමේන්තුව වෙන්න පුළුවන්, පළාත් සභාව වෙන්න පුළුවන්, ප්‍රාදේශීය සභාව වෙන්න පුළුවන්, මේ හැම එකකටම අපව පත් කරලා එවන්න මූලිකත්වය ගන්නා ගමේ ඉන්න අහිංසක ඡන්ද දායකයා අමතක කරන්න එපා මල්ලි" කියලා එතුමා එදා කියපු හැටි මට අද වාගේ මතකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එතුමා පක්ෂ, පාට දේශපාලනයෙන් තොරව, ප්‍රදේශයේ හැම අවමංගල්‍ය උත්සවයකටම, තමන්ට ආරාධනා කළොත් මංගල උත්සවවලට පවා -ඒ හැම එකකටම- සහෝදරයෙකු වාගේ, ඥාතියෙකු වාගේ සහභාගි වුණා. ප්‍රදේශයේ කාගේ හෝ මරණයක් සිදු වුණා නම්, එතුමා ඒ පවුලේ ඥාතිවරුන්ට කලින් ඒ කරදරය වෙච්ච ගෙදරට ගිහිල්ලා අඩු පාඩු සොයා බැලුවා. එදා එතුමා සහෝදරයෙකු වාගේ ප්‍රදේශයේ ජනතාවට පිහිට වුණා.

එතුමා අනුරාධපුරයේදී ජනතාවත් එක්ක සමීපව දේශපාලන කටයුතු කරන්න ගිහින් හිරේ විලංගුවේ වැටුණු අවස්ථාවක් මට මතකයි. එහිදී මම එතුමා බලන්න ගියා. "මල්ලි, මම අද මේ හිර බත් කන්නේ හොරකම් කරලාවත්, එහෙම නැත්නම් වෙනත් වැරැදි දේවල් කරලාවත් නොවෙයි. මගේ ජනතාවට සේවය කරන්න ගිහිල්ලා තමයි අද මම මේ හිර බත් කන්නේ." කියලා එතුමා එදා කිව්වා මට මතකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මතක් වෙනවා, 2015 වර්ෂයේ පැවැති ජනාධිපතිවරණය වෙලාවේ එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරක්ෂා කරන්න විශාල කැප කිරීමක් කළ ආකාරය. එතුමාගේ ඒ කැපවීම අපි දැක්කා. ඒ විතරක් නොවෙයි, දීර්ඝ කාලයක් බලයේ සිටි එක්සත් ජාතික පක්ෂය 1994 වර්ෂයේදී පරාජයට පත් කරන්න ආනන්ද සරත් කුමාර මැතිතුමා පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ විශාල මෙහෙවරක් කළා. පක්ෂ දෙකක හිටියත් අපි එදා එය දැක්කා.

ප්‍රදේශයේ ආගමික නායකයන් සමඟ එකතු වෙලා එහි විහාරස්ථාන වැඩිදියුණු කරන්නත් එතුමා කටයුතු කළා. මම එතුමා දකින්නේ, ගොවි ජනතාව වෙනුවෙන් කථා කළ, ඔවුන් වෙනුවෙන් ඉමහත් සේවයක් කළ මහජන නියෝජිතයෙකු විධියටයි. සේවාගම් ප්‍රදේශයේ, සේවාමුක්ත හටයින්ගේ ගොවි ජනපදයේ ගොවි දරුවෙකු විධියට දේශපාලනයට පිවිසි ආනන්ද සරත් කුමාර මැතිතුමා පළාත් සෞඛ්‍ය ඇමතිවරයා විධියට පොළොන්නරුව මහ රෝහල, මනම්පිටිය ආයුර්වේද රෝහල වැඩිදියුණු කරන්න විශාල කැප කිරීමක් කළා. ඒ විතරක් නොවෙයි, ඒ ප්‍රදේශයට ගංවතුර ආ අවස්ථාවක -මට ඒ වසර මතක නැහැ.- එතුමා පක්ෂ, පාට දේශපාලනය බලන්නේ නැතිව නගරයේ සියලු ව්‍යාපාරිකයන් එකතු කරගෙන ලොරි 20කින් විතර භාණ්ඩ ගෙන ගොස් එම ගංවතුරින් අවතැන් වූ ජනතාවට බෙදා දුන්නා. මා එතුමා දකින්නේ, එවැනි විශාල මෙහෙවරක් කරපු සැබෑ දේශපාලන නායකයෙකු විධියටයි. ආනන්ද සරත් කුමාර මැතිතුමා තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා විධියට කටයුතු කරද්දී කදුරුවෙල නගරය අද පවතින තත්ත්වයට ගෙනෙන්න විශාල කැප කිරීමක් කළා. ඒ කැපවීම නිසා තමයි අද අපට ඒ පහසුකම් බුක්ති විඳින්න පුළුවන් වෙලා තිබෙන්නේ.

ආනන්ද සරත් කුමාර මැතිතුමාගේ දේශපාලන ජීවිතයේ ඉතිහාසය ගැන කථා කරන කොට විශේෂයෙන්ම කිව යුතු කරුණක් තිබෙනවා. 2015 ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති අපේක්ෂකයා විධියට ඉදිරිපත් වන කොට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් විධියට කටයුතු කළ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පොදු අපේක්ෂකයා විධියට එම ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණා මට මතකයි. අද මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කථා කරන කොට කිව්වා, ආනන්ද සරත් කුමාර මැතිතුමා එතුමාගේ ලේකම්වරයකු විධියටත් කටයුතු කළා කියලා. හැබැයි, ආනන්ද සරත් කුමාර මැතිතුමා එදා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ගිය ගමනට විරුද්ධව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ සිට ගත්තා; ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ එක්ව කටයුතු කළා. එතුමා හැම වෙලාවේම බැලුවේ එතුමාගේ පක්ෂය ගැන; ප්‍රදේශයේ ජනතාව ගැන. මා හිතන විධියට දේශපාලනඥයෙකුගේ වගකීම විය යුත්තේ එයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප අතරින් වෙන් වුණු ගරු ආනන්ද සරත් කුමාර මැතිතුමා මා මේ අවස්ථාවේදී ඉතාම ආදරයෙන් සිහිපත් කරනවා. ඒ වාගේම එතුමාගේ ආදරණීය බිරිඳ වන රංජනී තෙන්නකෝන් මැතිනියට, පුතණුවන්ට සහ ආදරණීය දියණියන් දෙපළට මගේත්, මගේ පවුලේත්, අපේ පක්ෂයේත්, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලු ජනතාවගේත් ශෝකය මේ අවස්ථාවේ පළ කරන අතර, එතුමාට අමා මහ නිවන් සැප ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම, මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාටත්, සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමාටත්, උතුරු මැද පළාත් සභාවේ සභාපතිවරයකු විධියට කටයුතු කළ පී.බී. දිසානායක මැතිතුමාටත්, එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාටත් අමාමහ නිවන් සැප ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින්, ඒ පවුල්වල සියලුදෙනාට මගේ ශෝකය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ජගත් කුමාර මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු කනක හේරත් රාජ්‍ය ඇමතිතුමා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 12.07]

**ගරු කනක හේරත් මහතා (සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கனக ஹேரத் - கம்பனித் தோட்டங்களை மறுசீரமைத்தல், தேயிலை மற்றும் இறப்பர் தோட்டங்கள் சார்ந்த பயிர்ச்செய்கை, தொழிற்சாலைகளை நவீனமயப் படுத்தல் மற்றும் தேயிலை மற்றும் இறப்பர் ஏற்றுமதி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanaka Herath - State Minister of Company Estate Reforms, Tea and Rubber Estates Related Crops Cultivation and Factories Modernization and Tea and Rubber Export Promotion)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. හිටපු ගරු මැති ඇමතිතුමන්ලා පස් දෙනෙකුගේ අභාවයන් පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ, අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මන්ත්‍රීවරයකු, අමාත්‍යවරයකු විධියට කටයුතු කළ අපේ ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා ගැන වචන කිහිපයක් කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා. සමසමාජ පක්ෂය නියෝජනය කරමින් 1988 පළාත් සභාවේ විපක්ෂ නායකවරයා හැටියට දේශපාලනයට පිවිසෙන අපේ මිත්‍රපාල මැතිතුමා පසුගිය කාල වකවානුව තුළ කිහිප වතාවක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින්, අමාත්‍යවරයෙක්, නියෝජ්‍ය අමාත්‍යවරයෙක් වශයෙන් කටයුතු කරමින් විශාල සේවයක් කළා. පළමුවැනි වතාවට, 2010 වසරේදී පාර්ලිමේන්තුවට තේරී පත්වෙලා මට එතුමා සමඟ පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව ලැබුණා. මැත කාලයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ සිටි දේශපාලනඥයන්ට වඩා එතුමා වැවිලි කර්මාන්තය පිළිබඳව විශාල උනන්දුවක් දක්වමින් කටයුතු කළ කෙනෙක්. එතුමා පාර්ලිමේන්තුවේ වගේම ඉන් පිටතදීත් සෑම අවස්ථාවකම ජනතාව වෙනුවෙන් කටයුතු කළා වාගේම, අපේ ප්‍රදේශයේ වැවිලි කර්මාන්තය ශක්තිමත් කිරීම සඳහාත් ක්‍රියා කළා. ඒ වාගේම අවශ්‍ය ස්ථානවලදී ඒ පිළිබඳව කථා කළා.

මම විශේෂයෙන්ම කිවයුතු කාරණයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කෑගල්ල දිස්ත්‍රික්කයේ දුෂ්කරම ආසනය වන දැරණියගල ආසනය තමයි එතුමා නියෝජනය කළේ. අමාත්‍යවරයකු, නියෝජ්‍ය අමාත්‍යවරයකු හැටියට එතුමා කටයුතු කළ කාලවකවානුව තුළදී එතුමා දැරණියගල ආසනයට විශාල සේවාවක් කළා. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාල වකවානුව තුළදී "දැයට කිරුළ" සහ වෙනත් වැඩසටහන් තුළින් ඒ ප්‍රදේශයේ මාර්ග, පාලම් සංවර්ධනය කරලා, ජනතාවට විදුලිය ලබා දීම සඳහා එතුමා විශාල වැඩ කොටසක් කර තිබෙනවා. තවමත් එම ප්‍රදේශයේ ජනතාව එතුමා සිහිපත් කරනවා. ඒ නිසා අපි මේ අවස්ථාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ තිබෙන ඉතාම දුෂ්කර ආසනයක් සංවර්ධනය කිරීම ආරම්භ කළ දේශපාලන නායකයකු හැටියට එතුමා ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා. එතුමාගේ පුත්‍ර රත්නය වන සාරතී දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමා අද අපත් සමඟ මේ පාර්ලිමේන්තුවේ කටයුතු කරනවා. එතුමා තරුණයකු හැටියට, ඒ ප්‍රදේශයේ තම පියා කළ වැඩ කටයුතු ටික ඉදිරියට කරගෙන යන්න, ඒ දේශපාලන ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යන්න වෙහෙස මහන්සි වෙලා වැඩ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා අපේ දිස්ත්‍රික්කයට කළ සේවය අගය කරනවා. මම එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම එතුමාගෙන් අභාවයෙන් ශෝකයට පත් අපේ හිතවත් සාරතී දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමා, එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේ මැතිනිය ඇතුළු ඒ පවුලේ සියලුදෙනාටම මගේත්, මගේ පවුලේත්, අපේ දිස්ත්‍රික්කයේත්, පොදුජන පෙරමුණේත් ශෝකය ප්‍රකාශ කර සිටිනවා. ඒ වාගේම, මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ අපේ ආනන්ද රත්නායක මැතිතුමා, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා, සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා සහ පී.බී. දිසානායක මැතිතුමා යන අයගේ පවුල්වල සියලුදෙනාටත් මේ අවස්ථාවේ අපේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

බොහොම ස්තුතියි.

[අ.භා. 12.11]

**ගරු තාරක බාලසූරිය මහතා (කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தாரக பாலசூரிய - பிராந்திய உறவு நடவடிக்கைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Tharaka Balasuriya - State Minister of Regional Co-operation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ හිටපු ගරු මන්ත්‍රීතුමන්ලා පස් දෙනෙකුගේ අභාවයන් පිළිබඳව අද දිනයේ අපි ශෝකය ප්‍රකාශ කරනවා. මට කලින් කථා කළ ගරු කනක හේරත් රාජ්‍ය ඇමතිතුමා වගේම මමත් අපේ දිස්ත්‍රික්කය නියෝජනය කළ එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා ගැන තමයි කථා කරන්න බලාපොරොත්තු වන්නේ. මමත් එතුමා සමඟ යම්කිසි කාලයක් දේශපාලනය කළා. 1988 සිට මගේ පියා සමඟ එතුමා පළාත් සභාවේ සිට දේශපාලනය කළා.

ඇත්ත වශයෙන්ම එතුමා ඉතා අමුතු පුද්ගලයෙක්. ඉතා අමුතු ගතිගුණ තිබ්බ පුද්ගලයෙක්. අවංක දේශපාලනයක් කරපු පුද්ගලයෙක්. හොඳ කථිකයෙක්. ඒ වාගේම, මට ඉස්සෙල්ලා මෙතැනදී කථා කරපු හුඟ දෙනෙක් කිව්වා, එතුමා ප්‍රසිද්ධ තීන්දු ගත්තේ නැහැ, ජනප්‍රිය තීන්දු ගත්තේ නැහැ, හරි දෙය මොකක්ද කියලා බලලා තමයි එතුමා තීන්දු ගන්නේ කියලා. මට මතකයි, එතුමාට බුද්ධාගම ගැන හොඳ අවබෝධයක් තිබුණා. ඒ වාගේම මාක්ස්වාදය පිළිබඳවත් අවබෝධයක් තිබුණා. මට මතකයි, එක රැස්වීමක අපි දෙදෙනාම සිටිද්දී එතුමා කිව්වා, "තාරක අපි මස් කන්න ඕනෑ" කියලා. මම ඇහුවා, "සර්, මස් කන්න ඕනෑ කියලා කියන්නේ ඇයි?" කියලා. "නැහැ, දැන් බලන්න කෝ ලංකාවේ කට්ටිය පාවිච්චි කරන ප්‍රෝටීන් ප්‍රමාණය සෑහෙන්න අඩුයි. ඒ නිසා ඒ කට්ටිය ශක්තිමත් වෙන්න නම් මස් කන්න ඕනෑ" කියලා එතුමා කිව්වා. සාමාන්‍යයෙන් දේශපාලනඥයකු ගිහිල්ලා රැස්වීමකදී මෙවැනි අදහසක් ඉදිරිපත් කරන්නේ නැහැ. ජනප්‍රිය තීන්දු කෙසේ වෙතත්, විද්‍යාත්මකව අධ්‍යයනය කරලා තමයි එතුමා ඒ තීන්දුවට ආවේ. එතුමා ගත් මෙවැනි තීන්දු ගැන විශේෂයෙන්ම කියන්න ඕනෑ.

එතුමා ඉස්සෙල්ලාම ලංකා සමසමාජ පක්ෂයෙන් තමයි දේශපාලනයට ආවේ, 1977 දී. ගලිගමුව ආසනයෙන් එතුමා තරග වදින්න ඉදිරිපත් වුණා. ඉන්පසුව එතුමා යටියන්තොට ආසනයේත්, ඉන්පසුව දැරණියගල ආසනයේත් ආසන සංවිධායක ලෙස කටයුතු කළා. දැරණියගල කියන්නේ ඉතා විශාල, දුෂ්කරම ආසනයක්. එතුමාගේ කාලය තුළදී එම ආසනයේ විශාල සංවර්ධන කටයුත්තක් කළා. මට මතකයි, එතුමා කොයි වෙලාවේත් ඇවිල්ලා අපිත් එක්ක තර්ක කළා, කෑගල්ලටයි, දැරණියගලටයි එකම මුදල් ප්‍රමාණය දෙන්නේ කොහොමද කියලා. එතුමා කොයි වෙලාවේත් කිව්වේ ගලිගමුවයි, කෑගල්ලයි, රඹුක්කනයි තුනම එකට දැමුවත් භූමි ප්‍රමාණයෙන් දැරණියගල තරම් ලොකු නැහැ කියලායි. එහෙම තර්ක කරලා දැරණියගල ආසනයේ සංවර්ධනයට විශාල මුදල් ප්‍රමාණයක් ගන්න එතුමාට

පුළුවන් වුණා. ඒ වාගේම එතුමාට හොඳ කරීකත්වයක් තිබුණා. එතුමාගේ කථා අහන්න හුඟක් කට්ටිය ආවා. එතුමාගේ කථාවලට හුඟක් කට්ටිය කැමැතියි. එතුමා කළ ඒ සේවය වෙනුවෙන් අපේ ප්‍රණාමය පුද කරනවා. එතුමාගේ වියෝවෙන් ශෝකයට පත් දුෂ්මන්ත මිත්‍රපාල මන්ත්‍රීතුමා ඇතුළු එතුමාගේ පවුලේ සියලුදෙනාට අපේ කනගාටුව ප්‍රකාශ කර සිටිනවා. ඒ වාගේම, මෙම පාර්ලිමේන්තුවේ දීර්ඝ කාලයක් කටයුතු කරපු ආනන්ද රත්නායක මන්ත්‍රීතුමා, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මන්ත්‍රීතුමා, වාමාංශික ව්‍යාපාරයේ විශාල සේවයක් කරපු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා, පී.බී. දිසානායක මැතිතුමාත් මා ඉතා ගෞරවයෙන් මේ අවස්ථාවේ සිහිපත් කරනවා. එතුමන්ලාගේ වියෝවෙන් ශෝකයට පත් එම පවුල්වල සියලුදෙනාටත් අපේ කනගාටුව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය - *[සභා ගර්භය තුළ නැත.]*

මීළඟට, ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා.

[අ.භා. 12.15]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon.K. Sujith Sanjaya Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලයක් මෙම ගරු සභාව නියෝජනය කළ මැති ඇමතිවරුන් කිහිපදෙනෙකුගේ අභාවයන් පිළිබඳ ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේදී මටත් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න අවස්ථාව සලසා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපේ කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් දීර්ඝ කාලයක් මේ සභාව නියෝජනය කළ ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා ගැන කථා කරන්න මේ අවස්ථාවේදී මා බලාපොරොත්තු වෙනවා. එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා 1988 දී තමයි පළමුවැනිවරට දේශපාලනයට සම්බන්ධ වෙන්නේ. ඒ, යටියන්තොට මැතිවරණ කොට්ඨාසයේ ලංකා සමසමාජ පක්ෂයේ සංවිධායකවරයා වශයෙන්. ඒ කාලයේ තමයි මට එතුමා පෞද්ගලිකව දැනගන්න අවස්ථාව ලැබුණේ. මොකද මගේ පියා වන වින්සන්ට් පෙරේරා මැතිතුමා ඒ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට තමයි කටයුතු කළේ. ඊට පස්සේ, පළාත් සභා මැතිවරණය පැවති කාලය ලොකු භීෂණයක් තිබුණු සමයක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් ඒ අවස්ථාවේ තරග කළේ නැහැ. අපි දන්නවා, ඒ කාලය ආණ්ඩු පක්ෂයේ අපේක්ෂකයන්ටත්, විපක්ෂයේ අපේක්ෂකයන්ටත් ජීවිත තර්ජන තිබුණු සමයක් බව. ඒ වාගේම, ඡන්දය ප්‍රකාශ කරපු පළමුවැනි පස්දෙනා ඝාතනය කරනවා කියලා යම් යම් කණ්ඩායම් ප්‍රකාශ කර තිබුණු අවස්ථාවක තමයි එතුමා එම පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වුණේ.

හැබැයි, අවස්ථානුකූලව පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වෙලා, සබරගමුව පළාත් සභාවේ; ප්‍රථම පළාත් සභාවේ විපක්ෂ නායකවරයා වශයෙන් පත් වෙන්න එතුමාට අවස්ථාව ලැබුණා. එතුමා දීර්ඝ කාලයක් තිස්සේ පළාත් සභාව නියෝජනය කළා. ඒ කාල සීමාව තුළදී මටත් අවුරුද්දක විතර කාල සීමාවක් එතුමා එක්ක පළාත් සභාවේ කටයුතු කරන්න අවස්ථාව ලැබුණා. එතුමා දීර්ඝ කාලයක් පළාත් සභාව නියෝජනය කරලා, 2000 වසරේදී, යටියන්තොට මැතිවරණ කොට්ඨාසයේ කාලයක් වැඩ කරලා පසුව දැරණියගල මැතිවරණ කොට්ඨාසය නියෝජනය කළා. ඒ අවස්ථාවේ තමයි එතුමාට පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණේ. දැරණියගල කියන්නේ, ඉතාම දුෂ්කර මැතිවරණ කොට්ඨාසයක්. ඒ දුෂ්කර මැතිවරණ කොට්ඨාසය සංවර්ධනය කරන්න එතුමා විශාල කැප කිරීමක්, ලොකු වැඩ කොටසක් කළා. අද කාලයේ දේශපාලනඥයන්ට නොයෙකුත් ආකාරයේ චෝදනා එල්ල වෙනවා. හැබැයි, මිත්‍රපාල මැතිතුමා අවංක දේශපාලනඥයෙකු හැටියට ලොකු කීර්තියක් ඉසිලුවා. එතුමාට කවදාවත් දූෂණ, වංචා චෝදනා කිසිවක් තිබුණේ නැහැ. එතුමා නිකැළැල් දේශපාලන ඉතිහාසයක් තිබුණු නායකයෙක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද අපි දකින තවත් සුවිශේෂ කාරණාවක් තමයි, තමන්ගේ පියාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව ගෙන එන අවස්ථාවේදී මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න සාරතී දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමාට වාසනාව තිබීම. එදා එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා ගෙන ගිය සේවාව ඉදිරියට ගෙන යන්න, එතුමා විශ්‍රාම ගත්තාට පසුව අපේ සාරතී දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමා කටයුතු කරමින් සිටින බවත් මම මේ අවස්ථාවේ සිහිපත් කරන්න ඕනෑ. මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. විශේෂයෙන්ම සාරතී දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමා ප්‍රමුඛ එම පවුලේ සියලු දෙනාටම මේ අවස්ථාවේදී අපගේ ශෝකය ප්‍රකාශ කරනවා.

ඊට අමතරව, තවත් හිටපු ගරු මන්ත්‍රීතුමන්ලා හතරදෙනෙකුගේ අභාවයන් පිළිබඳ ශෝක යෝජනා අද මේ සභාවට ඉදිරිපත් කර තිබෙනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කළ ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දොඩම්ගස්ලන්ද මැතිවරණ කොට්ඨාසයේ ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා, අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ පී.බී. දිසානායක මැතිතුමා, ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් පත් වෙලා හිටපු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා පිළිබඳවත් ශෝක ප්‍රකාශ යෝජනා මේ සභාවට ඉදිරිපත් කර තිබෙනවා. එතුමන්ලා පෞද්ගලිකව ඇසුරු කරන්න නොලැබුණත්, අපි දන්නා පරිදි ඒ හැම කෙනාම මේ ගරු සභාව නියෝජනය කරලා තමන්ගේ කොට්ඨාසයට, තමන්ගේ ප්‍රදේශයට අවංක සේවාවක් කළ දේශපාලන නායකයන් බවයි අපට දැන ගන්න ලැබී තිබෙන්නේ. මේ අවස්ථාවේදී මම එතුමන්ලාගේ පවුල්වල සියලුදෙනාටත් අපේ ශෝකය ප්‍රකාශ කරමින්, ඒ ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාටම නිර්වාණ සම්පත්තිය අත් වේවායි ප්‍රාර්ථනා කරනවා.

බොහොම ස්තුතියි.

[අ.භා. 12.20]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - வர்த்தக அமைச்சர்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Trade)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගරු සභාව නියෝජනය කළ මැති ඇමතිතුමන්ලා පස්දෙනෙකුගේ අභාවයන් පිළිබඳ ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවේදී, ඒ පවුල් වෙත අපේ ශෝකය පළ කරමින්, මේ ගරු සභාව නියෝජනය කළ, මහජන එක්සත් පෙරමුණේ දීර්ඝ කාලීන ක්‍රියාකාරී දේශපාලන නායකයෙකු වූ සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා පිළිබඳව වචන කිහිපයක් කථා කරන්න මා බලාපොරොත්තු වෙනවා. එතුමා අපේ පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලයේ උපත ලබලා, කඩුවෙල මැතිවරණ කොට්ඨාසයේ මහා විද්‍යාල, මධ්‍ය විද්‍යාල හරහා අධ්‍යාපනය ලබලා, උසස් අධ්‍යාපනය සඳහා කොළඹ හැව්ලොක් ටවුන්හි පිහිටි ලුම්බිණි මහා විද්‍යාලයයේ වාණිජ අංශයට ඇතුළත් වුණා. ඔබතුමාත් දන්නා පරිදි, රටේ එවකට

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

පැවතුණ වාණිජ අංශයේ හොඳම පාසල ලෙස සැලකුණේ, ලුම්බිණි මහා විද්‍යාලය. ලුම්බිණි මහා විද්‍යාලය තුළ ශිෂ්‍ය නායකයෙකු ලෙසත්, විවාද කණ්ඩායමේ නායකයෙකු ලෙසත්, තරුණ ජව සම්පන්න නායකත්වයක් පාසල් ශිෂ්‍ය වියේ පටන් එතුමා දක්වා තිබුණා.

එවකට ලංකා සමසමාජ පක්ෂයේ, ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ශිෂ්‍ය ව්‍යාපාර තිබියදී ලංකා ජාතික ශිෂ්‍ය සම්මේලනයට සම්බන්ධ වෙලා, ලංකා සමසමාජ පක්ෂයේ තරුණ ශිෂ්‍ය නායකයෙකු ලෙස එතුමා කටයුතු කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නා පරිදි, පසුව එතුමා taxation and valuation පාඨමාලාව හදාරන්න ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ඇතුළු වුණා. එම විශ්වවිද්‍යාලය තුළත් එතුමා ශිෂ්‍ය නායකයෙක් ලෙස ලංකා සමසමාජ පක්ෂය නියෝජනය කරමින් කටයුතු කළා. ඒ අතර එතුමා මරදාන කාර්මික විද්‍යාලයට ගිහිල්ලා උසස් ඩිප්ලෝමාවක් හැදෑරුවා. විශ්වවිද්‍යාලය තුළත්, කාර්මික විද්‍යාලය තුළත් ඉහළ අධ්‍යාපනයක් ලබාගෙන එතුමා උපාධිධාරියෙක්, ඩිප්ලෝමාධාරියෙක් බවට පත් වුණා. ඒ වාගේම එතුමා ශිෂ්‍ය නායකයෙක් ලෙසත් කටයුතු කළා. පසුව ක්‍රියාකාරී දේශපාලනයට පිවිසි එතුමා, දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ නායකත්වය යටතේ මහජන එක්සත් පෙරමුණ වෙනුවෙන් දීර්ඝ කාලයක් දේශපාලන ක්‍රියාවලියේ නිරත වුණා. කඩුවෙල නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල රාශියක සභාපතිවරයෙක් වශයෙන් එතුමාගෙන් මේ රටට විශාල සේවාවක් ඉෂ්ට වුණා. විශේෂයෙන්ම මේ රට කඩන්නේ නැතුව, බෙදන්නේ නැතුව කුරිරු ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා ගත් උත්සාහයේදී එවකට මහජන එක්සත් පෙරමුණ ලබා දුන් නායකත්වයට එතුමා විශාල ශක්තියක් සපයනු ලැබුවා. විශේෂයෙන්ම වෘත්තීය සමිති අරගළවලදී, දේශීය සම්පත් සුරැකීම සඳහා වන ව්‍යාපාරවලදී වෘත්තීය සමිති නායකයෙක් ලෙසත් එතුමා කටයුතු කළා. එතුමාට හොඳ කාය ශක්තියක් සමඟ විශාල ශරීරයක හිමිකම තිබුණා වාගේම ඉතාම හොඳ කථිකත්වයකුත් තිබුණා. ඒ වාගේම, නිර්භීතව ඕනෑම තැනකදී ඉදිරියට ඒමේ හැකියාවකුත් එතුමා තුළ තිබුණා. ඒ නිසාම තමයි ඕනෑම වාදයකදී, විවාදයකදී තමන් සතු උගත්කමත්, තමන් සතු දේශපාලන පන්නරයත් තුළ ඉතාම නිරවුල්ව කටයුතු කිරීමට එතුමාට හැකි වුණේ. එවැනි දේ කිරීම තුළින් වෘත්තීය සමිති ව්‍යාපාරයටත්, දේශීය සම්පත් ආරක්ෂා කිරීම සඳහාත්, මාතෘ භූමිය නිදහස් කර ගැනීම සඳහාත් එතුමා කළ මෙහෙවර, සේවාව සදාකාලිකව අප මතකයේ රැඳෙනවා. එවැනි දැවැන්ත දේශපාලන යුග මෙහෙවරක් ඉෂ්ට කළ එතුමාගේ හදිසි වියෝව පිළිබඳව එතුමාගේ දූවා දරුවන් ඇතුළු පවුලේ සියලුදෙනා වෙත ශෝකය පළ කර සිටින අතර, එතුමාට නිවන් සුව ලැබේවායි කියා මම ප්‍රාර්ථනා කරනවා.

දෙවනුව, මම ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා පිළිබඳව කථා කරන්න කැමැතියි. එතුමා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ අපට කලින් අධ්‍යාපනය හැදෑරූ පැරණි උපාධිධාරියෙක්. මම හිතන විධියට, එස්.බී. දිසානායක මැතිතුමන්ලාටත් ප්‍රථම මහින්ද විජේසේකර යුගය වාගේ තමයි එතුමා නියෝජනය කළේ. පසුව එතුමා නීතිඥයෙකු ලෙස වෘත්තීය කටයුතු කළා. එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා වමේ ව්‍යාපාරයේ ලංකා සමසමාජ පක්ෂය තුළ ඉතාම ක්‍රියාකාරී, දක්ෂ, තරුණ නායකයෙකු ලෙස කටයුතු කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාලය තුළදී එතුමා ඔබතුමන්ලාගේ ප්‍රදේශයේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් ඒ වාගේම පළාතේ සංවර්ධනය වෙනුවෙන් ජනයාගේ පැත්තේ හිටගෙන ඉතා විශාල මෙහෙවරක් ඉෂ්ට කළා. මම වෙළෙඳ, අළෙවි සංවර්ධන හා සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍ය ධුරය දරද්දී කලක් එතුමා මගේ නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළා. ඒ කාල පරිච්ඡේදවලදී සබරගමුව පළාතට, එතුමාගේ ප්‍රදේශයට රාජ්‍ය සම්පත් මොනවා හෝ එකතු කරගෙන යන්න පුළුවන් නම් ඒවා අරගෙන ගිහිල්ලා ඒ ප්‍රදේශයේ ජනතාවට විශාල සේවයක් කරන්න එතුමා නිරන්තරයෙන් උත්සාහයක යෙදුණා. මම අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් සිටියදී දැරණියගල ප්‍රදේශයේ මධ්‍ය විද්‍යාලයක -මට ඒ පාසලේ නම මතක නැහැ.- ප්‍රාථමික අංශය ඉවත් කරලා මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරය හදන්න එතුමා මාව කැඳවාගෙන ගියා.

ඒ අවස්ථාවේ ලාංකීය නිදහස් අධ්‍යාපනයේ හැරවුමක් වූ ද්විතියික පාසල් දහසක් ඇති කිරීමේ වැඩ පිළිවෙළට ජනතා විමුක්ති පෙරමුණ බරපතළ ලෙස විරෝධය දැක්වූවා. තොරතුරු තාක්ෂණය, ජෛව පද්ධති තාක්ෂණය, ඉංජිනේරු තාක්ෂණය, තාක්ෂණය සඳහා විද්‍යාව කියන විෂය ධාරාව හඳුන්වා දීමට හා ඒ මත පදනම් වෙච්ච තාක්ෂණ විද්‍යාගාර ඇති කිරීමට දේශපාලන පක්ෂයක් වශයෙන් බරපතළ ලෙස විරුද්ධ වුණේ ජනතා විමුක්ති පෙරමුණ පමණයි. ඔවුන් නිතරම ඒ කාලයේ සඳහන් කළා, "අධ්‍යාපනය වනසන බන්දුල ගෙදර පල" කියලා. මම පාසලකට යනකොටත් ඒ කියමන බැනරයක ගහලා තිබුණා. දැරණියගල විද්‍යාලයක ගොඩනැඟිල්ලකට මුල්ගල් තියන කොට ඒ ප්‍රදේශයේ හිටපු මේ පක්ෂවලට සම්බන්ධ තරුණ ශිෂ්‍යයෙක් කෑ ගහලා කිව්වා, "අධ්‍යාපනය වනසන අය ගෙදර යන්න" කියලා. මමත්, මිත්‍රපාල හිටපු ඇමතිතුමාත් ඒ මුල්ගල් තියලා ඉවර වෙලා, උඩ තට්ටුවට ගිහිල්ලා ඒ දරුවාට කථා කරලා කිව්වා, "අපි මේ කරන්නේ වෙනසක්. ඒ වෙනස මේ පළාත්වල ඉන්න අනික් දරුවන්ට අනාගතයේදී යහපතක් වන නිසා ඒ වාගේ දෙයකට විරෝධය පළ කිරීම සාධාරණ නැහැ" කියලා. මේ රටේ කවර යහපත් දෙයක්වත් දේශපාලන දෘෂ්ටි කෝණයෙන් තොරව බලන්න බැරි යුගය වෙනස් විය යුතු බව ඒ දරුවාට කරුණු පැහැදිලි කරලා කිව්වාම ඔහු ඒක ඇදහුවා. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, මිනිස් අයිතිවාසිකම් වෙනුවෙන් සහ සාධාරණ හා සාධනීය දේ වෙනුවෙන් උගත්කමක් සහිතව ඒක දැකලා සහයෝගය දක්වන්න පුළුවන් අයෙකු ලෙස ඔහු නිරන්තරයෙන් ක්‍රියා කළා. මිත්‍රපාල හිටපු ඇමතිතුමා, එතුමා වෙනුවෙන් ඒ ප්‍රදේශයේ ජනතාවට සේවය කරන්න එතුමාගේ ආදරණීය පුත්‍ර රත්නය වන සාරතී දුෂ්මන්ත මැතිතුමා ජයග්‍රහණය කරවලා අපෙන් සමු ගත්තා. එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාට නිවන් සුව ලැබේවා කියා ප්‍රාර්ථනා කරන අතර, අද ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන අනිකුත් හිටපු මැති-ඇමතිතුමන්ලා සියලු දෙනාගේම අභාවය වෙනුවෙන් එතුමන්ලාගේ පවුල්වල අයටත් අපේ පාර්ලිමේන්තුවේ ශෝකය පළ කරමින් මගේ වචන කීපය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! දිවා ආහාර විවේකය සඳහා සභාවේ වැඩ කටයුතු පස්වරු 1.30 දක්වා තාවකාලිකව අත්හිටුවනවා.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නැවත පවත්වන ලදී.*

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.30 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.*

**සහකාර මහ ලේකම්**
(உதவிச் செயலாளர் நாயகம்)
(Assistant Secretary-General)

කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
"ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்படி, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. SHANTHA BANDARA *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේ හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ නැති අවස්ථාවේදී ගරු සභානායකතුමාත්, ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාත් එතුමා ගැන යම් සඳහනක් කළා. ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමට හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට විනාඩි කීපයක් ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ දවසේ වෙච්ච සිදුවීම පිළිබඳව පැහැදිලි කිරීමට මට විනාඩි කීපයක් ලබා දෙන්න. අද දවසේ ශෝක ප්‍රකාශ යෝජනා පිළිබඳව කථා කරන නිසා ඒ වෙනුවෙන් මෙම ගරු සභාවට පැමිණ සිටින එම පවුල්වල සියලු දෙනාගෙන්ම මම මුලින්ම සමාව අයැද සිටිනවා. මේ වනකොට රූපවාහිනී නාළිකාවලත්, සමාජ මාධ්‍යවලත් විශාල වශයෙන් කථා බහට ලක් වනවා, මම ඊයේ යම්කිසි පාර්සලයක් මේ ගරු සභාවට රැගෙන ආවාය කියලා. ගරු කථානායකතුමාත් ප්‍රකාශයක් කළා, "මම පොලිස් නිලධාරින්ගේ රාජකාරියට බාධා කිරීමක් කළා. පොලීසියේ නිලධාරින් මාරු කිරීමක් මේ වනකොට සිදු වෙමින් පවතිනවා" කියලා. මම ඉල්ලීමක් කරනවා, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න කියලා. මම ඒ පරීක්ෂණයට මුහුණ දෙන්න සූදානම්. පාර්ලිමේන්තුව කියන මුර ගල තුළට ප්‍රජාතන්ත්‍රවාදී ලෙස, කිසිම හානියක් සිදු නොවන අන්දමින් රැගෙන ආපු දෙයක් සම්බන්ධයෙන් විශාල කථා බහක් මේ වනකොට සමාජය තුළ ඇතිවෙලා තිබෙනවා. මම කිසිම පාර්සලයක් මේ ගරු සභාවට ගෙනාවේ නැහැ. මෙන්න මේ බෑගය තමයි මම ඊයේ අරගෙන ආවේ. අදත් ඒ බෑගය මම අරගෙන ආවා. ඒ වාගේම මම ගෙනාවේ පුංචි, සෙල්ලම් ටෝච් එකක්. ඒ ටෝච් එක මම ගෙනාවේ සමාජයට පෙන්වන්නයි. මම අදත් ඒ ටෝච් එක ගෙනාවා. මේකේ ඇන්ත්‍රැක්ස් මුකුත් නැහැ. මේ ටෝච් එක අරින්න පුළුවන්. මේ ටෝච් එක රුපියල් 100යි. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න කියලා. නිලධාරින්ට මම බාධා කළේ නැහැ. මේ බෑගය ස්කෑනර් යන්ත්‍රයට දමලා තමයි මම ගත්තේ. ඒක බෑගය ඇතුළේ තිබුණේ. ඒ නිසා අසත්‍ය ප්‍රකාශ කරන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ කාරණය සම්බන්ධයෙන් ගරු කථානායකතුමා දැනුවත් කරන්න කියලා. මේ පරීක්ෂණයට මුහුණ දෙන්න මම සූදානම්. නමුත්, මම ලබන සඳුදා රන්ජන් රාමනායක මැතිතුමා වෙනුවෙන් යම්කිසි කර්තව්‍යයකට යොමු වෙන්න සූදානමින් සිටිනවා. ඒ සම්බන්ධයෙන් බාධා නොකරන ලෙසත්, පාර්ලිමේන්තුවේ මගේ වරප්‍රසාද ආරක්ෂා කර දෙන ලෙසත් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

අද දින අපි හිටපු ගරු මන්ත්‍රීතුමන්ලා පස්දෙනෙකුගේ අභාවය පිළිබඳ ශෝකය පළ කරමින් කථා කරනවා. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු ආනන්ද රත්නායක මැතිතුමා, ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා, ගරු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා සහ ගරු පී.බී. දිසානායක මැතිතුමා සහ මා මිත්‍ර දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමාගේ පියාණන් වන එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාට නිවන් සුවය ලැබේවා! සමාදානයේ සැතපෙන්න ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කරපු කාරණය ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරන්නම්.

මීළඟට, ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමා.

[අ.භා. 1.33]

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුව නියෝජනය කළ හිටපු මැති ඇමතිවරු 5දෙනෙකුගේ අභාවය පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කර තිබෙන වෙලාවේ, එතුමන්ලා ගැන කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියටත්, දේශපාලන ඉතිහාසයේ දැවැන්ත කාර්ය භාරයක් ඉටු කළ නායකයෙක් හැටියටත්, මම බොහොම ආදරය කරන ගරු පී.බී. දිසානායක මැතිතුමා පිළිබඳව යම්කිසි සඳහනක් කරන්නට මුලින්ම මම මේ අවස්ථාව යොදා ගන්නවා. පී.බී. දිසානායක මැතිතුමා තමන්ගේ දෙමව්පියන්ට බොහෝ ගෞරවයක් අත්කර දුන් දරුවෙක්. එතුමාගේ පවුලේ තව සහෝදර සහෝදරියන් හත්දෙනෙක් හිටියා. එතුමා එප්පාවල ඉහළ හල්මිල්ලෑව ගමේ ඉපදිලා, නියම ගැමියෙක් හැටියට ජීවත් වූ කෙනෙක්. එතුමා ඉහළ හල්මිල්ලෑව මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබලා, ඉන් පසුව අනුරාධපුර ශාන්ත ජෝශප් විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය හැදෑරුවා. එතුමා පාසලේ සිටට

[ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා]

ඉතා කීර්තිමත් ශිෂ්‍යයෙක්. අධ්‍යාපන කටයුතු අවසන් කරලා එතුමා පළමුවැනි රැකියාව ලෙස තෝරා ගත්තේ ගුරු වෘත්තියයි. එතුමා අනුරාධපුර දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, මේ රටේ දරුවන් දහස් ගණනකගේ ඇස් පාදපු අතිවිශිෂ්ට ගුරුවරයෙක්. ඉන් අනතුරුව එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ වෙලා ලොකු දේශපාලන ගමන් මඟකට අවතීර්ණ වුණා.

පී.බී. දිසානායක මැතිතුමා 1991 දී තලාව ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායකවරයා හැටියටත්, ඉන් පසුව තිබූ පළාත් සභා මැතිවරණයෙන් ජයග්‍රහණය කරමින් පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියටත් කටයුතු කර තිබෙනවා. ඒ වාගේම 1988 ඉඳලා කලාවැව ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා හැටියට කටයුතු කරමින් එතුමා විශාල කාර්ය භාරයක් ඉටු කළා. එතුමා 1994දී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරමින් චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ ආණ්ඩුවේ මන්ත්‍රීවරයකු විධියට කටයුතු කළා. විශේෂයෙන්ම 1994ට පෙර අවුරුදු 17ක් ආණ්ඩු බලය තිබූ එක්සත් ජාතික පක්ෂය පරාජයට පත් කරලා, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ජනාධිපතිනිය බවට පත් කරන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් විශාල කාර්ය භාරයක් කරපු දැවැන්ත නායකයෙක් තමයි පී.බී. දිසානායක මැතිතුමා. එතුමා 1994දී අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් දෙවැනි තැනට මනාප අරගෙන තමයි පාර්ලිමේන්තුව නියෝජනය කළේ. නැවතත් 2003දී එතුමා බටහිර අනුරාධපුර ආසනය නියෝජනය කරමින් පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඉන් පසුව පැවැත්වූ පාර්ලිමේන්තු මැතිවරණයෙන් එතුමා පරාජය වුණාට පස්සේ, නැවත පළාත් සභාවේ සභාපති ධුරයටත්, ඉන් පසුව ආණ්ඩුකාර ධුරයටත් පත්වෙලා විශාල කාර්ය භාරයක් කළා.

පී.බී. දිසානායක මැතිතුමා පිළිබඳව කථා කරනකොට, මුලින්ම කිව යුතු කාරණය වන්නේ එතුමා බොහොම නිහතමානී මිනිසෙකු බවයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා විරුදාවලිය ලැබූ සුවිශේෂී ගුණාංගයක් එතුමාගේ දෛනික ජීවිතය තුළ තිබුණා. ඒ තමයි, එතුමාගේ නිවසට පැමිණෙන ඕනෑම පුද්ගලයෙකුට එම නිවසේ ඉස්සරහා දොරින් ඇතුළු වෙලා, පිටුපස දොරින් එළියට යන්න පුළුවන් ආකාරයට ඕනෑම කෙනෙකු වෙනුවෙන් එතුමන්ගේ නිවස විවෘත කර තිබීම. ඒ වාගේ බොහොම ශ්‍රේෂ්ඨ, නිහතමානී නායකයෙක්, පී.බී. දිසානායක මැතිතුමා.

විශේෂයෙන්ම අද මම පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ එතුමා නිසායි. එතුමා එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අනුරාධපුර ආසනයේ සංවිධායකවරයා හැටියට ඉන්න කාලයේ බටහිර අනුරාධපුර ආසනයේ පළාත් පාලන ආයතනයට නාම යෝජනා භාරදීමට මට අවස්ථාව ලබාදීම නිසා තමයි මමත් අද එතුමාගේ ගෝලයෙක් හැටියට පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ. විශේෂයෙන්ම පී.බී. දිසානායක මැතිතුමා ඒ කාලයේ පියෙක් වාගේ ළඟින් ඉඳගෙන අපේ දේශපාලන ගමන් මඟට උපදෙස්, අනුශාසනා ලබා දුන්නා. විශේෂයෙන්ම බර්ටි දිසානායක මැතිතුමාත් එක්ක එදා හිටපු දිස්ත්‍රික් නායකයා හැටියට එතුමා බොහොම ළඟින් ඉඳගෙන අපට උපදෙස්, අනුශාසනා දීපු නිසා, එතුමාගේ ආභාසයත් එක්ක මටත් දේශපාලනයට පිවිසෙන්න පුළුවන්කම ලැබුණා. විශේෂයෙන් දෙවතාවක්ම නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති වෙන්නත්, ඒ වාගේම පළාත් සභාව නියෝජනය කරලා අද පාර්ලිමේන්තුව නියෝජනය කරන තැනට එන්නත් මට සියලු උපදෙස්, අනුශාසනා ලබා දුන්නේ, ඒ සඳහා මූලිකත්වය ගෙන කටයුතු කළේ ගරු පී.බී. දිසානායක මැතිතුමාය කියන එක මම අද මෙතැනදී විශේෂයෙන් කියන්න ඕනෑ. එතුමා ඉතාම ශ්‍රේෂ්ඨ නායකයෙක්. එතුමා අනුරාධපුර දිස්ත්‍රික්කයේ හිටපු නිහතමානීම දේශපාලන නායකයා කිව්වොත් එය නිවැරදියි.

අද හැම කෙනෙක්ම කිව්වා වාගේ, විශේෂයෙන්ම පී.බී. දිසානායක කියන නම නොකැළැල් නාමයක්. හොරකම් නැති, ජඩ වැඩ නැති නොකැළැල් නාමයක් තමයි පී.බී. දිසානායක මැතිතුමාට දිවංගත වනතුරු තිබුණේ. මම මේ මොහොතේ අපේ ශ්‍රේෂ්ඨ නායකයා පිළිබඳ සිහිපත් කරනවා වාගේම, එතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ බිරිඳ සහ දරුවන්ට අනුරාධපුර බටහිර ආසනයේ ජනතාවගේ ශෝකය, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ ශෝකය මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම ආනන්ද රත්නායක මැතිතුමාත් සිහිපත් කරන්න ඕනෑ. එතුමාත් වසර පහක් මා සමඟ උතුරු මැද පළාත් සභාව නියෝජනය කළා. එතුමාත් බොහොම නිහතමානී, ගුණගරුක නායකයෙක්. අපි දැක්කා, පළාත් සභාව තුළ ඉන්නකොට එතුමා ජනතා මෙහෙවරේ යෙදුණු ආකාරය. ජනතාවට මෙහෙවර කරන්න ගිහිල්ලා, ජනතාවට උදව් කරන්න ගිහිල්ලා එතුමාට සිරබත් කන්න පවා සිදු වුණා. එතුමා එවන් විශිෂ්ට දේශපාලන නායකයෙක්. අපි එතුමාටත් නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම එතුමාගේ පවුලේ බිරිඳ, දරුවන් සියලු දෙනාට අපේ ශෝකය මේ අවස්ථාවේ පළ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා, සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා, ඒ වාගේම එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා කියන සියලු දෙනාත් රට වෙනුවෙන් දැවැන්ත කාර්ය භාරයක් ඉටු කරපු නායකයන්. ඒ සියලු දෙනාට නිවන් සුව ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පවුල්වල ඥාතීන්ට, හිතවතුන්ට මගේ ශෝකය ප්‍රකාශ කරමින්, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 1.40]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ පාර්ලිමේන්තුව තුළ ශෝක යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ මීට පෙර කාලයේ ජාතික දේශපාලනය තුළ දීර්ඝ සේවාවක් ඉටු කරපු, අද අපෙන් වෙන්ව ගොස් ඇති මන්ත්‍රීවරු පස්දෙනෙක් පිළිබඳවයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පස්දෙනා අතරින් මාත් එක්ක බොහොම දිග ඇසුරක්, ළඟ මිත්‍රත්වයක් පැවැතුණු හිටපු අමාත්‍ය එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා පිළිබඳව මම මුලින්ම කථා කරන්න කැමැතියි. එතුමා මට කිහිප අංශයකින්ම සම්බන්ධ වෙනවා. එතුමාත් මම වාගේම වෘත්තීය ජීවිතය ලංකා බැංකුවෙන් තමයි ආරම්භ කළේ. මට වඩා තරමක් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් විධියට ලංකා බැංකුවේ සේවය කරලා පසු කාලයකදී එතුමා නීතිඥ වෘත්තියට එනවා. නීතිඥ වෘත්තිය තුළ දීර්ඝ කාලයක් සේවය කරමින් සිටියදී තමයි එතුමා දේශපාලනයට එකතු වෙන්නේ. එතුමාගේ අධ්‍යාපන කටයුතු පිළිබඳව ගත්තත්, සුවිශේෂී තත්ත්වයක් දක්වනවා. ගම්පහ බණ්ඩාරනායක මහා විද්‍යාලයේ වාණිජ අංශයේ පන්ති මුලින්ම ආරම්භ කළේ ඒ කාලයේ. ඒ කණ්ඩායමේ ශිෂ්‍යයෙක් විධියට තමයි එතුමා ගම්පහ බණ්ඩාරනායක මහා විද්‍යාලයට ඇතුළු වෙන්නේ. එම විද්‍යාලයේ වාණිජ අංශයෙන් විශ්වවිද්‍යාලයට තේරී පත්වුණු පළමුවැනි ශිෂ්‍යයා බවට පත් වුණේත් එතුමායි. ඒ වාර්තාව තැබීම පිළිබඳ ගෞරවය එතුමාට හිමි වෙනවා. එතුමා ලංකා බැංකුවේ වසර හත අටක කාලයක් සේවය කළා. බැංකුවේ සේවය කරන කාලයේ එතුමා බැංකුවේ සියලු නිලධාරින්ගේ හිත් දිනාගෙන බොහොම මිත්‍රශීලීව කටයුතු කළා. එතුමා එවැනි නායකයෙක් විධියට අපි හඳුනාගෙන සිටියා.

පසු කාලයේදී එතුමා නීතිඥ වෘත්තියට පිවිසිලා අවිස්සාවේල්ල ප්‍රදේශයේ තිබෙන අධිකරණවලටත්, ඒ වාගේම කම්කරු විනිශ්චය සභාවලටත්, තවත් නොයෙකුත් ප්‍රදේශවල තිබෙන අධිකරණවලටත් ගිහිල්ලා නීතිඥයකු ලෙස සේවය කළා. එතුමාගේ සහෝදරයාත් නීතිඥවරයෙක්. ඒ අනුව, ඒ සහෝදර දෙපළම නීති ක්ෂේත්‍රය තුළින් මේ රටේ සාමාන්‍ය ජනතාවට යුක්තිය හා සාධාරණය ඉටු කර දීම සඳහා විශාල කැප කිරීම් කර තිබෙනවා.

මට මතකයි, එතුමාගේ දේශපාලනයේ මුල් කාලය. එතුමා දේශපාලනයට පිවිසෙන්නේ වමේ කඳවුරේ ප්‍රබලයකු විධියටයි. එදා වමේ කඳවුරේ මූලස්ථානයක් තමයි, යටියන්තොට ආසනය. එම ආසනය එවකට නියෝජනය කළේ ලංකා සමසමාජ පක්ෂයේ නිර්මාතෘ ආචාර්ය එන්.එම්.පෙරේරා මැතිතුමා. එම පක්ෂයේ දැවැන්ත චරිතයක් විධියට එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා ඉස්මතු වන්නේ යටියන්තොට ආසනයට තරග කරමින් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයකු බවට පත්වීමෙන් පසුවයි. පසු කාලයකදී එතුමා දැරණියගල ආසනයට එනවා. ඒ ආසන දෙකේම තිබෙන්නේ ඉතා දුෂ්කර ගම්මාන. මේ ගම්මානවල දේශපාලනය කිරීම ඉතා අසීරු කාර්යයක්. නමුත්, එතුමා කෑගල්ල දිස්ත්‍රික්කයේ, විශේෂයෙන්ම යටියන්තොට හා දැරණියගල මැතිවරණ කොට්ඨාස ආශ්‍රිතව ජීවත් වන ජනතාවගේ දුකේදී හා සැපේදී ඉතා ළඟින් සිටිමින් කටයුතු කළ දේශපාලනඥයකු බවට පත් වුණා.

එතුමා අමාත්‍යවරයකු, නියෝජ්‍ය අමාත්‍යවරයකු විධියටත් වගකීම් ගණනාවක් දරා තිබෙනවා. මීට කලින් මේ ගරු සභාවේ ඉදිරිපත් වූ අදහස්වලදීත් කියැවුණා, එතුමා කවදාවත් පෞද්ගලික ලාභ ප්‍රයෝජන තකා අදහස් ප්‍රකාශ කර නැති බව. මේ පාර්ලිමේන්තුවේ කථා කළත්, වෙනත් ස්ථානයක කථා කළත්, එතුමා රට ගැන හිතා ප්‍රතිපත්තිමය වශයෙන් තමයි හැම දාම කථා කර තිබෙන්නේ. අදහසක් ප්‍රකාශ කිරීමේදී ඒකෙන් තමන්ට වාසි වනවා ද, අවාසි වනවා ද කියා සිතමින් එතුමා එය ප්‍රශ්නයක් කර ගත්තේ නැහැ. ඒ වාගේම එතුමා ඉතා නිහතමානී ලෙස හා ඉතා නිහඬව තමන්ට පැවරූ අමාත්‍යාංශවල වගකීම් ඉටු කරමින් ඒ අමාත්‍යාංශ හරහා  විශාල සේවයක් මේ රටට සිදු කළ ආකාරය අපි දැක්කා.

ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා කරපු ඒ සේවය ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා එතුමාගේ පුත්‍ර රත්නය වන ගරු සාරතී දුෂ්මන්ත මිත්‍රපාල මන්ත්‍රීතුමා වත්මන් පාර්ලිමේන්තුවේ සිටීම ගැන අද අපි සතුටු වනවා.  සාරතී දුෂ්මන්ත මන්ත්‍රීතුමා තම පියාගේ අඩි පාරේ යමින්, පියා කළ සේවය ඊට වඩා හොඳින් ජනතාවට ඉෂ්ට කරන්න ඕනෑ කියන අධිෂ්ඨානය තුළ කටයුතු කරමින් සිටිනවා. 2015 වසරේත්, 2020 වසරේත් පැවැති මැතිවරණවලදී සාරතී දුෂ්මන්ත මැතිතුමා කෑගල්ල දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. එතුමා තම පියාගේ අඩි පාරේ යමින් තෝරා ගත්තේ නීතිඥ වෘත්තියයි. එතුමා අද නීතිඥවරයකු වශයෙන් කටයුතු කරන අතරේ, මන්ත්‍රීවරයකු වශයෙන් අපිත් එක්ක පාර්ලිමේන්තුවේ ඉන්නවා.

මිත්‍රපාල මැතිතුමාට දියණියන් දෙපළක් ඉන්නවා. එතුමාට ඕනෑකම තිබුණේ මේ දියණියන් දෙපළත් ඒ අද්විතීය වෘත්තියේ සාමාජිකයන් බවට පත් කරවන්නයි. තම දියණියන් දෙදෙනා සහ පුතාත් -තිදෙනාම- නීතිඥවරු කර උසස් තත්ත්වයකට ගේන්න මිත්‍රපාල මැතිතුමාට තිබුණු අධිෂ්ඨානය අද මල්පල ගැන්වී තිබෙනවා. අද ඔවුන් නීතිඥ වෘත්තියේ ඉතා හොඳ තත්ත්වයක සිටිනවා.

2015 දී මම අධිකරණ සහ බුද්ධශාසන අමාත්‍යවරයා විධියට කටයුතු කරපු කාලයේදී මගේ නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට කටයුතු කළේ සාරතී දුෂ්මන්ත මැතිතුමා. එතුමා ඒ කාල සීමාවේ ඉතා කැපවීමෙන් කටයුතු කළා. අමාත්‍යවරයා විධියට මට තිබෙන බලතල සියල්ල පාවිච්චි කරලා සමහර අවස්ථාවලදී අමාත්‍යාංශ දෙකේම කටයුතු කරන්න මම එතුමාට භාර දී තිබුණා. මොකද, ඒ තරමටම එතුමා පිළිබඳව අපට විශ්වසනීයභාවයක් තිබුණා. එතුමාට තිබෙන හැකියාව, දක්ෂතාව අනුව එම කටයුතු ඉතා ඉහළ මට්ටමින් එතුමා ඉටු කළා.

ඒ අනුව එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා තමන්ගේ ජනතා මෙහෙවර අතරමඟ නතර නොකොට ඉදිරියට පවත්වාගෙන යන්න තමන්ගේ දරුවන් හුරු පුරුදු කරලා ඒ අය සමාජයට වැඩදායක, සමාජයට නායකත්වය දෙන්න පුළුවන් පුරවැසියන් බවට පත් කර තිබෙනවා. එතුමාගේ ක්‍රියා කලාපය දෙස බැලුවාම එතුමා මොන තරම් නිහතමානී ලෙස ඒ කටයුතු සිද්ධ කළාද කියලා අපි කාටත් පෙනී යනවා. ඒ අනුව මිත්‍රපාල මැතිතුමා බලාපොරොත්තු වූ ආකාරයට එතුමාගේ පරලොව ජීවිතය සුවපත් වන්නත්, අවසානයේ එතුමාට නිවන් සුව අත්වන්නත් කියා අපි සියලුදෙනා ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ බිරිඳට සහ දරුවන් තිදෙනාට මේ අවස්ථාවේදී අපගේ ශෝකයත් ප්‍රකාශ කර සිටිනවා.

අද දින ගරු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමාගේ අභාවය පිළිබඳත් අපි ශෝක යෝජනා ඉදිරිපත් කරනවා. එතුමා, දේශපාලනයේ බල කඳවුරු නිර්මාණය කිරීමේදී යටිතල පහසුකම් සපයන්නකු විධියට විශාල සේවාවක් කළා. එතුමා දේශපාලනඥයකු වාගේම ඊටත් වඩා වැඩියෙන් වෘත්තීය සමිති නායකයකු විධියට ජනප්‍රියයි, ප්‍රසිද්ධයි. එතුමා බොහොම අවංක, වැඩි සද්ද බද්ද නැති පුද්ගලයකු වුණත්, එතුමාගෙන් ඉටුවිය යුතු භාරදූර කාර්යයන් පිළිබඳව හොඳ අවබෝධයකින් හා වැටහීමකින් කටයුතු කළා. එතුමා අපි ඉතා ළඟින් ඇසුරු කළ කෙනෙක්. මේ අවස්ථාවේදී එතුමාගේ පවුලේ සියලු සාමාජිකයන්ටත්, ඥාති මිත්‍රාදීන්ටත් අපගේ ශෝකය පළ කරන අතර,  එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

ඊළඟට, ගරු පී.බී. දිසානායක හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාත් ගැනත් මම වචන කිහිපයක් කථා කරන්න ඕනෑ. එතුමා ළඟින් ඇසුරු කරන්න අපට එතරම් අවස්ථාවක් ලැබුණේ නැහැ.  හැබැයි, එතුමා ආණ්ඩුකාර ධුරය දරන කාලයේදී අපට එතුමා ආශ්‍රය-නිශ්‍රය කරන්න අවස්ථාව ලැබුණා. එදා රජරටට නායකත්වය ලබා දුන් ශ්‍රේෂ්ඨ නායකයකු විධියට අපි එතුමාට ගරු කරනවා. එතුමාටත් නිවන් සුව පතන ගමන්ම, එතුමාගේ පවුලේ සියලුදෙනාටත් අපගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

ඊළඟට, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා ගැන කිව්වොත්, එතුමා වෘත්තියෙන් නීතිඥවරයකු බවත්, දොඩම්ගස්ලන්ද ආසනය පළමු වතාවට වමේ දේශපාලන නායකයකු විධියට ජයග්‍රහණය කළ නායකයා බවත්, අද එතුමා පිළිබඳව දැන හැඳුනුම්කම් ඇති බොහෝ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු, ඇමතිවරු මේ සභාවේදී ඉදිරිපත් කළ කරුණු අනුව අපට දැනගන්න ලැබුණා. එතුමාත්, එතුමාගේ බිරිඳත් දොඩම්ගස්ලන්ද ආසනයට කාලයක් නායකත්වය ලබා දී තිබෙනවා. ආර්.ආර්. රාජපක්ෂ මැතිතුමා වෘත්තීමය වශයෙන් වයඹ පළාතට විශාල සේවාවක් කළ නායකයෙක  බව සියලුදෙනා පිළිගන්නවා. මේ අවස්ථාවේදී එතුමාටත් අපි නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

ගරු ආනන්ද රත්නායක හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා ගැනත් මම විශේෂයෙන් කථා කරන්න ඕනෑ. එතුමා ගැන අපි බොහෝ කරුණු දැනගත්තා, අද මේ පාර්ලිමේන්තු සභාවේදී. හිටපු

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, කරුණු දත් බොහෝ මැති ඇමතිවරුනුත් අද මේ සභාවේදී එතුමා පිළිබඳව බොහෝ කරුණු ඉදිරිපත් කළා. අපට එතුමා ආශ්‍රය කරන්න අවස්ථාවක් ලැබී නැහැ. නමුත්, එතුමා කළ සේවය කුමක්ද යන්න පිළිබඳව කෙටියෙන් හෝ අද දිනයේදී මේ ගරු සභාවේදී සිහිපත් කිරීම එතුමාට කරන ලොකු ගෞරවයක් විධියට අපි දකිනවා. එතුමාගේ වියෝව පිළිබඳව එම පවුලේ සියලුදෙනාටත් මේ අවස්ථාවේදී අපගේ ශෝකය ප්‍රකාශ කරන ගමන්ම, එතුමාටත් නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

මේ ගරු මන්ත්‍රීතුමන්ලා පස්දෙනා පිළිබඳව අද බොහෝ මැති ඇමතිවරු ඉදිරිපත් කළ අදහස්වලදී අපට අසන්න ලැබුණා, එතුමන්ලා මේ පාර්ලිමේන්තුවේ සේවය කළ කාලයේදී එතුමන්ලාගේ කැපවීම සහ අවංකකම අදට වඩා ඉතා උත්කෘෂ්ට මට්ටමින් එදා පැවතුණා කියලා. එයින් වක්‍රාකාර ලෙස නොකියා කියන්නේ එතුමන්ලා මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ යුගයේ මහජන නියෝජිතයන් විධියට හොරකම් නොකර, වංචා නොකර, දාමරිකකම් නොකර, අල්ලස් කොමිස් නොගෙන, ඉතාම පිරිසිදු දේශපාලන නායකයන් විධියට කටයුතු කළාය කියන කාරණයයි. අද දිනයේදී කථා කළ සෑම කථික මන්ත්‍රීවරයකු ම, අමාත්‍යවරයකු ම ඒ ගැන කියනවා අපි අසා සිටියා.

එහෙම නම් එයින් කියැවුණේ, මේ ශෝක ප්‍රකාශ යෝජනා තුළින් ශෝකය ප්‍රකාශ කිරීමක් පමණක් කරලා නිකම්ම නිකම් නතර නොවී එතුමන්ලාගේ ජීවිතවලින් උකහා ගත යුතු පාඩම් රාශියක් වර්තමානයේ මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට තිබෙනවා කියන පණිවුඩයයි. ඒ පණිවුඩය පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි වැදගත් වන්නේ. එතුමන්ලා ළඟ තිබුණු ඒ ගුණාංග සමුපකාර සමිතියේ, ප්‍රාදේශීය සභාවේ ඉඳන් ජාතික දේශපාලනයේ උච්ච ස්ථානය -මුල් තැන- වන මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයන් දක්වා සියලුදෙනා ළඟ තිබිය යුතුය කියන මතය අද මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් වෙතින්ම කියැවුණා. ඒ නිසා එය එසේ වේවි කියා අපි බලාපොරොත්තු වෙනවා. එසේ වේවා කියාත් අපි ප්‍රාර්ථනා කරනවා. අද දින අප සිහිපත් කරන ඒ ගරු මන්ත්‍රීතුමන්ලා පස් දෙනා මේ රටට, ජාතියට, ආගමට, සමාජයට අවංකව සහ නිර්මලව සිදු කරපු සේවාවන් ගැන හිතලා වර්තමාන දේශපාලනඥයන්ගේ වගකීමත් ඒකමයි කියන කාරණය අවබෝධ කරගෙන කටයුතු කරන දේශපාලන සංස්කෘතියක් මේ රට තුළ නිර්මාණය කිරීමේ අවශ්‍යතාව ඒ පණිවුඩවලින් කියැවුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි නිර්මල, දූෂණයෙන් තොර, දේශපාලන සංස්කෘතියක් අනාගතයේ අපේ රට තුළ නිර්මාණය කරන්න අප කාටත් හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරන ගමන්, ඒ ගරු මන්ත්‍රීතුමන්ලා පස්දෙනාටම මා නැවත වතාවක් නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 1.55]

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටට විශාල සේවාවක් සිදු කළ, තම ප්‍රදේශවල ජනතාවට විශාල සේවාවක් සිදු කළ ගරු මන්ත්‍රීවරුන් පස් දෙනෙකුගේ අභාවයන් පිළිබඳව අපගේ ශෝකය ප්‍රකාශ කරන වෙලාව, මේක. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමාගේත්, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාගේත්, සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමාගේත්, පී.බී. දිසානායක මන්ත්‍රීතුමාගේ සහ හිටපු නියෝජ්‍ය ඇමති එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේත් අභාවය සම්බන්ධයෙන් එතුමන්ලාගේ පවුල්වල සියලුදෙනාට පළමුව මාගේ සංවේගය ප්‍රකාශ කරන ගමන්, අප අදහන ආගම අනුව එම මන්ත්‍රීතුමන්ලාට උතුම් නිවන් සුවය ද ප්‍රාර්ථනා කරනවා.

එතුමන්ලා අතරින් මා ළඟින්ම සම්බන්ධ වී සිටි කෙනෙකු තමයි කොළඹ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට කටයුතු කරපු ගරු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා. දේශපාලනඥයෙකු වාගේම වෘත්තීය සමිති නායකයෙකු විධියට අපි එතුමා හඳුනා ගත්තා. මමත් වෘත්තීය සමිතිවලට සම්බන්ධව කටයුතු කරන කෙනෙක්. විවිධ වෘත්තීය සමිති කටයුතුවලදී එතුමාත් අපිත් නිරන්තරයෙන් මුණ ගැහිලා කටයුතු කර තිබෙනවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කටයුතුවලදී වාගේම, අප එවකට සිටි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහ පක්ෂ සන්ධානයේ කටයුතුවලදීත්, තවත් විවිධ අවස්ථාවලදීත් එතුමා අප සමඟ ළඟින් කටයුතු කළා. විශේෂයෙන් අපේ ආසනය වන කඩුවෙල ආසනය සමඟ එක් වෙලා කඩුවෙල ප්‍රාදේශීය සභාවෙන් දේශපාලන ගමන් මග ආරම්භ කරපු කෙනෙකු වූ එතුමාට අපගේ ලොකු සම්බන්ධයක් තිබුණා. ඒ නිසාම එතුමා පිළිබඳ සෑහෙන තොරතුරු අපි දන්නවා.

එතුමා මේ රටේ ජනතාව වෙනුවෙන්, විශේෂයෙන් වැඩ කරන ජනතාව වෙනුවෙන් විශාල කැප කිරීමක් කරපු ඉතා ඉහළ පෞරුෂයක් තිබුණු කෙනෙක්. යම් තැනකට ගිහිල්ලා කථාවක් කරද්දී mike එකක් නැතත් සිය ගණනක් නිශ්ශබ්ද කරගන්න පුළුවන් හඬ පෞරුෂයක් එතුමාට තිබුණා. ඒ වාගේම, තමා යම් මතයක් දැරුවා නම් ඒ මතය වෙනුවෙන් පෙනී සිටින්න එතුමා බය වුණේ නැහැ. විරුද්ධවාදීන්ගේ කොතරම් මත තිබුණා වුණත්, තමා නිවැරදි යැයි විශ්වාස කළ මතය සමඟ එතුමා කටයුතු කරපු ආකාරය මම දැක්කා.

එතුමා ප්‍රාදේශීය සභාවේ සිටියේ මා පාසැල් ගිය කාලයේයි. අපේ ප්‍රාදේශීය සභාව තුළ සමහර විට සභාපතිවරයා ගත් තීන්දු පවා විවේචනය කරමින්, ඒ ආයතනවල තිබුණු අඩු පාඩු පෙන්වා දෙමින්, පැවැති බලවේගවලට විරුද්ධ වෙමින් පවා එදා එතුමා කටයුතු කළා.

මහජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් කඩුවෙල ප්‍රාදේශීය සභාවට පත් වූ මුල් කාලයේ සිටම නිවැරදි දේ වෙනුවෙන් කථා කළ නිර්භීත, ඉතාම විශිෂ්ට ගණයේ නායකයකු විධියටයි අප එතුමාව දැක්කේ. එතුමාගේ දේශපාලනය ආරම්භ වන්නේත් වාමාංශික ව්‍යාපාරය තුළයි. වාමාංශික දේශපාලනය තුළ එතුමා දීර්ඝ කාලයක් විවිධ තනතුරු දරමින් කටයුතු කළා. එතුමා ප්‍රාදේශීය සභාවෙන් දේශපාලනය ආරම්භ කරලා, ඉන් පස්සේ ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් පත් වෙලා ඇවිත් පාර්ලිමේන්තුවේ කටයුතු කළා. ඒ වාගේම, ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කළ එතුමා වෘත්තීය සමිති තනතුරු ඇතුළු තවත් තනතුරු රාශියක් දැරුවා. ඒ හැම තනතුරක්ම දැරුවත් එතුමා තුළ නිහතමානිකම තිබුණා. එතුමා හැමෝටම බොහෝ වෙලාවට සහෝදරයකු වුණා. වයස අඩු වැඩි කියලා භේදයක් එතුමාට තිබුණේ නැහැ. එතුමා අඩු වයසේ කෙනෙකුටත් සහෝදරයෙක් වුණා; වැඩි වයසේ කෙනෙකුටත් සහෝදරයෙක් වුණා. එතුමා තුළ හැම කෙනෙකු කෙරෙහිම සහෘදත්වය, මිත්‍රත්වය තිබුණා.

තමාගේ වැඩ පිළිවෙළ තුළ තමා පෙනී සිටි කණ්ඩායමට යම් අසාධාරණයක් වුණා නම්, එය නිවැරදි කරන්න එතුමා පැකිළුණේ නැහැ. ඒ නිසා තමයි එතුමා පසුගිය කාලයේ යම් යම් තීන්දු ගෙන කටයුතු කළේ. කෙසේ වෙතත්, එතුමා ගත් ඒ ක්‍රියාමාර්ග තුළින්

අපේක්ෂා කළ සියල්ල සාක්ෂාත් කරගන්න එතුමාට බැරි වුණා. අවසානයේ, හදිසියේ රෝගාතුර වීම නිසා තම සියලු බලාපොරොත්තු ඉෂ්ට කරගන්න එතුමාට බැරි වෙන්න ඇති. නමුත් එතුමාට පුළුවන් කාලයේ එතුමා බොහෝ දේ කර තිබෙන බව අපි දැක්කා. දේශපාලනයට අවශ්‍ය එතුමා වැනි වැදගත් මහත්වරුන් අහිමි වීම මේ සමාජයට පාඩුවක්. එවැනි ක්‍රියාකාරිත්වයක්, කැප වීමක් තිබුණු එතුමා අහිමි වීම අපේ කඩුවෙල ආසනයට විශාල පාඩුවක් වුණා. මොකද, එතුමාගේ නායකත්වය මහජන එක්සත් පෙරමුණට විතරක් නොවෙයි, වාමාංශික ව්‍යාපාරයේ සිටි අප හැම කෙනකුටම ශක්තියක් වුණා. එතුමාගෙන් ඉගෙන ගන්න, දැන ගන්න බොහෝ කරුණු තිබුණා. එතුමාගේ ඒ දැක්ම, කැප වීම එතුමාට ගෞරවයක් වශයෙන් අපි මේ වෙලාවේ මතක් කරනවා. අපේ පළාතට හිටපු හොඳ දේශපාලනඥයකු, රටට හිටපු හොඳ දේශපාලනඥයකු, හොඳ වෘත්තීය සගයකු අහිමි වීම ගැන අප බෙහෙවින් කනගාටු වන අතරම, එතුමාගේ දරුවන් ඇතුළු පවුලේ සාමාජිකයන්ට අපගේ සංවේගය, ශෝකය පළ කරනවා.

අපේ ගරු සාරතී දුෂ්මන්ත මන්ත්‍රීතුමාගේ පියාණන් වන ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාත් අප කවුරුත් දන්නා කෙනෙක්. එතුමාත් මේ සමාජයට විශාල සේවයක් කළා.

මීට පෙර ගුණ කථන කළ හැමදෙනාම එතුමන්ලාගේ ගුණ කිව්වා. එතුමන්ලා, මේ සමාජයට යමක් කළ, රට වෙනුවෙන් වැඩ කළ, මේ සමාජයේ සිටිය යුතු මහජන නියෝජිතයන් අතර විශිෂ්ට පිරිසක්. එතුමන්ලාගේ අභාවය අප හැමදෙනාටම, රටටම පාඩුවක්. නමුත්, බෞද්ධයන් විධියට අපි දන්නවා, අවසානයේදී අපට ගෙන යන්න සිද්ධ වන්නේ අප කරන කුසල් හැර වෙනත් දෙයක් නොවන බව. එතුමන්ලා සමාජය තුළ, ආගමික පසු බිම තුළ කළ කාර්ය භාරයන් එක්ක තමන්ට අවශ්‍ය පමණට කුසල් එකතු කර ගන්න ඇති කියලා මා හිතනවා.

එතුමන්ලා සමාජයට කළ කැප වීම අගයන මේ වෙලාවේ මා විශේෂයෙන්ම මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. මේ සමාජය තුළ වඩා යහපත්ව, හොඳින් සිටියොත් දෙවියොත් ඒ කෙනාගේ නමට වඳිනවා කියන අදහස සහිත කියමනක් තිබෙනවා. එහෙම නොවුණොත්, සමාජයෙන් ගල් මුල් විතරක් නොවෙයි, විවිධ අපහාස එල්ල වෙනවා, අවලාද පවා නැඟෙනවා. නමුත් එතුමන්ලාට මේ සමාජය තුළ මහත් ගෞරවයක්, පිළිගැනීමක් තිබුණා කියන කාරණාව මා මතක් කරනවා.

මා ළඟින් ආශ්‍රය කළේ නැතත්, අප අද දිනයේ සිහිපත් කරන අනෙක් මහජන නියෝජිතයන් වන අභාවප්‍රාප්ත ගරු ආනන්ද රත්නායක මැතිතුමාත්, ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාත්, ගරු පී.බී. දිසානායක මැතිතුමාත් මා මේ අවස්ථාවේදී ගෞරවයෙන් සිහිපත් කරනවා. එතුමන්ලා සියලුදෙනා මා පාර්ලිමේන්තුවේ සිටින කාලයේ හිටපු අය නොවෙයි. එතුමන්ලා දීර්ඝ කාලයක් පාර්ලිමේන්තුවේ හිටපු, අපට වඩා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු. ඒ සියලු දෙනාට අපගේ ප්‍රණාමය පිරිනමමින්, එතුමන්ලාගේ පවුල්වල සාමාජිකයන්ට අපගේ ශෝකය ප්‍රකාශ කරමින්, ඒ ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාට අමා මහ නිවන් සුව ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ජයරත්න හේරත් මන්ත්‍රීතුමා.

[අ.භා. 2.01]

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප සමඟ මේ පාර්ලිමේන්තුවේ සැලකිය යුතු කාලයක් කටයුතු කළ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා හතරදෙනෙකුගේ අභාවයන් සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීවරයකු වශයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ දොඩම්ගස්ලන්ද ආසනයේ කටයුතු කළ නීතිඥ ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාගේ අභාවය පිළිබඳව අද මේ සභාවේ ශෝක යෝජනා ඉදිරිපත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මම කථා කරන්න බලාපොරොත්තු වෙනවා පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කළ ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමා ගැන. එතුමා අපේ ඉතාම කිට්ටුවන්ත මිත්‍රයෙකු ලෙස අපිත් එක්ක සැලකිය යුතු කාලයක් මේ පාර්ලිමේන්තුවේ කටයුතු කළා. එතුමා තම වගකීම, එහෙම නැත්නම් භූමිකාව මැනවින් ඉටු කළ බව එතුමාට ගෞරවයක් විධියට මේ සභාවේදී මා ප්‍රකාශ කරන්න කැමැතියි. එතුමා කොයිම අවස්ථාවකවත් මුදලට, වෙනත් බල පුළුවන්කාරකම්වලට තමන්ගේ මතය යටපත් කරන්න කැමැති වුණේ නැහැ. එතුමා බොහොම වගකීමෙන් කටයුතු කළා.

ඊළඟට, සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා ගැන කියනවා නම්, එතුමා වෘත්තීය සමිති නායකයකු විධියට අපට මුණ ගැහෙනවා. පසු කාලීනව එතුමා අපිත් එක්ක පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. එතුමා එවකට තිබුණු රජයන්වලට එරෙහිව වමේ දේශපාලනය පෙළ ගස්සපු ඉතාම වැදගත් වෘත්තීය සමිති නායකයෙක්. එතුමා පාර්ලිමේන්තුවේ කටයුතු කරපු කාලයේ අපිත් එක්ක බොහොම මිත්‍රශීලීව කටයුතු කළා. හැම වෙලාවකම එතුමා අපිත් සමඟ බොහොම කිට්ටුවෙන් ඇසුරු කළා, දේශපාලන කටයුතුවලදී අපිත් එක්ක ළඟින් හිටියා. ඒ නිසා එතුමා ගැන, එතුමාගේ වැඩ කටයුතු පිළිබඳව අපට හොඳ අවබෝධයක් තිබුණා.

ගරු පී.බී. දිසානායක මැතිතුමා ගැනත් මම වචන කිහිපයක් කියන්න ඕනෑ. එතුමා මුලින්ම ගුරු වෘත්තිය තෝරා ගත්තා. ඊට පස්සේ එතුමා අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පිවිසිලා අපිත් එක්ක පාර්ලිමේන්තුවේ ටික කාලයක් ඉඳලා, පසු කාලීනව උතුරු මැද පළාතේ ආණ්ඩුකාරවරයා බවට පත්වුණා. ඒ කාල පරිච්ඡේදය තුළ එතුමා සමාජයට සැලකිය යුතු වැඩ කොටසක් ඉෂ්ට කළා.

ඊළඟට මම කැමතියි, මගේ හොඳ මිත්‍රයකු වශයෙන් සිටි එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා ගැන කථා කරන්න. එතුමා වෘත්තීයෙන් නීතිඥවරයෙක්. එතුමා අපට පාර්ලිමේන්තුවේදී මුණ ගැහෙනවා. එතුමාත් මමත් එක කාල සීමාවක නියෝජ්‍ය අමාත්‍යවරුන් විධියට කටයුතු කර තිබෙනවා. එතුමා හිත හොඳ ළෙන්ගතු මිත්‍රයකු විතරක් නොවෙයි, ශීලාචාර දේශපාලනඥයෙක් කියන එකත් මම මේ අවස්ථාවේදී එතුමාට ගෞරවයක් විධියට මතක් කරන්න ඕනෑ. කෑගල්ල දිස්ත්‍රික්කය වැනි කඳුකර ප්‍රදේශයක් නියෝජනය කරමින්, එම ග්‍රාමීය ජනතාවගේ හඬ මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, එතුමාගේ ධුර කාල සීමාව තුළ බොහොම වගකීමෙන් එතුමා කටයුතු කළා. එතුමා මිය ගියත්, එතුමාගේ පුත්‍ර රත්නය වන සාරතී දුෂ්මන්ත මන්ත්‍රීතුමා තම පියා අනුගමනය කරමින්, ඔහුගේ දේශපාලන වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යමින් අද ඒ වගකීම් සියල්ල දරමින් කටයුතු කරනවා. එතුමා නැවතත් ප්‍රදේශයේ ජනතාව ශක්තිමත් කරමින්, අද ශක්තිමත් දේශපාලන ගමනක් යනවාය කියන එකත් මම සතුටින් මතක් කරන්න ඕනෑ.

[ගරු ජයරත්න හේරත් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නියෝජනය කරන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු ශ්‍රේෂ්ඨතම නායිකාව වන සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය තමයි අපව දේශපාලනයට ප්‍රවේශ කළේ. එතුමිය තමයි අපට එන්න කියලා, වගකීම් පවරලා දේශපාලන ව්‍යාපාරයේ අත්පොත තියවන්න අවශ්‍ය ප්‍රවේශය, ගමන් මඟ එළිපෙහෙළි කරලා දුන්නේ. ඒ ශ්‍රේෂ්ඨ නායිකාව ගැන අද මේ සභාවේ මතක් නොකොළොත් මම වගකීම් පැහැර හැරියා වෙනවා. කට පුරා මගේ ගෞරවය මේ අවස්ථාවේදී එතුමියට පිරිනමනවා.

අපි දේශපාලනයට ප්‍රවිෂ්ට වුණු මුල් අවධිය මට මතකයි. අපේ තරුණ වයසේ දී, එහෙම නැත්නම් දේශපාලනයට එන්න තරම් මෝරපු වයසකදී නොවෙයි අපි දේශපාලනයට ප්‍රවිෂ්ට වුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ නීතිඥතුමා, අපි දේශපාලන ක්ෂේත්‍රයට එකතු වුණු ඒ කාලයේ සිටි ඉතාම නිහතමානී පුද්ගලයෙක්. අපිට ඒ කාලයේ රාජ්‍ය බලය තිබුණේ නැහැ. බොහොම දුෂ්කර, බොහොම කටුක, බොහොම බරපතළ හිංසනයන් මැද්දේ තමයි අපේ දේශපාලන ගමන ආරම්භ වුණේ. ඒ වකවානුව තුළ කුරුණෑගල අධිකරණ කලාපයේ සිටි සාර්ථක නීතිඥවරයෙකු විධියට ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා හඳුන්වන්න පුළුවන්. එතුමා අපේ මූලික රැස්වීම්වලට ආවා ගියා, අපිට අවශ්‍ය උපදෙස් දුන්නා.

1924 දෙසැම්බර් මස 27වැනි දා දොඩම්ගස්ලන්ද ආසනයේ නාරම්මලදී තමයි එතුමා මෙලොව එළිය දකින්නේ. එතුමාගේ පියා අප්පුවා දේවගේ රාජපක්ෂ මහත්මයා. ඔහු සැලකිය යුතු වත්කමක් තිබුණු ඉඩම් හිමි වැවිලිකරුවෙක්. එතුමාගේ මව සව්සිරි දේවගේ රාජපක්ෂ මහත්මිය. එතුමිය දොඩම්ගස්ලන්ද ප්‍රදේශයේ සිටි සමාජ ක්‍රියාකාරිනියක්. ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා නාලන්ද විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා, 1946 දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීති උපාධිය හැදෑරුවා. එතුමා නීතිඥවරයකු විධියට මේ සමාජයට ප්‍රවිෂ්ට වුණාට පස්සේ හා හා පුරා කියලා දේශපාලනයට එකතු වන්නේ ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයෙන් දේශපාලනයට ඇවිල්ලා, 1955 ඉඳලා 1961 වෙනතුරු එතුමා ගම් සභාපතිවරයකු විධියට දොඩම්ගස්ලන්ද ප්‍රදේශයේ කටයුතු කළා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වය යටතේ, 1965දී හා හා පුරා කියලා එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් දොඩම්ගස්ලන්ද මැතිවරණ කොට්ඨාසයට තරග කළා. දොඩම්ගස්ලන්ද මැතිවරණ කොට්ඨාසය කියන්නේ, එවකට ලංකාවේ හිටපු ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා නියෝජනය කළ මැතිවරණ කොට්ඨාසය. මේක ඉතාම සුවිශේෂී මැතිවරණ කොට්ඨාසයක්. ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා නියෝජනය කළ දොඩම්ගස්ලන්ද මැතිවරණ කොට්ඨාසයට, ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයෙන් දේශපාලනය ආරම්භ කළ ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ නීතිඥතුමා 1965දී මැතිවරණයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරග කළා. එදා එතුමාත් එක්ක එක්සත් ජාතික පක්ෂයෙන් තරග කළේ ඒ.යූ. රොමානිස් කියලා මහත්මයෙක්. ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා ඡන්ද 13,426ක් ගන්නකොට, රොමානිස් මහත්මයා ගත්තේ ඡන්ද 12,372යි. ඡන්ද 1,054කින් ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා ලංකා ඉතිහාසයේ පළමුවැනි වරට දොඩම්ගස්ලන්ද මැතිවරණ කොට්ඨාසයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තේරී පත් වූ ප්‍රථම මන්ත්‍රීවරයා බවට පත් වුණා. හැබැයි, එතුමාට වැඩි කාලයක් මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. මම දන්නා විධියට, ඒ වෙලාවේ එක්සත් ජාතික පක්ෂය ඩඩ්ලි සේනානායක ශ්‍රීමතාණන්ගේ නායකත්වය යටතේ තිබුණේ. ඒක ඉතා ප්‍රබල රජයක්; ආණ්ඩුවක්. ඒ වැඩ පිළිවෙළ තුළ ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාට මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් වුණා. එම මැතිවරණ පෙත්සම නිසා එතුමාට දොඩම්ගස්ලන්ද මැතිවරණ කොට්ඨාසය අහිමි වෙනවා. හැබැයි, දොඩම්ගස්ලන්ද මැතිවරණ බලප්‍රදේශයේ බහුතරයක් ජනතාවගේ ඒකායන ඉල්ලීම වුණේ, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාගේ ආදරණීය බිරිඳ වන ලැටීෂියා රාජපක්ෂ මැතිනිය මැතිවරණයට ඉදිරිපත් කරන්නය කියන එකයි. එම මැතිවරණයේ දී එතුමියගේ ප්‍රතිමල්ලවයා විධියට ඉදිරිපත් වන්නේ, අද සමගි ජන බලවේගය නියෝජනය කරන අපේ ජේ.සී. අලවතුවල මැතිතුමාගේ පියා වන එස්.ඩබ්ලිව්. අලවතුවල මැතිතුමා. එතුමා තමයි ලැටීෂියා රාජපක්ෂ මැතිනියත් එක්ක තරග කරන්නේ. එම මැතිවරණය 1967 ජූලි මාසේ 15 වැනිදා පැවැත්වුණා. එම මැතිවරණයෙන් ලැටීෂියා රාජපක්ෂ මැතිනිය ඡන්ද 14,164ක් ලබා ගත්තා, එස්.ඩබ්ලිව්. අලවතුවල මැතිතුමා ඡන්ද 13,771ක් ගත්තා. වැඩි ඡන්ද 393කින් ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාගේ ආදරණීය බිරිඳ වන ලැටීෂියා රාජපක්ෂ මැතිනිය දොඩම්ගස්ලන්ද මැතිවරණ කොට්ඨාසයේ දෙවැනි වරටත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් පත් වූ මන්ත්‍රීවරිය ලෙස පත් වුණා. මේක තමයි, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාගේ ජීවිත කථාව, එහෙම නැත්නම් දේශපාලන කථාව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රාජපක්ෂ මැතිතුමා කුරුණෑගල අධිකරණ කලාපය තුළ වසර 50කට අධික කාලයක් නීතිඥ වෘත්තියේ කටයුතු කළා.

අද අපි ගුණ කථන කරන ගරු ආනන්ද රත්නායක මැතිතුමා, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා, ගරු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා, ගරු පී.බී. දිසානායක මැතිතුමා සහ ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා කියන සියලු දෙනාම සැබෑවටම මහත්වරුන් කියන එක මම බොහොම වගකීමෙන් සහ බොහොම සතුටින් ප්‍රකාශ කරන්න ඕනෑ. දේශපාලනඥයකු, එහෙම නැත්නම් මහජන නියෝජිතයෙකු සතුව තිබිය යුතු ගුණාංග සියල්ල ප්‍රගුණ කළ නායකයන් කිහිප දෙනෙකු තමයි අද අපි මේ උත්තරීතර සභාවේදී සිහිපත් කරන්නේ. එතුමන්ලා අල්ලස් ගන්න ගියේ නැහැ; රුපියල් -ශත පසුපස ඇවිද්දේ නැහැ; කොමිස් පසුපස ඇවිද්දේ නැහැ. එතුමන්ලා සැබෑ මහජන නියෝජිතයන් විධියට තමන්ගේ භූමිකාව සහ වගකීම ඉෂ්ට කළා. එතුමන්ලා මිය පරලොව ගියත් ඒ ඒ ප්‍රදේශවල ජනතාව බොහොම භක්තියෙන්, ගෞරවයෙන් ඒ නායකයින් ගැන සිහිපත් කරන්නේ, එතුමන්ලාගේ ධුර කාල සීමාව තුළ එතුමන්ලා මේ රටට, එතුමන්ලාගේ ප්‍රදේශවලට කළ කටයුතුවලදී ලබා දුන් උතුම් ආදර්ශය නිසාය කියන එක මම විශේෂයෙන් සිහිපත් කරන්න ඕනෑ. එතුමන්ලාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කරමින් කථා කරන මේ අවස්ථාවේ, දැනට පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයන් විධියට අපට එතුමන්ලාගෙන් ගන්නට තිබෙන උතුම්ම ආදර්ශය එයයි. අපි මහ ජනතාවගේ කැමැත්ත පිට මේ පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා ඇවිත් සිටින්නේ සීමිත කාලයකට. එසේ සීමිත කාලයකට අපට දීලා තිබෙන මේ ධුර කාලය තුළ බොහොම වගකීමෙන්, ශීලාචාරකමින්, මනුෂ්‍යත්වයෙන් පිරුණු මිනිසුන් විධියට කටයුතු කරන්න පුළුවන් නම්, එම වගකීම් දරන්න පුළුවන් නම්, ඒ නායකයන් වෙනුවෙන් අපට කරන්න පුළුවන් හොඳම දේ ඒකයි.

අවසාන වශයෙන්, අප සමඟ දීර්ඝ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කළ ආනන්ද රත්නායක, පී.බී. දිසානායක, එච්.ආර්. මිත්‍රපාල, සෝමවීර චන්ද්‍රසිරි කියන අපේ සහෘදයන් හතර දෙනාටත්, ඒ වාගේම අපට වඩා බොහොම ඉහළ ජ්‍යෙෂ්ඨත්වයක් තිබෙන ආර්.ආර්. ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාටත් නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ස්තුතියි.

[අ.භා. 2.15]

**ගරු අනුරාධ ජයරත්න මහතා (ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுராத ஜயரத்ன - கிராமிய வயல் நிலங்கள் மற்றும் அண்டியுள்ள குளங்கள், நீர்த்தேக்கங்கள் மற்றும் நீர்ப்பாசன அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne - State Minister of Tanks, Reservoirs and Irrigation Development Related to Rural Paddy Fields)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ ආනන්ද රත්නායක මැතිතුමා, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා, සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා, පී.බී. දිසානායක මැතිතුමා සහ එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා යන අයගේ අභාවය පිළිබඳව ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරලා අද අපි එතුමන්ලා ගැන කථා කරනවා. මුලින්ම, අපේ එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා පිළිබඳව කථා කරන්න මම කැමැතියි. එතුමා සමසමාජ පක්ෂයෙන් තමයි සිය දේශපාලන කටයුතු ආරම්භ කළේ. ඊට පසුව එතුමා දැරණියගල ආසනය නියෝජනය කරමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරයා ලෙස පත් වෙලා කෑගල්ල දිස්ත්‍රික්කය තුළ දැවැන්ත වැඩ කොටසක් ක්‍රියාත්මක කිරීමට නායකත්වය ලබා දුන්නා. වෘත්තියෙන් නීතිඥවරයෙක් වුණු එතුමා අවිස්සාවේල්ල අධිකරණයේ තමයි රාජකාරි කටයුතු කළේ. අධිකරණ කටයුත්තකදී යම් කෙනෙකුට යම් සහයෝගයක් අවශ්‍ය වුණා නම්, එම කටයුතුවලට නියමිත මිල-මුදල් කියන කාරණා පැත්තකට දමා ඒ අවශ්‍ය සහයෝගය ලබා දෙන්න මිත්‍රපාල මැතිතුමා හැම දාම කටයුතු කළා.

මම 2013 වර්ෂයේ පළාත් සභාව නියෝජනය කරලා 2015දී තමයි පාර්ලිමේන්තුවට ආවේ. ඒ නිසා දීර්ඝ කාලීනව එතුමාටත්, මටත් එකට දේශපාලනය කරන්න අවස්ථාව තිබුණේ නැහැ. හැබැයි, මගේ පියා වන දි.මු. ජයරත්න මැතිතුමා සමඟ එතුමා එක වේදිකාවේ දේශපාලන කටයුතු සිදු කළ බව මා දන්නවා. අපේ මහනුවර දිස්ත්‍රික්කය හා කෑගල්ල දිස්ත්‍රික්කය කියන්නේ එක ළඟ තිබෙන දිස්ත්‍රික්ක දෙකක්. මේ දිස්ත්‍රික්ක දෙකෙහි විවිධ වූ ජයග්‍රහණවලටත්, මේ රටේ ජනතාවගේ අවශ්‍යතා ජයග්‍රහණය කරවන්නත් එක වේදිකාවක ඉඳගෙන එකට එකතු වෙලා කටයුතු කරන්න එතුමන්ලා දෙදෙනාට පුළුවන්කම ලැබුණා. එතුමන්ලාගේ දේශපාලන ගමන තුළ එතුමන්ලා නියෝජනය කළ කඳවුරු තුළ කටයුතු කළ ආකාරය දිහා බලන කොට, එතුමන්ලා ඒ කරපු වැඩකටයුතු එක්ක සංසන්දනය කරද්දී තරුණ, නවක දේශපාලකයන් වන අපට එතුමන්ලාගෙන් ඉගෙන ගන්න බොහෝ කාරණා තිබෙන බව පෙනෙනවා.

අද මෙම පාර්ලිමේන්තුව නියෝජනය කරන ගරු මන්ත්‍රීවරු බොහෝදෙනෙක් එතුමන්ලා ගැන බොහෝ කරුණු කාරණා කිව්වා. එතුමන්ලාගේ අභාවය පිළිබඳව ඒ සියලු දෙනාගේ ශෝකය ප්‍රකාශ කළා. ඒ වාගේම ඒ ඒ කාල වකවානුවල එතුමන්ලා මේ රට වෙනුවෙන් කළ වැඩ කටයුතු පිළිබඳවත් අදහස් ඉදිරිපත් කළා. ඒ සියලු කාරණා දෙස බලනකොට එවැනි ශ්‍රේෂ්ඨ වැඩ කොටසක් කළ, සමාජ මෙහෙවරක් කළ පිරිසකගෙන් අපේ දේශපාලන ගමනට එකතු කරගත යුතු අත්දැකීම්, කරුණු කාරණා බොහොමයක් තිබෙනවා.

මිත්‍රපාල මැතිතුමා නියෝජනය කළ කෑගල්ල දිස්ත්‍රික්කයේ දැරණියගල ආසනය, අපි නියෝජනය කළ ආසන එක්ක ගත්තාම එක්තරා විධියක දුෂ්කර ආසනයක්. හැබැයි, ඒ දුෂ්කර ආසනයට අවශ්‍ය සංවර්ධන වැඩකටයුතු සියල්ල එතුමා ක්‍රියාත්මක කළා. එතුමා ඒ ප්‍රදේශයට මහා දැවැන්ත සේවාවක් ඉටු කරලා තිබෙනවා. එතුමාගේ ඒ වැඩකටයුතු ටික තවත් ශක්තිමත්ව ඉදිරියට ගෙන යන්න, ඒ ප්‍රදේශයේ, දිස්ත්‍රික්කයේ ජනතාවට ඒ වගකීම් ඉටු කරන්න අද ගරු දුෂ්මන්ත මිත්‍රපාල මන්ත්‍රීතුමා කටයුතු කරගෙන යනවා. අද මේ ගරු සභාවේ බොහෝදෙනෙක් ප්‍රකාශ කළ පරිදි, ඒ ශ්‍රේෂ්ඨ පියාගේ වැඩ කොටස කරගෙන ආවාටත් වැඩිය හොඳට ඉදිරියට කරගෙන යාමේ වගකීම ගරු මන්ත්‍රීතුමාට පැවරෙනවා කියන එකත් විශේෂයෙන් මම මතක් කරන්න ඕනෑ. මිත්‍රපාල මැතිතුමාගේ අභාවය වෙනුවෙන්, එතුමාගේ දයාබර බිරිඳ වන වසුන්දරා මිත්‍රපාල මැතිනියටත්, අපේ සහෝදර දුෂ්මන්ත මිත්‍රපාල මන්ත්‍රීතුමාටත්, ඒ අනෙක් දූ දරුවන්ටත් අපේ ශෝකය මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේදී අපි ගුණ ගායනා ඉදිරිපත් කළ, අප අතරින් වියෝ වූ ගරු ආනන්ද රත්නායක මැතිතුමාටත්, කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කළ ආර්.ආර්. ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාටත්, සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමාටත්, අනුරාධපුර බටහිර ආසනය නියෝජනය කළ පී.බී. දිසානායක මැතිතුමාටත්, මගේ පියාගේ සම කාලීන මිත්‍රයෙක් හැටියට එක දේශපාලන වේදිකාවේ කටයුතු කරලා මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කළ එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාටත් නිවන් සුව අත්වේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

බොහොම ස්තුතියි.

[අ.භා. 2.20]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ අපි හිටපු මන්ත්‍රීවරු පස්දෙනෙකුගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරනවා. එතුමන්ලා තමයි, ගරු ආනන්ද රත්නායක මැතිතුමා, ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා, ගරු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා, ගරු පී.බී. දිසානායක මැතිතුමා සහ ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා. මෙතුමන්ලා පස්දෙනාම වාමාංශික පදනමක් සහිත පක්ෂ දේශපාලනයෙන් තමයි දේශපාලනයට අවතීර්ණ වෙන්නේ. මිත්‍රපාල මැතිතුමා ලංකා සමසමාජ පක්ෂයෙන්, රාජපක්ෂ මැතිතුමා ලංකා කොමියුනිස්ට් පක්ෂයෙන්, සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා මහජන එක්සත් පෙරමුණෙන් තමයි දේශපාලනයට පිවිසෙන්නේ. ආනන්ද රත්නායක මැතිතුමා සහ පී.බී. දිසානායක මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වාමාංශික කඳවුර තමයි හැමදාම නියෝජනය කළේ. මන්ත්‍රීවරු හැටියට එතුමන්ලා අවංකව තමන්ගේ දේශපාලන කටයුතු කළා කියන කාරණයත්, පැහැදිලිවම එතුමන්ලා "ගරු" කියන වචනය පාවිච්චි කරන්න යෝග්‍යම මන්ත්‍රීවරු කියලාත් අද එතුමන්ලා පස්දෙනා ගැන කථා කළ හැම කෙනෙකුම වාගේ කිව්වේ, එතුමන්ලා වාමාංශික පදනමක් ඔස්සේ දේශපාලනය ආරම්භ කළ නිසා වෙන්න ඇති.

මුළු රටේම මිනිස්සු අද මේ 225දෙනාටම "මහත්හොරු" කියන කාලයක "මහත්වරු" කියලා එතුමන්ලා පස්දෙනාව හඳුන්වන්න පුළුවන් කියන කාරණය තමයි බොහෝදෙනා කිව්වේ. එතුමන්ලා අතුරින් මම ඉතාම ළඟින්ම ඇසුරු කළා, ආනන්ද රත්නායක මැතිතුමා. එතුමා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අපේ ආදරණීය හිටපු මන්ත්‍රීතුමා. අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිසංවිධාන කටයුතුවලට මාව දමලා තිබුණේ එතුමාගේ ආසනයට. මම එතුමාගේ නිවසට ගිය වෙලාවේ මට හිතුණා එතුමාගේ දේශපාලනයත්, අපේ දේශපාලනයත් බොහොම සමානයි කියලා. ආනන්ද රත්නායක මැතිතුමා බොහොම සරල ජීවිතයක් ගත කරපු, දේශපාලනය හරහා සල්ලි හම්බ නොකරපු, තමන්ට තිබුණු මුදලුත් දේශපාලනයට වියදම් කරපු ඉතාම සරල, ඒත් ජනතාව අතර හිටපු නායකයෙක්.

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

ඊට පස්සේ කාලයක එතුමායි, මමයි එකට පාර්ලිමේන්තුව නියෝජනය කරන කාලයේත් අපි විවිධ වැඩසටහන්වලට යනකොට ඒ දේශපාලන කටයුතු සම්බන්ධීකරණය කරන්න එතුමාගේ ආසනය තමයි මට බොහෝවිට හම්බ වුණේ. වර්තමාන මැතිවරණ ක්‍රමය තුළ තිබෙන මනාප ඡන්ද ක්‍රමය නොතිබුණා නම්, එතුමාට ඊට පස්සේත් පාර්ලිමේන්තුව නියෝජනය කරන්න තිබුණා. නමුත් මනාප ඡන්ද ක්‍රමය තුළ ඒ දිස්ත්‍රික්කයෙන් එහෙම ගොඩ වෙන එක ලේසි නැහැ. නමුත් ආසන මට්ටමින්ත්තා නම්, හැම දාමත් ඒ ආසනය නියෝජනය කරන මන්ත්‍රීතුමා එතුමා තමයි. ඒ නිසා ආනන්ද රත්නායක මන්ත්‍රීතුමාටත්, ඒ පවුලේ උදවියටත් මේ වෙලාවේ මගේ ශෝකය ප්‍රකාශ කරනවා.

ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මන්ත්‍රීතුමා මම පෞද්ගලිකව දන්නේ හඳුනන්නේ නැති වුණාට, සර් ජොන් කොතලාවල කිව්වාම අපට මතක් වෙන්නේ, ලංකාවේ දක්ෂිණාංශික දේශපාලනය තුළ පතාක යෝධයෙක්. ඒ කොතලාවල පරම්පරාව ආධිපත්‍යය පතුරුවපු, ජයග්‍රහණය කරපු දොඩම්ගස්ලන්ද මැතිවරණ කොට්ඨාසයෙන් කොමියුනිස්ට් පක්ෂයෙන් දේශපාලනයට ආපු කෙනෙකු ජයග්‍රහණය කරනවා නම්, සැබැවින්ම ඔහු ජනතාවට හිතවාදී කෙනෙක් විය යුතුමයි. ඒ නිසා අපේ කඳවුර නියෝජනය කරපු, සැබෑම මානව හිතවාදියෙක් වෙච්ච ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාගේ පවුලේ උදවියටත් මේ වෙලාවේ මගේ ශෝකය ප්‍රකාශ කරනවා.

අද සෝමවීර චන්ද්‍රසිරි මන්ත්‍රීතුමාගේ අභාවය වෙනුවෙනුත් ශෝකය ප්‍රකාශ කරනවා. මාගේ පියාත් වාමාංශික දේශපාලනය කරපු කෙනෙක්. මගේ පියාත් වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ හිටපු කෙනෙක්. සෝමවීර චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා මහජන එක්සත් පෙරමුණේ වුණාට, මාගේ තාත්තත් එක්ක වෘත්තීය සමිති ව්‍යාපාරවල කටයුතු කරපු නිසා බොහෝ වෙලාවට එතුමා මට හම්බ වෙලා තිබෙනවා. පසු කාලයක එතුමා පාර්ලිමේන්තුවට ආවා. අපිත් එතුමා ළඟින් ආශ්‍රය කළා. ආණ්ඩු බලය තිබුණත්, විශේෂයෙන්ම ආණ්ඩු බලය නැති වෙලාවලත් වෘත්තීය සමිති ව්‍යාපාරයත් එක්ක පාරට බැහැලා ඒ ප්‍රගතිශීලී කඳවුරු වෙනුවෙන් මුළු ජීවිතයම කැප කරපු නායකයෙක් තමයි සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු තිබුණු කාලවල එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට විරුද්ධව යම් උද්ඝෝෂණයක් කෙරුණා නම්, යම් අරගළයක් කෙරුණා නම්, ඒ හැම අරගළයකම ඉස්සරහින්ම හිටපු නායකයෙක් තමයි සෝමවීර චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා. අපි පොඩි කාලයේ අපේ තාත්තලාත් එක්ක ඒ වැඩ කටයුතුවලට සම්බන්ධ වෙච්ච එතුමා අපි දේශපාලනයට ආවාට පස්සේ අපිත් එක්කත් ඒ විධියටම දේශපාලන කටයුතුවල නියැළුණා. එතුමා මිය යනතෙක්ම එතුමාගේ ප්‍රතිපත්තිත් එක්ක හිටපු ආදරණීය නායකයෙක්. ඒ හින්දා ගරු සෝමවීර චන්ද්‍රසිරි මන්ත්‍රීතුමාගේ පවුලේ උදවියටත් මගේ ශෝකය මේ වෙලාවේ ප්‍රකාශ කරන්න ඕනෑ.

පී.බී. දිසානායක මන්ත්‍රීතුමා මට හමු වන්නේත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිසංවිධාන කටයුතුවලට මා එතුමාගේ කොට්ඨාසයට යවපු වෙලාවේ. එතුමාගේ කොට්ඨාසයට ගිහිල්ලා දවස් දෙකක් ඒ කොට්ඨාසයේ පදිංචි වෙලා ඉඳගෙන කටයුතු කරන්න අපට සිද්ධ වුණා. එතුමාගේ නිවසත්, අපේ නිවසත් බොහොම සමානයි කියලා මට හිතුණා. අර මන්ත්‍රීතුමා කිව්වා වාගේ බොහොම සරල, ඕනෑම කෙනෙකුට ඕනෑම වෙලාවක ඇවිල්ලා එතුමා හම්බ වෙන්න පුළුවන්, ජනතාවට අයිති නිවසක් හැටියට තමයි ඒ නිවස පාවිච්චි වුණේ. මම එතුමා මුලින්ම හඳුනා ගත්තේ ඒ ප්‍රතිසංවිධාන කටයුතුවලට ගිහිල්ලායි. ඊට පස්සේ පාර්ලිමේන්තුවේදී අපට එතුමා බොහොම ළඟින් ඇසුරු කරන්න හැකියාව ලැබුණා. මනාප ඡන්ද ක්‍රමය තිබුණේ නැත්නම්, ජනතාවගේ නියෝජිතයකු හැටියට එතුමාටත් පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථා තිබුණා. කෙසේ වෙතත්, එතුමා උතුරුමැද පළාතේ ආණ්ඩුකාරවරයා හැටියට පත්වීම උතුරු මැද පළාත් ජනතාවගේ ලොකු ජයග්‍රහණයක්. එතුමා රජරට ජනතාව වෙනුවෙන් සුවිශාල වූ මෙහෙයක් කරපු ආදර්ශවත් නායකයෙක්. එතුමාගේ පවුලේ උදවියටත් මේ වෙලාවේ මාගේ ශෝකය ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා මට සම්බන්ධ වන්නේ, 1988 පළාත් සභා මැතිවරණය ජයගහණය කිරීමෙන් පස්සේ. 1988 පළාත් සභා මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පළාත් සභා ඡන්දය වර්ජනය කරනවා. ලක්ෂ්මන් කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමා එහෙම ඒ දවස්වල හිටියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මැතිවරණය වර්ජනය කරනවාත් එක්කම එක්සත් ජාතික පක්ෂය තරගයක් නැතුව පළාත් සභා මැතිවරණය ජයග්‍රහණය කරන මට්ටමක් තමයි තිබුණේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! Will an Hon. Member propose the Hon. (Dr.) Suren Raghavan to the Chair?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (කම්කරු අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - தொழில் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Labour)

Sir, I propose that the Hon. (Dr.) Suren Raghavan do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. SHANTHA BANDARA *left the Chair, and* THE HON. (DR.) SUREN RAGHAVAN *took the Chair.*

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ සිටින වෙලාවේ එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා ගැන කථා කරන්න ලැබුණු එක හොඳයි.

අපේ මියගිය විජය කුමාරණතුංග මැතිතුමා එක්සත් සමාජවාදී පෙරමුණ නිර්මාණය කළා. එතුමා ඒ පෙරමුණ හැදුවාට 1988 පළාත් සභා මැතිවරණයට නායකත්වය දෙන්න බැරි වුණා. ඒකට නායකත්වය දුන්නේ චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය. ඒ එක්සත් සමාජවාදී පෙරමුණ තමයි 1988දී පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වුණේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඒ මැතිවරණය වර්ජනය කළ නිසා. 1988දී කෑගල්ල දිස්ත්‍රික්කයෙන් එච්.ආර්. මිත්‍රපාල මහත්මයා පළාත් සභාවට එනකොට මම බදුල්ල දිස්ත්‍රික්කයෙන් පළාත් සභාවට ආවා. මිත්‍රපාල මහත්මයාත් සබරගමුව පළාත් සභාවේ විපක්ෂ නායක වෙලා පසුව පාර්ලිමේන්තුවට ආවා. මම පසු කාලයක ඌව පළාත් සභාවේ විපක්ෂ නායක වෙලා ඊට පස්සේ පාර්ලිමේන්තුවට ආවා. ලංකා සමසමාජ පක්ෂයෙන් දේශපාලනය ආරම්භ කරලා, එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට

ආවා. ලංකා සමසමාජ පක්ෂයේ ඉඳගෙන මනාප ඡන්ද ක්‍රමයකදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ පෙරමුණකින් තරග කරලා ජයග්‍රහණය කරන එක ලේසි නැහැ. මොකද, මනාප ඡන්ද ක්‍රමය තුළ බොහෝ විට මහා පක්ෂ නියෝජනය කරන අයට තමයි වැඩිපුර ඡන්ද ලැබෙන්නේ. නමුත් එතුමා ඒ සියල්ල අභිභවා, ඒ සියල්ල ජයග්‍රහණය කරලා, අපේ පක්ෂයේ ජ්‍යෙෂ්ඨයකු හැටියට සහ අපේ ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමතිවරයකු හැටියට කටයුතු කළා. එතුමා ඒ කාලේ සිටම මගේ මිත්‍රයෙක් වුණා.

ඊට පසුව අපට සාරථි දුෂ්මන්ත මිත්‍රපාල අපේ හිටපු නියෝජ්‍ය ඇමතිතුමා ආශ්‍රය කරන්න ලැබුණා. එතුමාත් තාත්තාගේම අඩි පාරේ ගිය පුතෙක්. පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි පොහොට්ටුවෙන් කෑගල්ල වාගේ දිස්ත්‍රික්කයකින් තරග කරන එක ඒ තරම් ලේසි නැහැ, මනාප ඡන්ද ක්‍රමය යටතේ. නමුත් මනාප ඡන්ද ක්‍රමය තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් පොහොට්ටුවෙන් තරග කරලා ජයග්‍රහණය කළා කියන්නේ, සැබැවින්ම ඒ සඳහා ජනතාවගේ ප්‍රසාදය තිබෙන්නම ඕනෑ. මොකද, රැල්ලට එනවා වාගේ නොවෙයි, එවැනි මනාප ඡන්ද ක්‍රමයක් තුළ වෙනත් පක්ෂයක අපේක්ෂකයෙක් ජයග්‍රහණය කරන එක. නමුත් එතුමා - එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේ පුත්‍ර රත්නය- විශිෂ්ට ජයග්‍රහණයක් ලැබුවා. එච්.ආර්. මිත්‍රපාල මහත්මයා පෙන්නුවා වෙන්න ඕනෑ, එතුමාට පියාගේ අඩිපාරේ යන්න.

එච්.ආර්. මිත්‍රපාල මහත්මයාගේ අවමංගල්‍ය උත්සවයටත්, ආනන්ද රත්නායක මැතිතුමාගේ අවමංගල්‍ය උත්සවයටත්, සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමාගේ අවමංගල්‍ය උත්සවයටත් -ඒ තුනටම- මා සහභාගි වුණා. මොකද, අද එතුමන්ලා පාර්ලිමේන්තුවේ නැති වුණත්, පාර්ලිමේන්තුව තුළදී අප සමඟ විතරක් නොවෙයි, ජනතාව එක්කත් එතුමන්ලා කටයුතු කළ ආකාරය අපි හොඳාකාරව දැක්ක නිසා. ඒ නිසා මේ වෙලාවේ අපේ මිත්‍ර සාරථි දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමාගේ ආදරණීය පියා වූ එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේ ආදරණීය බිරිඳටත්, ඒ පවුලේ උදවියටත් මගේ ශෝකය ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ සුප්‍රකට මාධ්‍යවේදීන් දෙදෙනෙකු ඊයේ අපෙන් සමු ගත්තා. බන්දුල පද්මකුමාර මැතිතුමාගේ අවමඟුල් උත්සවයට මා සහභාගි වුණා. ඉතාම ඉක්මනින් ඒ අවමඟුල් උත්සවයේ කටයුතු සිදු කළා. ඒ වාගේම සුනිල් මාධව ප්‍රේමතිලක අපේ ආදරණීය ජනතාවාදී, මාධ්‍යවේදීතුමා අප අතරින් වෙන් වුණා. අපි අද ශෝක ප්‍රකාශ ඉදිරිපත් කළ මන්ත්‍රීවරු පස්දෙනාම නියෝජනය කළ මාධ්‍ය අංශයේ හිටපු මිත්‍රයන් තමයි ඒ දෙදෙනා. 1994දී අපේ මැතිවරණ ජයග්‍රහණයට සුනිල් මාධව මැතිතුමන්ලා කළ මෙහෙය අපට තවම මතකයි, මේ රටේ ඒ විප්ලවය ඇති කරන්න. ඒ නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු නොවුණත්, ඒ ආදරණීය මාධ්‍යවේදීන් දෙදෙනාත් අපි මේ කථා කරන චරිත පහේම දේශපාලන කඳවුරට දැඩි ලෙස සම්බන්ධයක් තිබුණු අය නිසා ඒ දෙදෙනාගේ පවුලේ උදවියටත් මේ වෙලාවේ මාගේ ශෝකය ප්‍රකාශ කරමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.32]

**ගරු සුදත් මංජුල මහතා**
(மாண்புமிகு சுதத் மஞ்சுல)
(The Hon. Sudath Manjula)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාවට සුවිශාල සේවයක් කළ කෘතහස්ත දේශපාලනඥයන් පස්දෙනෙකුගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කරන මේ අවස්ථාවේ, එතුමන්ලා ගැන කථා කරන්න මේ අවස්ථාව ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකනවා.

විශේෂයෙන්ම මා නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයටත්, සබරගමුව පළාතටත් අභිමානයක් එක් කරමින්, විටෙක සබරගමුව පළාත් සභාව, අනතුරුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරමින් නියෝජ්‍ය අමාත්‍යවරයෙක් ලෙස දෙවරක් පිදුම් ලැබූ අපි අතරින් සමුගත් එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේ අභාවය පිළිබඳව, ඒ වාගේම ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා, ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමා, සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා, පී.බී. දිසානායක මැතිතුමාගේත් අභාවය පිළිබඳව මේ මොහොතේ එම පවුල්වල ඥාතීන් වෙත මගේ ශෝකය ප්‍රකාශ කරනවා.

මගේ ඥාතිවරයෙක්, ඒ වාගේම මා නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයට වාගේම, තුන් කෝරළයේම ජනතාව වෙනුවෙන් අමිල මෙහෙවරක් කළ කෘතහස්ත, ප්‍රතිපත්තිගරුක දේශපාලනඥයකු වන දිවංගත එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේ අභාවය පිළිබඳව නැවතත් ශෝකය පළ කරමින්, මුලින්ම එතුමා පිළිබඳ යම් පණිවුඩයක් ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට තමයි මම බලාපොරොත්තු වෙන්නේ.

ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා රුවන්වැල්ල ආශ්‍රිතව ඇති කරවනැල්ල නගරයේ පදිංචිව සිටි එච්.ආර්. අප්පුහාමි මැතිතුමාටත්, යූ.ජී. කරුණාවතී මැතිනියටත් දාව පවුලේ දෙවැනි දරුවා ලෙසින්, අටදෙනෙකුගෙන් සමන්විත පවුලේ වැඩිමහල් පිරිමි දරුවා ලෙසින්, 1946 මාර්තු මස 15වැනි දින මෙලොව එළිය දකිනවා. එතුමා දෙහිඕවිට බෞද්ධ ප්‍රාථමික විද්‍යාලයෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලබලා, පසුව රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලයටත්, අනතුරුව ගම්පහ බණ්ඩාරනායක මහා විද්‍යාලයටත් ඇතුළත්ව වැඩිදුර අධ්‍යාපනය හැදෑරුවා. ඉන් පසුව එතුමා විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා විද්‍යෝදය විශ්වවිද්‍යාලයට ඇතුළත්ව මානව විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ පළමු පෙළ සාමාර්ථයක් සහිත උපාධිධාරියෙක් හැටියට මේ රටේ කළමනාකරණ සේවයට එකතු වෙනවා. ඒ වාගේම එම විශ්වවිද්‍යාලය තුළම කථිකාචාර්යවරයෙක් වශයෙනුත් කටයුතු කළ එතුමා, අනතුරුව ලංකා බැංකුවේ ණය අංශයේ මාණ්ඩලික කළමනාකරුවෙක් විධියට සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරනවා. ඒ අතරතුර නීති විද්‍යාලයට ඇතුළත්ව අවසානයේ අධිනීතිඥවරයෙක් හැටියට නීති ක්ෂේත්‍රයට එකතු වෙනවා. ඉන් පසුව අවිස්සාවේල්ල අධිකරණ කලාපය තුළ අවිස්සාවේල්ල අධිකරණයට අනුයුක්තව කටයුතු කරමින්, මිල මුදල් නොතකා තම නීතිඥ වෘත්තිය තුළ කටයුතු කරමින් ප්‍රදේශයේ ජනතාවට විශාල සේවයක් ලබා දෙමින් එම ජනතාව අතර කීර්තිමත් තරුණ නීතිඥවරයෙක් බවට පත් වෙනවා.

මිත්‍රපාල මැතිතුමා සිය විශ්වවිද්‍යාල ජීවිතය තුළදී ආචාර්ය එන්.ඇම්. පෙරේරා මැතිතුමාගේ දේශපාලන දර්ශනය අනුවයි කටයුතු කළේ. පසුකාලීනව එතුමා ලංකා සමසමාජ පක්ෂයට එකතුව මුලින්ම ගලිගමුව ආසනයේ ලංකා සමසමාජ පක්ෂයේ සංවිධායකවරයා ලෙසත්, ඉන් අනතුරුව යටියන්තොට ආසනයේ ලංකා සමසමාජ පක්ෂයේ සංවිධායකවරයා හැටියටත් කටයුතු කරමින් සිට, 1988 දී පැවති පළමු පළාත් සභා මැතිවරණයේදී විශිෂ්ට ජයග්‍රහණයක් ලබාගෙන සබරගමුව පළාත් සභාවේ විපක්ෂ නායකවරයා ලෙස පත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා එක්සත් ජාතික පක්ෂයේ මැර දේශපාලනයට හොඳම පිළිතුර දෙන්න පුළුවන් පෞරුෂය තිබුණු, ඒ වාගේම තම බුද්ධිය, තම දැනුම පාවිච්චි කරමින් මහජන මතය පරිවර්තනය කරන්න සුවිශේෂී හැකියාවක් තිබුණු දේශපාලනඥයෙක් හැටියට තමයි මම එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා දකින්නේ.

[ගරු සුදත් මංජුල මහතා]

මිත්‍රපාල මැතිතුමා කිසි දිනක දේශපාලන වාසි තකා, එහෙම නැත්නම් යම්කිසි පෞද්ගලික ප්‍රතිලාභයක් වෙනුවෙන් තම මතය හෝ තම ක්‍රියාවලිය ඉදිරියට ගෙන ගිය දේශපාලනඥයෙකු නොවෙයි. එතුමා, සමාජමය වශයෙන් තැළෙන, පීඩිත පන්තිය වෙනුවෙන් තම සටන ඉදිරියට අරගෙන ගිය ඉතාම යහපත්, සුවිශේෂී, කෘතහස්ත දේශපාලනඥයෙක්. ඒ ගමන් මඟ තුළ ඉදිරියට යමින් 2000 වසරේදී එතුමා මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. විශේෂයෙන්ම යටියන්තොට, දැරණියගල, රුවන්වැල්ල වාගේම කෑගල්ල දිස්ත්‍රික්කයට විශාල මහජන මෙහෙවරක් ඉටු කරන්න එතුමා කටයුතු කළා. ඉන් අනතුරුව දැරණියගල ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සංවිධායකවරයා හැටියටත් එතුමා පත් වුණා. අඳුරේ තිබුණු දැරණියගල ප්‍රදේශය ආලෝකවත් කරන්න එතුමා මහා පරිශ්‍රමයක් දැරුවා කියන කාරණය අපි ප්‍රකාශ කළ යුතුමයි. හුදෙකලා වෙච්ච දැරණියගල මැතිවරණ කොට්ඨාසයේ ජනතාවට අවශ්‍ය විදුලි පහසුකම්, මාර්ග පහසුකම් ඇතුළු අනිකුත් යටිතල පහසුකම් ලබා දෙන්න එතුමා එදා විශාල කැප වීමකින් කටයුතු කළා. එතුමා ලබා දුන් ඒ නායකත්වයේ ප්‍රතිඵලයක් හැටියට අද වනකොට දැරණියගල ප්‍රදේශයේ විශාල පරිවර්තනයක් සිදු වෙලා තිබෙන ආකාරය අපි දකිනවා.

මිත්‍රපාල මැතිතුමා තුන් කෝරළයට වාගේම කෑගල්ල දිස්ත්‍රික්කයට විශාල සේවයක් සිදු කළා. පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස කටයුතු කළ කාලයේ එතුමා කිරි ගොවි ගම්මාන සංකල්පය හඳුන්වා දෙමින් දියර කිරි භාවිතය වැඩි කරන්න විශාල පරිශ්‍රමයක් දැරුවා. තමන්ගේ ආදරණීය පුතණුවන් 2015 වසරේ පැවති මැතිවරණයට ඉදිරිපත් කරලා, ඔහු මේ පාර්ලිමේන්තුව නියෝජනය කිරීම සඳහා එවන්න එතුමා එදා දේශපාලන වශයෙන් මනා තීන්දුවක් ගත්තා. ඒ අනුව, එතුමාගේ පුතණුවන් වන සාරතී දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමා පියාගේ ගමන් මඟ යමින් 2015 මැතිවරණයෙන් තේරී පත් වෙලා මේ පාර්ලිමේන්තුවට පැමිණියා. කෑගල්ල දිස්ත්‍රික්කයේ වාගේම තුන් කෝරළයේ ජනතාවට සේවය ලබා දෙන්න එතුමාගේ පුතණුවන් මේ වනකොට විශාල පරිශ්‍රමයක් දරමින් සිටිනවා. අපි එය අගය කළ යුතුයි. එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා හෘදයාබාධයකට ලක්ව වසර 73ක් ආයු වින්දනය කරමින් සිටියදී තමයි අනපේක්ෂිත මොහොතක 2019 වසරේ සැප්තැම්බර් මාසයේ අප අතුරින් සදහටම වෙන්ව ගියේ. දේශපාලනඥයෙකු විධියට මම මතක් කළ යුතුයි, එතුමා අපේ ඥාතිවරයෙක්. එතුමා මා කුඩා කාලයේ සිටම මගේ ජීවිතයේ වීරයෙක් වෙලා හිටියා. මිත්‍රපාල මැතිතුමා අපේ ජීවිතයට, අපේ දේශපාලන ගමන් මඟට විශාල පන්නරයක් වාගේම විශාල දැනුමක් ලබා දුන් සුවිශේෂී දේශපාලනඥයෙක් බවත් මා මේ අවස්ථාවේදී සිහිපත් කළ යුතුයි. එතුමා ඉටු කළ සේවාව, එතුමාගේ දේශපාලන ගමන් මඟ කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට වාගේම තුන් කෝරළයේ ජනතාවට කිසි දිනක අමතක වන එකක් නැහැ කියලා මේ ගෞරවනීය පාර්ලිමේන්තුවට මම මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.

එතුමාගේ සමු ගැනීමෙන් ශෝකයට පත්ව සිටින එතුමාගේ ආදරණීය බිරිඳ වන වසුන්දරා මිත්‍රපාල මැතිනියටත්, ආදරණීය පුතණුවන් වන වර්තමාන පාර්ලිමේන්තුව නියෝජනය කරන අපේ සහෝදර ගරු සාරතී දුෂ්මන්ත මිත්‍රපාල මන්ත්‍රීතුමාටත් -හිටපු නියෝජ්‍ය අමාත්‍යතුමාටත්-, පියාගේ ගමන් මඟ යමින් නීතිඥ වෘත්තීයට එකතුව ඉන්න ආදරණීය දියණියන් දෙපළටත්, එතුමාගේ සහෝදර සහෝදරියන් ඇතුළු පවුලේ ඥාතීන්ටත් මගේ ශෝකය පළ කරමින්, අපි අතුරින් සමු ගත් එච්.ආර්. මිත්‍රපාල හිටපු නියෝජ්‍ය අමාත්‍යතුමාට අජරාමර නිවන් සුව ලැබේවායි මම ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාටත්, ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමාටත්, සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමාටත්, පී.බී. දිසානායක මැතිතුමාටත් නිවන් සුව අත් වේවායි පතමින්, ඒ පවුල්වල සියලු දෙනාට මගේ ශෝකය ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා. ස්තූතියි.

[අ.භා. 2.43]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (කම්කරු අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - தொழில் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Labour)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිවංගත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හතර දෙනෙකු සහ නියෝජ්‍ය ඇමතිවරයකුගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන අද දිනයේ එතුමන්ලා පිළිබඳව කථා කරන්න අවස්ථාව ලැබීම මම ඉතාම අගය කොට සලකනවා. මා සමඟ 2000 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මේ ගරු සභාව ශෝභාවත් කළ නීතිඥ ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාවට පළමුවෙන්ම එකතු වෙන්න මා කැමැතියි. ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා කියන්නේ ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමාගෙන් දේශපාලන පන්නරය ලැබූ තුන්කෝරළයෙන් බිහි වූ ශ්‍රේෂ්ඨ දේශපාලනඥයෙක්. එතුමා සිය දේශපාලන ජීවිතය තමාට ආභරණයක් කර කර ගත්තේ නැහැ. එතුමා ඉතාම ජනප්‍රිය දේශපාලනඥයකු මෙන්ම ජනතාවගේ කඳුළ, දහඩිය හඳුනා ගත් දේශපාලනඥයක්. එතුමා ඉතාම සරල ජීවිතයක් තමයි ගත කළේ. ඒ වාගේම, එතුමා නීතිඥවරයකු වශයෙන් පවුලේ දරුවන් සියලුදෙනා නීතිඥ වෘත්තියට යොමු කළා. අද අප සමඟ දේශපාලනයේ යෙදෙන සාරතී දුෂ්මන්ත මැතිතුමා එතුමාගේ පුත්‍ර රත්නයයි. මිත්‍රපාල මැතිතුමා අතිවිශිෂ්ට පුත්‍ර රත්නයක් කෑගල්ල දිස්ත්‍රික්කයේ දේශපාලනය සඳහා දායාද කළා. මිත්‍රපාල මැතිතුමාගේ අභාවයෙන් හිස්වූ එම තැන පිරවීම සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලන ප්‍රවාහය තුළ රැඳී සිටිමින් සාරතී දුෂ්මන්ත මැතිතුමා සුවිශේෂී සේවාවක් කරගෙන යන එක අපට බොහෝ සතුටු විය හැකි කාරණයක්.

ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ මානව හා ශාස්ත්‍ර පීඨයට ඇතුළත් වෙලා ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගත්තා. ඒ වාගේම, ලංකා බැංකුවේ ප්‍රථම උපාධිධාරි මාණ්ඩලික නිලධාරියකු විධියටත් එතුමා සේවය කළා. ඊට පස්සේ අවිස්සාවේල්ල ප්‍රදේශයේ තිබෙන අධිකරණවල සිවිල් හා අපරාධ නඩුවලදී ජනහිතකාමී නීතිඥවරයකු වශයෙනුත් එතුමා කටයුතු කළා. ඒ වාගේම, එතුමා කෑගල්ල දිස්ත්‍රික්කයේ දැරණියගල ප්‍රදේශයට සුවිශාල සංවර්ධනයක් ගෙන ඒම සඳහා මහජන නියෝජිතයකු වශයෙන් තමන්ගේ සේවය නිසි ලෙස ඉටු කළා කියන කාරණයත් මම ඉතාම සතුටින් මේ අවස්ථාවේ මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමා ගැනත් මා කථා කළ යුතුයි. එතුමා එම ප්‍රදේශයේ ගොවි ජනතාව වෙනුවෙන් සුවිශේෂී මෙහෙවරක් ඉටු කරපු දේශපාලන නායකයෙක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දුර්මුඛව සිටි අවස්ථාවකදී ඒ ප්‍රදේශය තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලනය පණගැන්වීම සඳහා එතුමා ඉතා කැපවීමෙන් කටයුතු කළ බව මම ඉතා ආඩම්බරයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පී.බී. දිසානායක මැතිතුමා ගැනත් මම වචන කිහිපයක්

කථා කරන්න ඕනෑ. එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් ඉඳලා, ඉන් අනතුරුව මධ්‍යම පළාතේ ආණ්ඩුකාරතුමා ලෙසත්, මා නියෝජනය කරන ඌව පළාතේ වැඩ බලන ආණ්ඩුකාරතුමා ලෙසත් කටයුතු කරමින් මහ ජනතාවට සුවිශේෂී සේවාවක් ඉටු කළ බව මම මතක් කරන්නේ ඉතාම සතුටින්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා ගැන කියනවා නම්, එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කළා. විශේෂයෙන්ම එතුමා පළමුවෙන්ම කොමියුනිස්ට් පක්ෂයෙනුත්, ඊට පස්සේ ස්වාධීනවත් තරග කරලා දොඩම්ගස්ලන්ද ආසනය ජයග්‍රහණය කළා.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය 1965 වර්ෂයේදී එතුමා දොඩම්ගස්ලන්ද මැතිවරණ කොට්ඨාසයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක වශයෙන් පත් කළා. එම වර්ෂයේ පැවැති මහ මැතිවරණයේදී දොඩම්ගස්ලන්ද ආසනයෙන් එතුමා ජයග්‍රහණය කළා. එතුමා එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගෞරවය ආරක්ෂා කරමින්, අපට විශාල ශක්තියක් ලබා දුන්නා. එලෙස එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ලබා දුන් ඒ ගෞරවයත්, ඒ ප්‍රදේශයේ ජනතාවට කරන ලද සේවාවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් ඉතාම ගෞරවයෙන් මේ අවස්ථාවේදී මම සිහිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, දිවංගත ගරු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා ගැනත් මා යමක් සඳහන් කළ යුතුයි. අසූව දශකයේ මම කොළඹ මහ නගර සභාවේ විපක්ෂ නායකවරයා වශයෙන් කටයුතු කරනකොට අප සමඟ විරෝධතා ව්‍යාපාරවලට, පාගමන්වලට සහ පෙළපාළිවලට බොහොම උනන්දුවෙන් සහභාගි වූ කෙනෙකු තමයි, ගරු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකත්වය ලැබීමෙන් පසු ජනාධිපති වෘත්තීය සමිති කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් ධුරයටත් එතුමා පත් වුණා. එතුමා වෘත්තීය සමිති කටයුතුවලට දැඩි උනන්දුවක් දක්වමින් මේ රටේ වැඩ කරන ජනතාවගේ වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් පුළුල් සේවාවක් කළ බවත් මේ අවස්ථාවේදී මම මතක් කරන්න කැමැතියි.

විශේෂයෙන්ම එතුමා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සභාපති වශයෙනුත් විශාල සේවාවක් ඉටු කළා. එමෙන්ම, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සභාපති ධුරය හොබවමින්, ඒ සංස්ථාවේ කළමනාකරණ කටයුතු හා නිෂ්පාදන කටයුතු ප්‍රතිව්‍යුහගත කරමින්, එතෙක් පාඩු ලබමින් තිබුණු එම සංස්ථාව ලාභ ලබන තත්ත්වයට පත් කරමින්, මහා භාණ්ඩාගාරයට බරක් නොවන විධියට එම සංස්ථාවේ කටයුතු කරගෙන යෑමට එතුමාට පුළුවන් වුණා. ඒ වාගේම කම්කරු සමිති මධ්‍ය මණ්ඩලයේ ලේකම්වරයා ලෙස ජනතා අරගළ රැසකට එතුමා නායකත්වය දුන්නා. මේ අවස්ථාවේදී අපි එතුමාත් ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන්, දිවංගත මේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාගේ සහ ඇමතිවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක් ලෙස කටයුතු කළ ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේත් ඥාති හිතමිත්‍රාදීන් වෙත අපගේ ශෝකය ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තූතියි.

[අ.භා. 2.51]

**ගරු මංජුලා දිසානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க)
(The Hon.(Mrs.) Manjula Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශෝක ප්‍රකාශ යෝජනා කිහිපයක් ඉදිරිපත් කර තිබෙන අද දිනයේ, දොඩම්ගස්ලන්ද ආසනය නියෝජනය කරමින් මේ උත්තරීතර සභාව නියෝජනය කරන මා මුලින්ම ශෝකය ප්‍රකාශ කරනවා, ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාගේ අභාවය පිළිබඳව. වර්තමානයේ මම දොඩම්ගස්ලන්ද ආසනයේ රිදීගම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති විධියට කටයුතු කරනවා. ඒ නිසා දොඩම්ගස්ලන්ද ආසනයේ වමේ දේශපාලන පක්ෂ නියෝජනය කරන සියලු දෙනාගේම ශෝකය පළමුවෙන්ම අපේ වෛද්‍ය රාජපක්ෂ මැතිතුමා ඇතුළු එතුමාගේ පවුලේ සියලු දෙනාට මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා දොඩම්ගස්ලන්ද ආසනය කියන්නේ අපේ රටේ දේශපාලන ඉතිහාසයේ දැවැන්තයකු වූ ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමාගේ ආසනයයි. එතුමාගෙන් ගොඩනැඟුණු දේශපාලන ප්‍රවාහය තුළ එම ආසනය නියෝජනය කරමින් වමේ පක්ෂයකින් අපේක්ෂකයකු ඉදිරිපත් වෙනවා කියන එකත් එදා ලොකු අභියෝගයක් වුණා. ඒ වාගේම එදා ස්වාධීන අපේක්ෂකයකු විධියට ඉදිරිපත් වෙන එක ඊටත් වඩා ලොකු අභියෝගයක් වුණා. අවස්ථා කිහිපයකදී ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා පරාජයට පත් වුණත්, ඒ අභියෝග සියල්ල ජය ගනිමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයකු විධියට දොඩම්ගස්ලන්ද ආසනයට, වමේ අපට අභිමානයක් එකතු කරන්න එදා එතුමාට හැකියාව ලැබුණා. ඒක අපට ලොකු ශක්තියක් වුණා. දොඩම්ගස්ලන්ද වැනි ආසනයක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් මන්ත්‍රීවරයකු බිහිවෙන එක ලොකු අභියෝගයක් වෙලා තිබුණු යුගයක එතුමා ඒ කාර්ය භාරය ඉෂ්ට සිද්ධ කළා. වර්තමානයේ ඒ කටයුතු අපට භාර දීලා තිබෙනවා. ඒ අභියෝගය ජය ගන්නට එතුමා හදපු පෙර මඟ අපට ඉතාම වටිනවා.

එතුමා අවුරුදු එකහමාරක් වාගේ කාලයක් තමයි මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කළේ. එතුමාට ආ අභියෝග කොච්චර ද කියනවා නම්, එතුමාට එරෙහිව ඉදිරිපත් වූ මැතිවරණ පෙත්සමක් හේතුවෙන් එතුමාගේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයත් අහිමි වුණා. නමුත් ඒ අභියෝගයටත් එතුමා මුහුණ දීලා එතුමාගේ ආදරණීය බිරිඳ ලැටීෂියා රාජපක්ෂ මැතිනිය අතුරු මැතිවරණයට ඉදිරිපත් කරලා දොඩම්ගස්ලන්ද ආසනය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නැවත වතාවක් ජයග්‍රහණය කරවන්නට ශක්තිය ලබා දුන්නා. අපි මේ වෙලාවේදී එය ඉතාම ගෞරවයෙන් හා කෘතවේදීව සිහිපත් කරනවා. වමේ පාක්ෂිකයෙකු ලෙස දේශපාලනය ආරම්භ කරලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වමේ බල කඳවුර ශක්තිමත් කරන්න දොඩම්ගස්ලන්ද ආසනයේ නායකයා විධියට එතුමා කළ උත්තුංග මෙහෙවර වෙනුවෙන් දොඩම්ගස්ලන්ද ආසනයේ වාමාංශිකයන් සියලුදෙනා ඇතුළු සමස්ත දේශපාලන අධිකාරියේ ගෞරවය සහ ප්‍රණාමය එතුමාට හිමි වෙනවා.

අමාත්‍යවරයෙකු විධියට මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ කටයුතු කරපු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා ගැනත් මා කියන්න ඕනෑ. එතුමා එදා පළාත් සභා මැතිවරණයට එක්සත් සමාජවාදී පෙරමුණෙන්, මැටි පහන ලකුණින් ඉදිරිපත් වෙලා, එම මැතිවරණයෙන් සබරගමුව පළාත් සභාවට තේරී පත් වෙලා, සබරගමුව පළාත් සභාවේ විපක්ෂ නායක ධුරයත් දැරුවා. ඒ විතරක් නොවෙයි. එතුමා මාගේ ආදරණීය ස්වාමිපුරුෂයා වන දිවංගත සාලින්ද දිසානායක මැතිතුමා සමඟ මේ දේශපාලන ගමන්

[ගරු මංජුලා දිසානායක මහත්මිය]

මහට එකතු වෙලා 1994 වර්ෂයේදී පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. එතුමා අවසන් ගමන් ගියේ මගේ ආදරණීය ස්වාමිපුරුෂයා මිය ගිහින් මාස එකහමාරකට පස්සේ. ඒ, 2019.09.18 වැනි දා. එක්ව දේශපාලනය කරලා, මේ දේශපාලන ගමන් මහ ශක්තිමත් කරන්නට එතුමන්ලා ලබා දුන් සහයෝගය හා ශක්තිය ගැන අපි නිරන්තරයෙන් කථා කරනවා.

ශෝක ප්‍රකාශ යෝජනා මඟින් අද උදෑසන පටන් අපි සිහිපත් කරන මේ මන්ත්‍රීතුමන්ලා සියලුදෙනා වමේ කඳවුර ශක්තිමත් කරන්න, වමේ කඳවුර තුළින් මේ රටේ ජනතාවගේ යහපත, සෞභාග්‍යය වෙනුවෙන් කටයුතු කර මේ රට ඉදිරියට අරගෙන යන්නට කරපු කාර්ය භාරය අප සියලුදෙනාට මතකයි. මෛත්‍රීපාල මැතිතුමාගේ අභාවය දැරණියගල ආසනයට විතරක් නොවෙයි, කෑගල්ල දිස්ත්‍රික්කය ඇතුළු රටේ සමස්ත ජනතාවටම පාඩුවක්. වාමාංශික කඳවුර නියෝජනය කරන සියලු දේශපාලනඥයන්ට ඒ අඩුව දැනෙනවා. නමුත් ඒ අඩුව, අඩුවක් විධියට දැනෙන්න නොදී මෛත්‍රීපාල මැතිතුමාගේ ආදරණීය පුත්‍ර රත්නය අද මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. ගරු සාරතී දුෂ්මන්ත මන්ත්‍රීතුමනි, එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේ අභාවය පිළිබඳව අපගේ ශෝකය හා කනගාටුව ඔබතුමා ඇතුළු පවුලේ සියලුදෙනාට පළ කිරීමට මමත් මේ අවස්ථාවේ එකතු වෙනවා.

ඒ වාගේම, දිවංගත ගරු පී.බී. දිසානායක මන්ත්‍රීතුමාත් මා ඉතා ගෞරවයෙන් සිහිපත් කරනවා. එතුමා ඌව පළාතේ ආණ්ඩුකාරවරයා හැටියටත් කටයුතු කළා. එතුමාත් වමේ දේශපාලනය ආරම්භ කරලා, 1994 වර්ෂයේ තමයි මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ. ඉන් පසුව එතුමා උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යවරයකු විධියටත් කටයුතු කළා. අවසානයේ ඌව පළාතේ ආණ්ඩුකාර ධුරය දරමින් සිටියදී තමයි එතුමා ජීවිතක්ෂයට පත් වුණේ. එතුමාත් වමේ දේශපාලනය තුළින් ඉතා කැපවීමෙන් මේ රට නිවැරදි තැනට ගෙන යන්න අවශ්‍ය කරන ශක්තිය, සහයෝගය ලබා දුන්නා. එතුමාගේ ආදරණීය බිරිඳ අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඹුක්වැව ප්‍රදේශයේයි. එම මැතිනියටත්, එතුමාගේ ආදරණීය දියණිය අනුරුද්ධිකා මැතිනිය ඇතුළු පවුලේ සියලුදෙනාටත් අපගේ ශෝකය මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කළ දිවංගත ගරු ආනන්ද රත්නායක මැතිතුමා ගැනත් මා කියන්න ඕනෑ. පොළොන්නරුව වැනි දුෂ්කර දිස්ත්‍රික්කයක ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත් වූ ගරු ආනන්ද රත්නායක මැතිතුමා පාර්ලිමේන්තුව නියෝජනය කළේ කෙටි කාලයක් වුණත්, එතුමා පළාත් සභාව තුළ විශේෂ කාර්ය භාරයන් රැසක් කරපු පුද්ගලයෙක්. ඒ විතරක් නොවෙයි. එතුමා ජීවිතක්ෂයට පත් වන තෙක් ඒකාබද්ධ විපක්ෂය සමඟ එකතු වෙලා දැවැන්ත කාර්ය භාරයක් ඉටු කළා.

එදා මේ උත්තරීතර පාර්ලිමේන්තුව වෙනුවෙන්, ප්‍රදේශ වශයෙන් ගත්තාම ඒ සියලු ප්‍රදේශයන්හි මහ ජනතාවගේ ශුභ සිද්ධිය වෙනුවෙන්, වමේ දේශපාලන කඳවුරට කළා වූ සියලු කැප කිරීම් වෙනුවෙන් අපි අපේ ගෞරවය සහ ප්‍රණාමය එතුමන්ලාට පුද කරනවා. අද දවසේ මේ ශෝක ප්‍රකාශවලට භාජන වන, මේ උත්තරීතර සභාව නියෝජනය කළ, ජීවිතයේ අවසන් ගමන් ගිය මේ සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාට අවසන උතුම් නිවන් සුව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, අද දවසේ මේ අවස්ථාවට සම්බන්ධ වෙලා ඉන්න ඒ පවුල්වල ඥාති හිත මිත්‍රයන්ට සියලුදෙනාට අපගේ ශෝකය හා කනගාටුව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 2.58]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ අපි හිටපු ගරු මන්ත්‍රීවරු හතරදෙනෙකුගේත්, හිටපු ගරු ඇමතිවරයකුගේත් අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම මම බලාපොරොත්තු වෙනවා, ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා පිළිබඳව මේ අවස්ථාවේ අදහස් කිහිපයක් පළ කරන්නට. මොකද, එතුමා මා සමඟ මේ පාර්ලිමේන්තුව, විදේශ සංචාර ආදි වශයෙන් විවිධ මට්ටම්වලදී ඉතා හොඳ මිත්‍රත්වයක් තබාගෙන සිටියා. පාක්ෂිකයෙකු හැටියට එතුමා නියම ශ්‍රී ලංකා නිදහස් පක්ෂ අදහස දැරූ කෙනෙක්.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට දේශපාලන මතයක් තිබෙනවා. විශේෂයෙන්ම වාමවාදයත්, ජාතිකවාදයත්, ජාතික සංස්කෘතියත් මත පිහිටුවපු පක්ෂයක් හැටියට තමයි වර්ෂ 1951 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරම්භ වුණේ. ඇත්ත වශයෙන්ම එම පක්ෂයේ හැඩය කුමක්ද යන්න තීරණය වුණේ 1956 දීයි. ඒ අනුව ඒ යුගය තුළ ලෝකයේම වාමවාදී රැල්ලක් ප්‍රධාන ප්‍රවාහයක් බවට පත් වෙලා තිබුණා. යෝධ සෝවියට් දේශයත්, ඒ වාගේම මහජන චීනයත් නිසා ලෝකයේ, -විශේෂයෙන්ම ආසියානු සංස්කෘතිය ඇතුළේ- විශාල බලපෑමක්, වාමාංශික නැත්නම් මාක්ස්වාදී ප්‍රවණතාව විසින් ප්‍රායෝගිකව එල්ල කර තිබුණා. ඒ ප්‍රවාහයේ කොටසක් හැටියට තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සකස් වුණේ.

අපේ රට තුළත් අපට ආවේණික ජාතික සංස්කෘතියක් තිබෙනවා. විශේෂයෙන්ම ඒ සංස්කෘතිය තුළ අප බෞද්ධයන් හැටියට අවුරුදු දෙදහස් ගණනක් තිස්සේ ලැබූ අභ්‍යාසය තිබෙනවා. ඒ වාගේම යටත් විජිත යුගයේ ප්‍රධාන, ප්‍රබල යුරෝපීය ජාතීන් තුනකට විරුද්ධව අරගළ කරන්න අපට සිදු වුණා. ඒ අරගලවලින් නැඟුණු දේශප්‍රේමී මානසික හැඟීමක් අපට තිබුණා. ඒ නිසා අපි 1956 වන කොට අපේ මතවාදය සකස් කර තිබුණා, යම්කිසි ආකාරයකින් ජාතිකවාදී සහ වාමාංශ කියන දෙක අතර. මෙය "මැද මාවත" කියා ඒ කාලයේ හැඳින්වූවා. මේ මතවාදය ප්‍රායෝගිකව රාජ්‍ය පාලනයට යොමු කිරීම අපට පෙනෙන්නේ 1970 වර්ෂයේදී.

එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා වර්ෂ 1946 දීයි උපන්නේ. මා හිතන හැටියට එතුමාට දේශපාලනයට ඒමට බලපෑමක් සිදු වන්න ඇත්තේ 1965 වර්ෂයෙන් පසුවයි. ඒ, එතුමාගේ තරුණ කාලය නිසා වන්නට ඇති. එතුමා විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙන් මූලික උපාධියක් ලබාගෙන බැංකු ක්ෂේත්‍රයේත්, ඒ වාගේම නීති ක්ෂේත්‍රයේත් කටයුතු කළා. සිවිල් නඩු වෙනුවෙන් පෙනී සිටි නීතිඥයෙකු හැටියටත් -විශේෂයෙන් අවිස්සාවේල්ල අධිකරණයේ - එතුමා දීර්ඝ කාලයක් කටයුතු කළා. ලංකා දේශපාලනය තුළ මිත්‍රපාල මැතිතුමාගේ කාර්යභාරය අප සටහන් කර ගන්න ඕනෑ දේශපාලන මතවාදයක් මතයි.

අද දේශපාලන ක්ෂේත්‍රය සම්පූර්ණයෙන් විකෘති වෙලා තිබෙන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සුළු පක්ෂයක් වෙලා තිබෙනවා. UNP එක සුළු පක්ෂයක් වෙලා තිබෙනවා. පුද්ගල ප්‍රතිරූප මත ප්‍රධාන පක්ෂ ද්‍රවණය වෙලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය සජිත් ප්‍රේමදාස මහත්මයා මත ද්‍රවණය වෙලා තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මහින්ද රාජපක්ෂ මැතිතුමා මත ද්‍රවණය වෙලා තිබෙනවා. ඒ අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පරිණාමය අද වන විට පොහොට්ටුව කියලායි කියන්නේ. පොහොට්ටුවට මතවාදයක් තිබෙනවාද, පොහොට්ටුවේ අදහස්

උදහස් මොනවාද, එය ස්ථානගත වන්නේ කුමක් මතද කියා කවුරුවත් දන්නේ නැහැ. ඒක තනිකර පවුලක් මත පදනම් වූ දේශපාලන පක්ෂයක්. නමුත්, මිනිස්සු එහි සාමාජිකයන්. ඒ වාගේම, සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ පක්ෂය පෙරමුණක් ද, කුමක්ද කියා කියන්න කවුරුවත් දන්නේ නැහැ. ඒකට දේශපාලන මතවාදයක් නැහැ. එක්සත් ජාතික පක්ෂයේ සංකේතයත් නැති වුණා. මොකද, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ යුගය තුළ කොන්සර්වේටිව් පක්ෂයක් හැටියට එක්සත් ජාතික පක්ෂයට තිබුණු පදනම ගිලිහී ගියා. ඊට පසුව ඒක ද්‍රවණය වුණා සජිත් ප්‍රේමදාස මැතිතුමා වෙත. සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ දේශපාලන ව්‍යාපාරය ප්‍රධාන ප්‍රවාහය වුණත් ඒකට මතවාදයක් නැහැ. ඒ අනුව අන්ධ දේශපාලන පක්ෂ දෙකක අන්ධ ප්‍රවාහ දෙකක් අද අපට තිබෙන්නේ. මෙන්න මේ නිසා අද රික්තයක් ඇති වෙලා තිබෙනවා, ඊළඟ දේශපාලන ප්‍රවණතාව මොකක්ද කියලා. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, අප අද සිටින මේ යුගය එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා ජීවත් වෙච්ච යුගය නොවන බව. ලෝකයේ දේශපාලන මතවාදවල අප පිහිටන්නේ කොතැනද කියන ප්‍රශ්නය අද මතුව තිබෙනවා. යුරෝපය හා ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ රටවලත්, ඒ වාගේම ආසියාතික රටවල සෑහෙන ප්‍රදේශයකත්, සංවර්ධනයේ අලුත් මාවත කියන එක ගැන අද පවතින සාකච්ඡාව වන්නේ "තිරසර යුගයක්" කියන එකයි. නමුත්, මෙහේ "තිරසර යුගයක්" කියන එක බුලත් හපයක්, අයාලේ යන්නක් බවට පත් වෙලායි තිබෙන්නේ. කිසිම වගකීමක් නැතිව හැමෝම ඒක පාවිච්චි කරනවා.

මිත්‍රපාල මැතිතුමාගේ දේශපාලන සිතුවිලි සකස් කරන්නේ ඒ යුගයේ තිබුණු ජාතික හා ජාත්‍යන්තර දේශපාලන ප්‍රවණතා විසින්. ජාතික දේශපාලනයේ හැඩරුව හැදෙන්නේ ලෝක දේශපාලනයේ ප්‍රවණතා විසින්. මිත්‍රපාල මැතිතුමා ජීවත් වුණු යුගයට සාපේක්ෂව අද යුගය අපි අරගෙන බැලුවොත්, ලෝක දේශපාලනයේ වියවුලක් පවතිනවා. මේ වෙනකොට රුසියාව යුක්රේනයට පහර දෙනවා; පැරණි සෝවියට් දේශයේ කොටසක් වුණු යුක්රේනයට පහර දෙනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානය රුසියාවට තහංචි දමන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. අපේ තේ ටික රුසියාවට විකුණා ගන්න පුළුවන්ද, එතකොට අපිට මොකද වෙන්නේ කියන ප්‍රශ්න අද ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේ විපරිත යුගයක තමයි අපි ජීවත් වෙන්නේ. ඒ නිසා මිත්‍රපාල මැතිතුමාගේ කාලය තුළ තිබුණු දේශපාලන දැක්ම ඔහුගේ මනසින් සහ ක්‍රියාවෙන් ඔහු පෙන්වුවත්, අපේම වූ දේශපාලනයක් මේ වාතාවරණය තුළ සකස් කර ගන්න අද යුගයේ තීරණය වෙලා තිබෙනවා .

ගරු එච්.ආර්.මිත්‍රපාල මැතිතුමා හොඳ කල්‍යාණ මිත්‍රයෙක්. මෙතැන කථා කළ බොහෝ මන්ත්‍රීවරුන් කිව්වා, 1977 සිට 1994 දක්වා යුගය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඉතා බරපතළ යුගයක් කියලා. පාක්ෂිකයන්ට පීඩන රාශියක් තිබුණු, විශාල දේශපාලන හස්තයකට යටත් වෙලා සිටි යුගයක එතුමා තමන්ගේ පළාතේ ජනතාව නැඟී සිටුවමින් ප්‍රගතිශීලී දේශපාලන ව්‍යාපාරයක නියෝජිතයකු ලෙස සුවිශාල කාර්ය භාරයක් කළා. මම හිතන විධියට ඒ පළාතේ ජනතාවට ඒක මතක ඇති. "තක්කඩියෙක්", "හොරෙක්" කියන නාමය අද ගොඩාක් දේශපාලනඥයන්ට පටබැඳිලා තිබෙනවා. නමුත්, මිත්‍රපාල මැතිතුමා කියන්නේ එහෙම නාමයක් පටබැඳී නැති දේශපාලනඥයෙක්. එතුමා හොඳ මිත්‍රයෙක්, හොඳ දේශපාලනඥයෙක්, දැන උගත් කෙනෙක්. එතුමාගේ අභාවය පිළිබඳව මේ අවස්ථාවේ දී අපේ ශෝකය ප්‍රකාශ කරනවා.

තෙරුවන් සරණයි!

[අ.භා. 3.04]

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார)
(The Hon. Jagath Pushpakumara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ උත්තරීතර සභාව නියෝජනය කරපු ගරු මන්ත්‍රීතුමන්ලා පස් දෙනෙකුගේ අභාවය පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන අද දවසේ, එතුමන්ලා වෙනුවෙන් මම මොනරාගල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් වෙල්ලස්සේ ආදරණීය ජනතාවගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම මම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආර්.ආර්.ඩබ්ලිව්.රාජපක්ෂ මැතිතුමා ගැන වචන කිහිපයක් කථා කරන්න ඕනෑ. ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් දොඩම්ගස්ලන්ද මැතිවරණ කොට්ඨාසයට තරග කර, එදා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළ ඒ.යූ.රොමානිස් මැතිතුමා පරාජයට පත් කරමින් ජයග්‍රහණය කළා. නමුත්, එතුමාට ඉතා සුළු කාලයක් -අවුරුද්දයි මාස හයයි දින හතරක් වැනි කෙටි කාලයක්- පමණයි මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන්න හැකියාව ලැබුණේ. එතුමාගේ එම නිල කාලය බොහොම කනගාටුදායක ලෙස අවසන් වුණා. ඉන් අනතුරුව එතුමාගේ ආදරණීය බිරිඳ වන ලැටීෂියා රාජපක්ෂ මැතිනිය මේ උත්තරීතර සභාව නියෝජනය කරන්න අවස්ථාව හිමි කරගෙන, ගරු මන්ත්‍රීතුමියක් හැටියට කටයුතු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කළ මන්ත්‍රීවරයකු වන ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාගේ අභාවය පිළිබඳව නැවතත් අපගේ ශෝකය පළ කරමින්, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම නැවතත් මොනරාගල දිස්ත්‍රික්කයේ -වෙල්ලස්සේ- ආදරණීය ජනතාවගේ ශෝකයත් මේ අවස්ථාවේ මා ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආනන්ද රත්නායක මැතිතුමා ගැනත් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න මා කැමැතියි. එතුමා තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා හැටියට කටයුතු කළා. එම ප්‍රාදේශීය සභාව තුළින් තමන්කඩුව ප්‍රදේශයට සුවිශාල කාර්ය භාරයක් ඉෂ්ට කරන්නට එතුමාට හැකියාව ලැබුණා. එතුමා එතැනින් නතර වුණේ නැහැ. උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරයකු වශයෙනුත් එතුමා සේවය කළා. පොළොන්නරුව දිස්ත්‍රික්කයට පමණක් නොවෙයි, උතුරු මැද පළාතටම තවදුරටත් සේවය කරන්න එතුමාට හැකියාව ලැබුණා. උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යවරයකු හැටියටත් එතුමා කටයුතු කළා. උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යවරයකු හැටියට කටයුතු කිරීමෙන් නොනැවතුණු එතුමා, 2001 දෙසැම්බර් මාසයේ 05 වැනිදා පැවති පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වුණා. එම මැතිවරණය පැවති කාලය වනකොට ලංකාවේ දිස්ත්‍රික්ක 25න් දිස්ත්‍රික්ක 24කින්ම අපේ පක්ෂය පරාජයට පත්වෙලායි සිටියේ. එදා මොනරාගල දිස්ත්‍රික්කය විතරයි ජයග්‍රහණය කරලා තිබුණේ. එක පැත්තකින්, ඒ ගැන මා ආඩම්බර වෙනවා. එදා මුළු රටේම හැම දිස්ත්‍රික්කයක්ම පරාජයට පත්වූ අවස්ථාවේදී, මොනරාගල දිස්ත්‍රික්කය ජයග්‍රහණය කරමින් මට පළමුවන ස්ථානය ලබා ගැනීමට හැකි වුණා. ශෝක යෝජනා ඉදිරිපත් කර තිබෙන මෙවැනි අවස්ථාවක වුණත්, එදා මට ජයග්‍රහණය කිරීමට ශක්තියක් ලබා දුන් මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාවට මාගේ ගෞරවනීය ස්තුතිය පිරිනමන්න ඕනෑ. ඒ අවස්ථාවේ දී අපේ ගරු ආනන්ද රත්නායක මන්ත්‍රීතුමා පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවට පැමිණියා. අපි එදා සිටියේ විපක්ෂයේ. විපක්ෂය

[ගරු ජගත් පුෂ්පකුමාර මහතා]

නියෝජනය කරමින් අවුරුදු 3කුත්, මාස 2ක් සිටියා. 2004 මැතිවරණය තෙක් එතුමාත්, අපිත් විපක්ෂයේ ඉඳගෙන කටයුතු කළා.

මේ පාර්ලිමේන්තුවේ බොහොම අර්බුදකාරී තත්ත්වයක් පැවති එක්තරා අවස්ථාවක් මට මතකයි. එදා කථානායක ධුරය හෙබවූයේ ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමායි. ආනන්ද රත්නායක මැතිතුමා එදා එතුමාට යම් වැරැද්දක් පෙන්වා දුන්නා. ඊට පස්සේ කථානායකවරයා කිව්වා, මේ සභාවේ වැඩ කටයුතු විනාඩි 10කට කල් තබනවාය කියලා. ඒ අවස්ථාවේ දී ආනන්ද රත්නායක මැතිතුමා කිව්වා, "විනාඩි 10කට නොවෙයි, අවුරුද්දකට හෝ සභාව කල් තබන්න. අපට ප්‍රශ්නයක් නැහැ" කියලා. එලෙස නිර්භීතව කථා කරන්න පුළුවන් නායකයකු හැටියට, වැරැද්ද දැක්ක තැන වැරැද්ද පෙන්වා දෙන්න පුළුවන් නායකයකු හැටියට ගරු ආර්.එම්. ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමා කටයුතු කළාය කියන එක විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. එදා එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට පොදුජන එක්සත් පෙරමුණ පක්ෂයෙන් "පුටුව" ලකුණෙන් තරග කළා. දිවංගත දි.මු. ජයරත්න මැතිතුමා තමයි එදා අපේ පක්ෂයේ ලේකම්වරයා හැටියට කටයුතු කළේ. එතුමා වෙනුවෙන් නාම යෝජනා පත්‍ර අත්සන් කළේ දි.මු. ජයරත්න මැතිතුමායි. වර්තමාන පාර්ලිමේන්තුව නියෝජනය කරන අනුරාධ ජයරත්න රාජ්‍ය ඇමතිතුමාගේ පියාණන් තමයි එතුමා වෙනුවෙන් නාම යෝජනා පත්‍ර අත්සන් කිරීමේ කටයුතු කළේ. මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් දිවංගත දි.මු. ජයරත්න මැතිතුමාට අපේ ගෞරවය පිරිනමන්න ඕනෑ. ගරු ආනන්ද රත්නායක මැතිතුමන්ගේ ජයග්‍රහණයට දිවංගත දි.මු. ජයරත්න අග්‍රාමාත්‍යතුමාත් විශාල ශක්තියක් වුණා. අපි ඒ සම්බන්ධයෙන් මතක් කරන්න ඕනෑ, එතුමාට ගෞරව කරන්න ඕනෑ. ගරු ආනන්ද රත්නායක මැතිතුමාගේ අභාවයෙන් ශෝකයට පත් එම පවුලේ සියලුදෙනාටම ශෝකය පළ කරන්නත්, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට, අපේ දිවංගත ගරු පී.බී. දිසානායක මන්ත්‍රීතුමා ගැනත් වචන ස්වල්පයක් කථා කරන්න ඕනෑ. මන්ත්‍රීවරයකු හැටියටත්, ඒ වාගේම ආණ්ඩුකාරවරයකු හැටියටත් සුවිශාල කාර්ය භාරයක් ඉටු කරන්න එතුමාට හැකියාව ලැබුණා. අවුරුදු 17ක් අපට බලය නැතිව දුක් වින්දා. අපට අඩන්තේට්ටම් කළ, අපේ පාක්ෂිකයන්ට හිරිහැර කළ යුගය 1994 අගෝස්තු මාසයේ 16 දින පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් අවසන් වුණා. අවුරුදු 17කට පසුව අපට බලය ලබා ගන්න පී.බී. දිසානායක මැතිතුමා දැවැන්ත ශක්තියක් වුණා. එතුමා ඒ වෙනුවෙන් දැවැන්ත කාර්ය භාරයක් ඉෂ්ට කළා.

අපේ වර්තමාන රාජ්‍ය අමාත්‍ය ගරු දුමින්ද දිසානායක මැතිතුමාගේ පියාණන් වන දිවංගත බර්ටි ප්‍රේමලාල් දිසානායක මැතිතුමා ඒ භීෂණයට මුහුණ දෙමින් අනුරාධපුර දිස්ත්‍රික්කයට නායකත්වය ලබාදෙන කොට, එතුමා සමඟ එක් වෙලා වර්තමාන රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මැතිතුමාගේ ආදරණීය පියාණන් වන හිටපු අමාත්‍ය එච්.බී. සේමසිංහ මැතිතුමා, හිටපු අමාත්‍ය තිස්ස කරල්ලියද්ද මැතිතුමා වැනි අයත් එක්ක විශාල ශක්තියක්, ජවයක් ලබා දෙමින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජයග්‍රහණය වෙනුවෙන් පී.බී. දිසානායක මැතිතුමා කටයුතු කළා. 1994 ඉඳලා 2000 වර්ෂයේ ඔක්තෝබර් මාසය දක්වාත්, 2000 ඔක්තෝබර් මාසයේ සිට 2001 ඔක්තෝබර් මාසය දක්වාත් අවුරුදු 7කට අධික කාලයක් මේ උත්තරීතර සභාව නියෝජනය කරන්න පී.බී. දිසානායක මැතිතුමාට අවස්ථාව, හැකියාව ලැබුණා. ඒ වාගේම එතුමා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති ධුරය හොබවන වකවානුවේ ඌව පළාතේ, -අපේ පළාතේ- වැඩ බලන ආණ්ඩුකාරවරයා හැටියටත් කටයුතු කළා. ඒ වාගේම උතුරු මැද පළාතේ, -එතුමාගේම පළාතේ- ආණ්ඩුකාර තනතුරේ කටයුතු කරන්නත් එතුමාට වාසනාව ලැබුණා.

මූලාසනය හොබවන අපේ ගරු සුරේන් රාඝවන් මන්ත්‍රීතුමනි, ඔබතුමා ආණ්ඩුකාර ධුරයේ කටයුතු කළ කාලයේම එතුමාත් ආණ්ඩුකාරවරයෙකු හැටියට කටයුතු කළා. අපි ඒ ගැන ආඩම්බර වෙනවා. එතුමා ආණ්ඩුකාරවරයෙක් හැටියට ඒ කාර්ය භාරයත් මැනවින් ඉෂ්ට කළා කියන එක මම මතක් කරන්න ඕනෑ. ඒ වාගේම අනුරාධපුර දිස්ත්‍රික්කයේ, -ඒ ප්‍රදේශයේ- සංවර්ධනය සඳහා, ඒ පළාතේ දියුණුව සඳහා අති විශාල කාර්ය භාරයක් එතුමා ඉටු කළා කියන එකත් මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමින්, එතුමාගේ පවුලේ සියලු දෙනාටම අපේ පක්ෂයේත්, වෙල්ලස්සේ ආදරණීය ජනතාවගේත් ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

ඉන් අනතුරුව මම සංවේගය පළ කරන්න බලාපොරොත්තු වන්නේ අපේ සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමාගේ අභාවය වෙනුවෙන්. එතුමා 2000 වර්ෂයේ ඔක්තෝබර් 17වෙනි දින ජාතික ලැයිස්තුවේ මන්ත්‍රීවරයෙක් හැටියට පාර්ලිමේන්තුවට පත් වුණා. එතුමා ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාගේ මහජන එක්සත් පෙරමුණේ ක්‍රියාකාරි දේශපාලන නායකයෙක් විධියට දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට දැවැන්ත ශක්තියක් ලබා දුන් ඒ පක්ෂයේ ක්‍රියාධරයෙක්. පොදුජන එක්සත් පෙරමුණ ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුර පත් කරනකොට විශේෂයෙන් ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට ගෞරවයක් හැටියට එවකට අපේ පක්ෂයේ නායිකාව ලෙස සිටි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය, අපේ පක්ෂයේ කෘත්‍යාධිකාරි මණ්ඩලය, පොදුජන එක්සත් පෙරමුණේ නායකකාරකාදින් මහජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමාව පත් කරන්න කටයුතු කළා.

එතුමා ජනාධිපති කාර්යාලයේ වෘත්තීය සමිති අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් හැටියටත් කටයුතු කළා. ඒ වාගේම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධිධාරියකු වන එතුමා ලංකා සම සමාජ පක්ෂයේ තරුණ සමිතිය හරහා දේශපාලනයට පිවිසුණු බවක් තමයි මම අහලා තිබෙන්නේ.

එතුමා 1983 වර්ෂයේදී මහජන එක්සත් පෙරමුණට බැඳිලා, ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාගේ නායකත්වයෙන් එහි උප සභාපතිවරයෙක් හැටියට කටයුතු කළා. 1997 වර්ෂයේදී කඩුවෙල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු හැටියට එතුමා කටයුතු කළා. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධුරය හොබවපු 2010-2015 වකවානුවේ, දිවංගත ගරු සාලින්ද දිසානායක මැතිතුමා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා හැටියට කටයුතු කරන කොට එතුමා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සභාපතිවරයා හැටියට කටයුතු කරමින් ඒ ආයතනයේ පරිපාලනය සඳහාත් දැවැන්ත නායකත්වයක් ලබා දෙමින් දේශීය වෙදකමට, දේශීය ආයුර්වේද වෙදකම් කටයුතුවල පුනර්ජීවය සඳහා විශාල ශක්තියක් ලබා දුන්නා. එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමින්, එතුමාගේ පවුලේ සියලු දෙනාටම වෙල්ලස්සේ ආදරණීය ජනතාවගේත්, අපේ පාර්ලිමේන්තු කණ්ඩායමේත් ශෝකය මා ප්‍රකාශ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ සුවිශේෂී චරිතයක් වෙලා හිටපු, දීර්ඝ කාලීනව අපි ඇසුරු කළ මිත්‍රයෙක් ගැන කථා කිරීමටයි මම ඊළඟට බලාපොරොත්තු වන්නේ. ඒ, අපේ ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා. මිත්‍රපාල මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බැඳෙන්න පෙර ලංකා සමසමාජ පක්ෂය තමයි

නියෝජනය කළේ. පසුව එතුමා අපේ පක්ෂයට බැඳිලා වාමවාදී අදහස් තිබෙන නායකයෙකු හැටියට කෑගල්ල දිස්ත්‍රික්කයට සුවිශාල සේවාවක් ඉෂ්ට කළා. එතුමාගේ අභාවය පිළිබඳව මගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

එතුමා රුවන්වැල්ල මධ්‍ය මහා විද්‍යාලයෙන්, ගම්පහ බණ්ඩාරනායක මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබුවා. පසුව විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙන් සහ නීති විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය ලබා දක්ෂ නීතිඥවරයෙක් හැටියට කටයුතු කළා. එතුමා දක්ෂ නීතිඥවරයෙකු හැටියට කටයුතු කළා පමණක් නොවෙයි. එතුමාගේ ආදරණීය පුත්‍ර රත්නය වන අපේ හිත මිත්‍ර සාරතී දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමා නීතිඥයෙක් හැටියට පත් කරන්න, එතුමාගේ ආදරණීය දියණියන් දෙදෙනාම එතුමා ගිය පාරේම ගෙනයන්න, ඒ අය නීතිඥ වෘත්තියට ගෙන එන්න ඒ අයට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න කටයුතු කළ නායකයෙක්.

1999 අවුරුද්දේ ජූනි මාසයේදී, එදා මේ උත්තරීතර සභාව නියෝජනය කළ ගරු අතාවුද සෙනෙවිරත්න මැතිතුමා සබරගමුව පළාතේ ප්‍රධාන අමාත්‍ය ධුරයට තරග කරන්න මේ පාර්ලිමේන්තුවෙන් ඉවත් වුණා. ලැයිස්තුවේ ඊළඟ ජයග්‍රාහක අපේක්ෂකයා හැටියට හිටියේ එච්.ආර්. මිත්‍රපාල මැතිතුමායි. අතාවුද සෙනෙවිරත්න මැතිතුමා සබරගමුව පළාත් සභාවට යනකොට, ඒ වෙනුවට කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් අපේ හිත මිත්‍ර එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා මේ ගරු සභාවට ඇවිල්ලා අපිත් එක්ක ඉතා හිතවත්ව, ළෙන්ගතුව කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති, 1994, 2000 කාලයේ අපේ පසුපෙළ මන්ත්‍රීවරු කණ්ඩායම 'මල්බෙරි කණ්ඩායම' හැටියට සුප්‍රසිද්ධ වුණ බව. අපේ ආණ්ඩුව වැරදි පාරක යනකොට අපේ කණ්ඩායම ශක්තිමත් වුණා, මේ යන මාර්ගය වැරදියි කියන්න. අපට එදා ඒ ශක්තිය තිබුණා; ඒ හයිය තිබුණා.

ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් වුණත්, වැරැද්ද දුටු තැන පෙන්වා දෙන්න අපට හයිය තිබුණා. අද ඉන්න අයටත් ඒ හයිය තිබෙනවාද කියන්න මම දන්නේ නැහැ. අපට ඒ හයිය තිබුණා. මිත්‍රපාල මැතිතුමාට ඒ හයිය තිබුණා. අපේ කණ්ඩායමට ඒ හයිය තිබුණා. එදා වී අලෙවි මණ්ඩලයේ දූෂණ දකින කොට, අපි රටේ නායකත්වයට ඒවා පෙන්වා දුන්නා. අපි ඒ ගැන සොයන්න කමිටුවක් පත් කළා. වී අලෙවි මණ්ඩලයේ දූෂණ සොයා වාර්තාවක් ඉදිරිපත් කළා. අපි වහන්න හදපු වී අලෙවි මණ්ඩලය රැක ගත්තා. අදත් වී, වී අලෙවි මණ්ඩලය ඉතුරු වෙලා තිබෙන්නේ අපි එදා කළ අරගළයේ ප්‍රතිඵලයක් හැටියට.

එදාත් අද වාගේම විදුලි අර්බුදයක් තිබුණා. ඔබතුමාටත් මතක ඇති, වැඩ වර්ජනයක් නිසා දවස් දෙක-තුනක් විදුලිය නැති වුණු බව. Freezersවල තිබුණු මාළු ටික නරක් වුණා; මස් ටික නරක් වුණා. කණ්ඩායමක් හැටියට අපට එදා හැකියාව ලැබුණා, ඒ වැඩ වර්ජන කළ ආයතනවල වෘත්තීය සමිති එක්ක සාකච්ඡා කරන්න. අපේ පසුපෙළ මන්ත්‍රී කණ්ඩායම එදා මේ පාර්ලිමේන්තු ක්‍රීඩා පිට්ටනියේ වාඩි වෙලායි සාකච්ඡා කළේ. එදා හිටපු ගරු අමාත්‍යතුමන්ලාගේ දෝෂ දර්ශනයටත් අපි ලක් වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එසේ දෝෂ දර්ශනයට ලක් වුණා කියලා අපි පසුබැස්සේ නැහැ. අපි නිවැරදි දේ නිවැරදි විධියට කළා. වැරැද්ද පෙන්වා දෙන්න අපට හැකියාව තිබුණා; ශක්තිය තිබුණා. එදා එහෙම යුගයක් තිබුණේ. අපි ඒ යුතුකම් ඉෂ්ට කළා. නොයෙක් ප්‍රශ්න තිබුණත් ඒ ප්‍රශ්නවලදී කථා කරලා ඒවාට විසඳුම් හොයන්න ශක්තියක් දෙන්න අපට හැකියාව තිබුණා.

අපේ කණ්ඩායම එදා රාජ්‍ය නායකත්වයට ශක්තියක් වුණා. අපේ කණ්ඩායම එදා කැබිනට් මණ්ඩලයට ශක්තියක් වුණා. අපේ කණ්ඩායම එදා රජයට ශක්තියක් වුණා. එදා අපේ කණ්ඩායම විපක්ෂය නියෝජනය කරනවා කියලා සමහරු හිතාගෙන හිටියා. නැහැ. එහෙම වුණේ නැහැ. අපි විපක්ෂයට ඒ කාර්යය ඉෂ්ට කරන්න ඉඩ දුන්නේ නැහැ. අපි ආණ්ඩුවේ ඉඳිමින් ආණ්ඩුවේ වැරැදි පෙන්වා දීලා විපක්ෂයේ කාර්යභාරයත් අපිම ඉෂ්ට කළා. ඒක නොවෙයිද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි කරන්න ඕනෑ? කවුරුහරි වැරැද්දක් කරනවා නම් ඒක පෙන්වා දීම නේද කරන්න ඕනෑ? අන්න ඒ විධියට වැරැද්ද පෙන්වා දීමේ ශක්තියක්, අයෝමය නායකත්වයක් එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා තුළ තිබුණා.

මට මතක හැටියට, 2000 අවුරුද්දේ අප්‍රේල් මාසයේ 10වැනි දාට කලින් වාගේ අපි කණ්ඩායමක් එංගලන්තයට ගියා. මිත්‍රපාල මැතිතුමාත් අපේ කණ්ඩායමේ හිටියා. දිවංගත ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමාත් අපි මේ අවස්ථාවේ ගෞරවයෙන් සිහිපත් කරන්න ඕනෑ. සැලසුම් ක්‍රියාත්මක කිරීම් හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා හැටියට එදා එතුමා තමයි ඒ කටයුතු සංවිධානය කළේ. අපේ අනෙක් මන්ත්‍රීවරුත් විදේශ සංචාරවල යෙදිලා අත්දැකීම් හුවමාරු කරගන්න ඕනෑ කියලා එතුමා සුවිශේෂී අවස්ථාවක් ලබා දුන්නා. ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමා අපේ මන්ත්‍රීවරුන් ගැන හෙව්වා. අපේ මන්ත්‍රීවරුන්ට යම් අඩු පාඩුවක් වුණා නම්, දුකක්-වේදනාවක් තිබුණා නම් එතුමා ඒ ගැන හොයා බැලුවා. එහෙම නායකත්වයක් එතුමා අපට ලබා දුන්නා. ඒ නිසා අද අප අතර නැති වුණත් එතුමාත් මේ අවස්ථාවේ ගෞරවයෙන් සිහිපත් කරන්න ඕනෑ. එතුමා තමයි අපේ කණ්ඩායම එක්ක ගියේ. එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන ජෝන් අමරතුංග මැතිතුමා ඒකට සහභාගි වුණා. දිවංගත මනෝ විජයරත්න මැතිතුමා සහභාගි වුණා. දඹදෙණිය ආසනය නියෝජනය කළ දිවංගත සෙනරත් සුගතදාස මැතිතුමා සහභාගි වුණා. මට මතකයි, ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමාත් සහභාගි වුණා. ඩිලාන් පෙරේරා මැතිතුමා එදා රාජිත සේනාරත්න මැතිතුමාගේ පත්වීම සම්බන්ධයෙන් අභියෝගයක් කරලා නඩුවක් දමලා තිබුණා. අපි වේල්ස් සිට ලන්ඩන් බලා බස් එකේ එනකොට තමයි තොරතුරු ලැබුණේ, ඒ නඩුවෙන් ඩිලාන් මැතිතුමා දිනුවා කියලා. රාජිත සේනාරත්න මහතා මන්ත්‍රීවරයකු හැටියට ඉඳිමින් රජයේ ආයතනයකට ඖෂධ සැපයුවා කියලා ප්‍රශ්නයක් ඇති වුණු වේලාවේ තමයි ඒක වුණේ. එතකොට මිත්‍රපාල මැතිතුමන්ලා- අපි ඔක්කෝම ඒ අවස්ථාවේ එක්ව කටයුතු කළා. අපි ඒ දවස්වල කථා කළේ විනෝද වෙන්න නොවෙයි. හුඟක් අය හිතාගෙන ඉන්නේ පිට රට යන්නේ විනෝද වෙන්න කියලායි. නැහැ. අපි පැය ගණන් දේශපාලන තර්ක-විතර්ක කළා. සමහර වේලාවට නිදාගන්න යනකම් පැය ගණන් සාකච්ඡා කළා. රටේ පවතින අර්බුද ගැන, ඉදිරි ඉලක්ක ගැන අපි සාකච්ඡා කළා. අද -වර්තමානයේ- පවතින අර්බුද සම්බන්ධව "අපි අවුරුදු ගණනකින් මේවාට මුහුණ දෙයි." කියලා අපි සාකච්ඡා කළා. ඒ වාගේ හොඳ ඉදිරි දැක්මක් එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාට තිබුණා. අද පැමිණ තිබෙන අර්බුද එතුමා අවුරුදු ගණනකට පෙර දැක්කා. අවුරුදු විස්සකට විතර පෙර "රට කවදා හෝ දවසක මේ වාගේ ප්‍රශ්නයකට මුහුණ දෙයි" කියලා එතුමා දැක්කා. අන්න ඒ වාගේ හොඳ අවබෝධයක්, හොඳ දැනුමක් තිබුණු නායකයෙක් තමයි එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා.

එදා අපි කණ්ඩායම එංගලන්තයේ ඉඳලා ප්‍රංශයට, පැරිසියට ගියා. ඒ ගමනේදී අපි සියලුදෙනාම සාකච්ඡා කළේ රට දියුණු කරන කටයුතු ගැන. කෑගල්ල දිස්ත්‍රික්කයට අපි සාමාන්‍යයෙන් භාවිත කරන්නේ තුන්කෝරළේ කියලායි. තුන්කෝරළේ ජනතාව ගැන හොඳ වුවමනාවක්, හොඳ අවබෝධයක් මිත්‍රපාල මැතිතුමාට තිබුණා. මම 1994 අවුරුද්දේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා අවුරුදු 3ක්වත් ගියේ නැහැ, අපේ පක්ෂයේ නායිකාව හැටියට එදා හිටපු ජනාධිපතිතුමිය 1997 ජූනි මාසය වෙනකොට මා පශු සම්පත් නියෝජ්‍ය ඇමතිවරයා විධියට පත් කළා. මම පශු සම්පත් නියෝජ්‍ය ඇමති හැටියට කටයුතු කළේ දිවංගත සෞම්‍යමූර්ති

[ගරු ජගත් පුෂ්පකුමාර මහතා]

තොන්ඩමන් මැතිතුමා සමඟ. ඊට පස්සේ හීන්මහත්මයා ලියනගේ මැතිතුමා ඒ තනතුර දැරුව බව මට මතකයි. ඉන් අනතුරුව අපේ එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාත් පශු සම්පත් නියෝජ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කළා. වෙළෙඳ නියෝජ්‍ය ඇමතිවරයා හැටියටත් - ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමාගේ නියෝජ්‍ය ඇමතිතුමා හැටියටත්- මිත්‍රපාල මැතිතුමා කටයුතු කළා. මට මතක හැටියට එතුමා බන්දුල ගුණවර්ධන මැතිතුමා එක්කත් කටයුතු කළා. එතුමාට දේශපාලනය ගැන හොඳ අවබෝධයක් තිබුණා. එතුමාට නීතිය පිළිබඳ හොඳ අවබෝධයක් තිබුණා. එතුමාට පරිපාලනය ගැන හොඳ අවබෝධයක් තිබුණා.

2000දී නැවත ජයග්‍රහණය කරලා එතුමා 2000 සැප්තැම්බර් මාසයේ 14 වෙනතෙක් පාර්ලිමේන්තුවේ හිටියා. පොඩි කාලයයි හිටියේ. නැවත 2004 ඉඳලා 2010 දක්වා අවුරුදු 5යි, මාස 8ක් එතුමා විවිධ තනතුරු දරමින් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් කටයුතු කරපු ශ්‍රේෂ්ඨ නායකයකු බව මතක් කරන්න ඕනෑ. මිත්‍රපාල මැතිතුමා මට මතක හැටියට අවුරුදු 73ක් පමණ ආයු වළඳා හදිසි හෘදයාබාධයකින් තමයි අප අතරින් වියෝ වුණේ. එතුමා හොඳ දේශපාලන පන්නරයක් තිබුණු කෙනෙක්. එතුමා ලංකා සමසමාජ පක්ෂය කියන වාමාංශික පක්ෂයෙන් දේශපාලන ගමන ආරම්භ කරලා, ඉදිරි දේශපාලන ගමන සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තෝරා ගත්තා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දැරණියගල ආසනයේ සංවිධායකවරයා හැටියට කටයුතු කළා. එතුමා එසේ කටයුතු කළ වකවානුවේ මම ජාතිය ගොඩ නැඟීමේ ඇමතිවරයා හැටියට කටයුතු කළා. ඒ අවස්ථාවේ මම ඇහුවා, "මිත්‍රේ, මගේ අමාත්‍යාංශයෙන් මොනවාද කරන්න ඕනෑ" කියලා. එතුමා කිව්වා, "අනේ, මට ගමකට ලයිට් ටිකක් ගන්න ඕනෑ" කියලා. මට ඒ ගමේ නම නම් මතක නැහැ. ලයිට් ගන්න ඕනෑ කිව්වාම මම කිව්වා, "ඇස්තමේන්තු කරන්න" කියලා. අපි සතියක් ඇතුළත ඒ සල්ලි දුන්නා. ඊට පස්සේ ඒක විවෘත කරන්න ඕනෑ කිව්වාම මම කිව්වා, අනේ මට වෙලාවක් නැහැ කියලා. එතුමා කිව්වා, "නැහැ, නැහැ, මම මාසයක් හරි ඉන්නවා. ඔබතුමාම එන්න ඕනෑ" කියලා. එතුමා ඒක විවෘත කරන්නේ නැතිව කවදා හරි මම එනකම්ම හිටියා. ඉතින්, මම දිනයක් යොදාගෙන ගියා. මට එදා වැඩ ගොඩක් තිබුණා. නමුත් එතුමා "කෑම ටිකක් කාලාම යන්න ඕනෑ" කිව්වා. එදා රෑටත් කාලා රෑ 10.00ට, 11.00ට විතර තමයි මම එතැනින් ආවේ. මට දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමා නිරන්තරයෙන් කිව්වා ඒ ගමන පිළිබඳව. අපේ තාත්තා, ජගත් ඇමතිතුමා නිරන්තරයෙන් සිහිපත් කළා කියලා එතුමා කිව්වා. ඒ විධියට අපේ දීර්ඝ කාලීන මිත්‍රත්වයක් තිබුණා. එතුමාට වැඩ කරන්න වුවමනාව තිබුණා. එතුමා ඒ ප්‍රදේශයේ ජනතාවට වැඩ කරන්න දැවැන්ත ශක්තියක් දුන්න නායකයෙක් බව විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

1988 වර්ෂයේ අපේ සමහර සහෝදරවරු ඡන්දය ඉල්ලන්න දුන්නේත් නැහැනේ. ඡන්දේ දුන්නොත් මරනවා කිව්වා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම ඒ අයගේ නම් ගම් කියන්නේ නැහැ. එදා ඡන්දය දාන්න යන පළමුවන පස්දෙනාම මරනවා කිව්වා. එහෙම යුගයක් තිබුණේ. අපේ ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමාට මතක ඇති, එහෙම යුගයක් තිබුණු බව. ඡන්දය දාන්න යන පළමුවැනි පස්දෙනා මරනවා කිව්වා. ඒ අවස්ථාවේ එතුමා 1988 පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වුණා. එතුමා පළාත් සභා මැතිවරණය ජයග්‍රහණය කරලා පළාත් සභාවේ විපක්ෂ නායකවරයා හැටියට කටයුතු කළා. ඒ වාගේම, එතුමා සබරගමුව පළාත නියෝජනය කරමින් 1993දීත් පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කළා. මම මේ කියාගෙන ආවේ එතුමාගේ දේශපාලන ඉතිහාසය. හුඟක් වෙලාවට අපිට මේ කාරණා අමතක වෙනවා. භීෂණයට මුහුණ දීලා, මරනකොට, වෙඩි තියනකොට වෙඩි උණ්ඩයට භයේ හැංගෙන යුගයක් තිබෙනකොට ඒ වෙඩි උණ්ඩයට භය නැතුව මුහුණ දුන්න දේශපාලන නායකයෙක් තමයි, මිත්‍රපාල මැතිතුමා. එතුමා ඒ අත්දැකීමේ පන්නරය තිබුණු දේශපාලන නායකයෙක්. ඒ වාගේම, එතුමා ආපු ඒ ගමන, ඒ අසිපත නැවත අතට ගන්න, ඒ ශක්තිය දෙන්න තුන් කෝරළයේ ජනතාව වෙනුවෙන් එතුමාගේ පුත්‍ර රත්නය නායකත්වය ලබා දෙනවා. එතුමා 2015 මැතිවරණයේදීත් විවිධ අභියෝග මැද, විවිධ ප්‍රශ්න මැද පාර්ලිමේන්තුව නියෝජනය කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 වාගේ නොවෙයි, 2019, 2020 කියන වර්ෂ. 2020 උඩිනුත් ගහනවා; යටිනුත් ගහනවා; හරහටත් ගහනවා, හැම පැත්තෙන්ම ගහනවා. 2019 ජනාධිපතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේ කණ්ඩායම ලොකුම අභියෝගයට මුහුණ දුන්නා. ඇතුළෙනුත් ගහනවා; පිටිනුත් ගහනවා, උඩිනුත් ගහනවා, යටිනුත් ගහනවා. හැම පැත්තෙන්ම ගහද්දි මේ සියල්ලටම ඔරොත්තු දෙමින් 1988 වෙඩි තියනකොට, මරනකොට ඒවාට අභීතව මුහුණ දුන්න පියෙකුගේ නියම පුත්‍රයෙක් හැටියට සාරතී දුෂ්මන්ත මැතිතුමාට මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව ලබා දීමට තුන් කෝරළයේ ජනතාව, කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාව කටයුතු කළා. එතුමා අධිකරණ අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිවරයෙක් හැටියට කටයුතු කළා. ගරු මන්ත්‍රීතුමනි, හොඳ දැනුමක් තිබෙන, අවබෝධයක් තිබෙන නායකයෙක් හැටියට තමන්ගේ ආදරණීය පියාණන්ගේ ගමන් මඟ ඉදිරියට ගෙනියන්න, තුන් කෝරළයේ ජනතාවට ඒ සේවාව සපයන්න නායකත්වය ලබාදීම පිළිබඳව අපි ඔබතුමාට ගරු කරනවා, ගරු සාරතී දුෂ්මන්ත මන්ත්‍රීතුමනි. අපි ඔබතුමාගේ පියාණන්ට -අපේ එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාට- නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. අපේ හිත මිත්‍ර එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේ ආදරණීය බිරිඳටත්, ආදරණීය පුත්‍රයා වන සාරතී දුෂ්මන්ත මැතිතුමාටත්, ආදරණීය දියණියන් දෙපළ ඇතුළු සියලුදෙනාටත් මගේ පෞද්ගලික ශෝකයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ශෝකයත්, ආදරණීය වෙල්ලස්ස ජනතාවගේ ශෝකයත් පළ කරනවා.

අපේ මේ දිවංගත නායකයන් ගැන කථා කරනවා නම්, තව පැය ගණනක් වුණත් කථා කරන්න පුළුවන්. නමුත් අපේ තවත් කථික මහත්ම මහත්මීන් විශාල පිරිසකට එතුමන්ලාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කරන්න අවස්ථාව ලබා දෙන්න ඕනෑ නිසා මම මගේ කථාව මෙතැනින් නතර කරනවා. අභාවප්‍රාප්ත ඒ ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාට නිවන්සුව අත්වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

[අ.භා. 3.36]

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජල සම්පාදන අමාත්‍යතුමා)**

(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - நீர் வழங்கல் அமைச்சர்)

(The Hon. Vasudeva Nanayakkara - Minister of Water Supply)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ පාර්ලිමේන්තුවේ සංවේගය පළ කරන නිමිත්ත වන්නේ, ඒ කියන ලද ගරු ආනන්ද රත්නායක, ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ, ගරු සෝමවීර චන්ද්‍රසිරි, ගරු පී.බී. දිසානායක, ගරු එච්.ආර්. මිත්‍රපාල යන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීන් සම්බන්ධයෙන් බව අපි කවුරුත් දන්නවා. මේ අවස්ථාවේදී මම විශේෂයෙන් මගේ අදහස් පළ කරන්න බලාපොරොත්තු වන්නේ, එච්.ආර්. මිත්‍රපාල හිටපු සහෝදර මන්ත්‍රීතුමා ගැනයි. ඊට අමතරව මම බලාපොරොත්තු වෙනවා, මා ඉතා හොඳින් ඇසුරු කළ සෝමවීර චන්ද්‍රසිරි හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා ගැනත් වචනයක් කියන්න.

අනෙක් සියලු මන්ත්‍රීවරුන්ගේ වටිනාකම ගැන අපේ අනෙකුත් මන්ත්‍රීතුමන්ලාගේ කථාවලින් කියැවුණා. එතුමන්ලාගේ ගුණගරුකත්වය, එතුමන්ලා ඉටු කළ මෙහෙවර ආදී සියල්ල ගැන මා අනෙකුත් මන්ත්‍රීවරු සමඟ එකතු වෙනවා, එතුමන්ලා වෙනුවෙන් අපගේ සංවේගය පළ කරන්න. සෝමවීර චන්ද්‍රසිරි හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා හැම වෙලාවේම ජනතාවගේ පැත්තේ හිටපු කෙනෙක්. ජනතාවගේ ඕනෑම ක්‍රියාකාරී විරෝධය පැමකදී, ප්‍රතිගාමී ආණ්ඩු බලය තිබෙන කාලයේ එතුමාගේ දැවැන්ත ශරීරය අප කවුරුත් ඉදිරියේ බොහොම අභීත ලෙස අපට දකින්න ලැබුණා. ඒ වාගේම එතුමා බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දුන්නා. වෘත්තීය සමිති ව්‍යාපාරය එතුමාට බොහොම සමීපව තිබුණා. ඒ වාගේම මහජන එක්සත් පෙරමුණේ මන්ත්‍රීවරයෙක් හැටියට එතුමා හැම දාම වාමාංශිකයන්ගේ එක්සත් බලයක් ගැන විශ්වාස කළා. ඒ අනුව එවැනි අවස්ථා එළැඹෙනකොට එතුමා ඉතාම උනන්දුවෙන් ඒවා ක්‍රියාවට නඟා ගැනීම ගැන වෙහෙසුණා.

ඊළඟට, මා හිතවත් සහෝදර එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා ගැන මම කථා කරන්න කැමැතියි. එතුමා තුන් කෝරළය නියෝජනය කළ, තුන් කෝරළය වෙනුවෙන් බොහෝ සේ කැප වූ තුන් කෝරළයේ පුත්‍රයෙක්. ඒ නිසා තුන් කෝරළය එතුමාගේ අභාවය ගැන කම්පා වුණා. එතුමාගේ සේවයත් තුන් කෝරළයටම ලැබුණා. එතුමා මන්ත්‍රීවරයෙකු වාගේම නීතිඥවරයෙකු හැටියටත් කටයුතු කළා. එතුමා අධිකරණයේ කටයුතු කළ කාලයේ තුන් කෝරළයම වාගේ අවිස්සාවේල්ල අධිකරණයටයි සම්බන්ධ වුණේ. එහිදී එතුමා ගාස්තුව පෙරට නොදමා තමන්ගේ සේවය තමන්ගේ සේවාදායකයන්ට ලබා දීමට ඉදිරිපත් වුණා. එතුමාගේ බොරු වාටු කථා තිබුණේ නැහැ; බොරු වාටු රඟපෑම් තිබුණේ නැහැ. එතුමාගේ කරුණාව අභ්‍යන්තර වශයෙන් අපට බොහෝ විට දකින්න පුළුවන් වුණා. එය ප්‍රකාශ කළෙත් බොහොම සංයමයකින් යුතුවයි. ඒ තමයි එතුමාගේ කරුණාව. අපි ඒක දේශපාලනඥයන්ගේ බොහොම විරල දෙයක් හැටියටයි දකින්නේ. දේශපාලනඥයන් සාමාන්‍යයෙන් තිබෙන කරුණාවට වඩා තමන්ගේ ඡන්ද දායකයාට, නැත්නම් තමන්ගේ ආධාරකරුවාට බොහෝ සෙයින් කරුණාව පෙන්වනවා. අපේ එච්.ආර්. මිත්‍රපාල සොහොයුරාට තිබුණේ බාහිරව නොපෙන්වන අභ්‍යන්තර කරුණාවක්.

එතුමා ජනවාර්ගික සමගිය හුඟක් අගය කළා. එතුමා තුළ ඒ සමසමාජ ප්‍රතිපත්තිය දිගටම තිබුණා. ජනවාර්ගික සමගිය උදෙසා වචනයකින් හෝ දායක වෙන්න පුළුවන් කොතැනද, එතැන එතුමා හිටියා. ජාතිවාදීව මතු වන හැම බලපෑමකදීම එතුමා ඊට එරෙහිව සිටියා. ඒ වාගේම වතුකරයේ සිටින දමිළ සේවකයින් සම්බන්ධයෙන් එතුමා ඉතාම කරුණාවෙන් කටයුතු කළා. එතුමාගේ ප්‍රදේශයේ බොහෝ සෙයින් දමිළ කම්කරු ජනතාව සිටින අතර, එතුමාගේ එක ප්‍රධාන ක්‍රියාකාරී අංශයක් වූයේ ඒ කම්කරු ජනතාව සම්බන්ධයෙන් කටයුතු කිරීමයි. ඔවුන්ට ඇතිවන බලපෑම්, පීඩන සම්බන්ධයෙන් එතුමා නිතරම තමන්ගේ හඬ අවදි කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිතුල් ගස කියන්නේ සබරගමුවේ වැඩි වශයෙන් තිබෙන, ඉතාම වටිනා අගයක් ඇති, ඒ වාගේම ඉතාම වටිනා පානයක් අපට ලබා දෙන ශාකයක්. මේ කිතුල් රා නිෂ්පාදනයට තහනමක් තිබුණා. ඒක සුද්දන් පැනවූ තහනමක්. අපේ කිතුල් ගහේ රාවලට සුද්දන් තහනම දැම්මේ සුද්දන්ගේ අරක්කු විකුණලා ඔවුන්ගේ බද්ද එකතු කර ගන්නයි.

එහෙම නැතිව, මේ රටේ මිනිසුන් රා බීමෙන් වැළැක්වීමට, නැත්නම් ගමේ මිනිසුන්ගේ රා බීමේ පුරුද්ද අඩු කිරීම පිළිබඳව තිබුණා වූ යම් කිසි සදාචාරවාදී පදනමක් නිසා නොවෙයි එහෙම කළේ. ඔවුන්ට තමන්ගේ බද්ද එකතු කර ගන්න තිබුණු එක මාර්ගයක් තමයි, අරක්කු පානය සඳහා ගැමි ජනතාව යොමු කිරීම. මම මේ කාරණය කිව්වේ ගරු එච්.ආර්. මිත්‍රපාල හිටපු නියෝජ්‍ය ඇමතිතුමාට මේ ගැන ලොකු හැඟීමක් තිබුණු බව පෙන්වන්නයි. සබරගමුවේ කිතුල් ගස් නිකම් අපරාදේ වියළී යනවා. ඒ වාගේම අපේ මිනිසුන්ගේ දිව කට ඒ වෙනුවෙන් තිබෙන්නා වූ අභිලාෂයෙන් වියළී යනවා. මේ නිසා රා නිෂ්පාදනය නීත්‍යනුකූලභාවයකට ගෙන එන්න ගත්තා වූ විවිධ පියවර ගැන එතුමා උනන්දුවෙන් සිටියා. ඒ වුණත් සුරාබදු දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තේ, රා නිෂ්පාදනයට විරුද්ධව සහ රා නිපදවන මිනිහාගේ එම ජීවිකාවට විරුද්ධවයි. එම නිසා අපි එකතු වෙලා බොහොම මහන්සියෙන් හා සාමූහිකව ඒ සම්බන්ධයෙන් අදාළ පියවර ගන්න උපදේශක කාරක සභා රැස්වීම් පැවැත්වූවා. එහිදී ඉතා පැහැදිලිව, රා නිෂ්පාදනය සුරාබදු නීතියෙන් බැහැර කිරීමට වුවමනා වගන්ති ලියවන්න මිත්‍රපාල හිටපු නියෝජ්‍ය ඇමතිතුමා විශාල මෙහෙවරක් කළා. එම නිසා කිතුල් මදින්නන්ට නිදහසක් ලැබුණා, රා නිපදවන්න සහ රා බොන්න. හැබැයි, කිතුල් රා ප්‍රවාහනය කිරීම වාගේම විකිණීමත් තහනම්. ඒකත්, එතෙක් තිබුණු වැරැදි, මෝඩ නීතියේම දිගුවක්. එම දිගුවත් කපා දමන්න දැන් කාලය ඇවිල්ලා තිබෙනවා. නමුත්, ඒවා "රා" වෙන්න ඕනෑ. මම රා ගැන ඕනෑවට වඩා කථා නොකළ යුතුයි. ඒක අපේ මිත්‍රපාල සහෝදරයා මත තියන්න නොව, ඒ සඳහා මා තුළ තිබූ උනන්දුවට මට හිටපු හොඳම සගයා මිත්‍රපාල සහෝදරයා බව කියන්නයි මම මේ හදන්නේ.

එතුමාගේ ගම් ප්‍රදේශයේ සංවර්ධනයට එතුමාගෙන් විශාල වැඩ කොටසක් ඉෂ්ට වුණා. ඒ ප්‍රදේශවල ගම් නියම්ගම් අතරට යන්න ජනතාවට තිබුණු අපහසුතා, එහෙම නැත්නම් දුෂ්කරතා අඩු කරලන්න මංමාවත් හදන්න, පාලම් හදන්න එතුමා ඉටු කළ මෙහෙවර අතිවිශාලයි. එම නිසා ඒ මුළු තුන් කෝරළයේම ප්‍රබෝධයක් ඇති වුණා.

සාරතී දුෂ්මන්ත මන්ත්‍රීතුමා කියන්නේ එතුමාගේ පියා වාගේම අපේ හිතවත් තවත් මන්ත්‍රීවරයෙක්. සාරතී දුෂ්මන්ත මන්ත්‍රීතුමා අද මාවනැල්ල ආසන සංවිධායකවරයා හැටියට කටයුතු කරනවා. තුන් කෝරළයේ ජනයා සමඟ එතුමාට තිබෙන්නා වූ සම්බන්ධයත් පෙකණිවැලට සම්බන්ධ වෙලා තිබුණු එකක් සේ මා සලකනවා. එම නිසා තුන් කෝරළයේ ජනතාව එතුමාගෙන් බලාපොරොත්තු වන නායකත්වය එම ජනතාවට ලැබෙන්න අවශ්‍යයි.

එච්.ආර්. මිත්‍රපාල හිටපු නියෝජ්‍ය ඇමතිතුමා නිර්ව්‍යාජ පුද්ගලයෙක්. මම එතුමා ගැන නැවත කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමහර වෙලාවට එතුමාගේ නිර්ව්‍යාජත්වය ඕනෑවට වඩා වැඩියි. එතුමා කොයි තරම් නිර්ව්‍යාජද කිව්වොත්, එතුමා යම් යම් කරුණු ගැන උනන්දුවක් නැහැ කියලා මිනිස්සු වරදවා වටහා ගන්නත් යෙදුණා. එම නිසා එතුමාගේ හදවතින් අදහස් එළියට එන්න ටික වෙලාවක් ගත වුණා. ඒ වාගේම එතුමා නිදහස් කල්පනාවේ නිමග්නව ඉන්න ලොකුම ලොකු ආසාවකින් පෙළුණු කෙනෙක්. නිදහස් කල්පනාවේ නියුක්තව ඉන්නත්, ඒ කල්පනාවෙන් යම් කිසි රසයක් විඳින්නත් තමයි එතුමා එක්තරා විශ්‍රාමයකට ගියේ. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ සිටියේ ප්‍රාදේශීය ගැටලුවක් නිසායි. නැත්නම් එතුමා ප්‍රතිපත්ති අතින්, සමසමාජවාදී අතින් එක අංශු මාත්‍රයක්වත් වෙනස් වෙලා නොතිබුණු බව මට විශ්වාසයි. ඒ ගැන මම සහතික වෙනවා.

අපේ හිටපු සහෝදර මන්ත්‍රීතුමන්ලා වන ගරු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමාගේ, ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාගේ, ගරු පී.බී. දිසානායක මැතිතුමාගේ සහ ගරු ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමාගේත් අභාවයන් පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා වෙනුවෙන් අද මේ ගරු සභාවට පැමිණ සිටින ඒ පවුල්වල නෑදෑ හිතවතුන් සියලු දෙනාටත්, අභාවප්‍රාප්ත හිටපු

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

නියෝජ්‍ය අමාත්‍ය ගරු එච්.ආර්. මිත්‍රපාල සහෝදරයාගේ මැතිනියට, එම දූවරුන් දෙදෙනාට, අපේ සහෝදර මන්ත්‍රී ගරු සාරතී දුෂ්මන්ත මැතිතුමාටත් අපගේ හෘදයංගම සංවේගය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඒ වාගේම මිත්‍රපාල සහෝදරයා වැනි නිර්ව්‍යාජ, කාරුණිකභාවයෙන් යුත් සැබෑ අවංක පුද්ගලයන් තව තවත් මේ රටේ බිහි වන්න එතුමා ලබා දුන් ආදර්ශය හේතු වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වනවා.

[අ.භා. 3.48]

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
**(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)**
**(The Hon. Weerasumana Weerasinghe)**

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සම්ප්‍රදායයක් විධියට, මේ උත්තරීතර ආයතනය නියෝජනය කරන මහජන නියෝජිතයන් මිය ගිය පසු එතුමන්ලාගේ අභාවය පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා මේ ගරු සභාවට ඉදිරිපත් කිරීම සිදු කරනු ලබනවා. ඒ අනුව අද එවැනි මන්ත්‍රීතුමන්ලා හතර දෙනෙකු වන ගරු ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමා, ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමා, ගරු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා, ගරු පී.බී. දිසානායක මැතිතුමා සහ හිටපු අමාත්‍යවරයකු, නියෝජ්‍ය අමාත්‍යවරයකු වන ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේත් අභාවය පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ සියලු දෙනාගේම අභාවය පිළිබඳව පළමුවෙන්ම අපේ සංවේගය ප්‍රකාශ කරනවා.

වෘත්තීය සමිති ව්‍යාපාරය සහ කම්කරු ව්‍යාපාරය පැතේතනුත්, දේශපාලනිකවත් මෙතුමන්ලා අතරින් අපට ළඟින්ම සම්බන්ධකම් තිබුණු චරිතයක් තමයි, ගරු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා. ඒ නිසා අපි පළමුව එතුමා විසින් සිදු කළ කාර්ය භාරය හා දායකත්වය පිළිබඳව සිහිපත් කරන්න ඕනෑ. විශේෂයෙන්ම එතුමා ලංකා සමසමාජ පක්ෂයෙන් දේශපාලනය ආරම්භ කරලා, මහජන එක්සත් පෙරමුණේ ඉහළ තනතුරක් දක්වාම ගමන් කරපු දේශපාලනඥයෙක්. වෘත්තීය සමිති ක්ෂේත්‍රය වෙනුවෙන් කරපු කැප කිරීම සහ දායකත්වයත්, ඒ වාගේම වෘත්තීය සමිති අරගළවලට ලබා දුන් නායකත්වයත් එතුමා දේශපාලනික වශයෙන් ලැබූ පන්නරයක් කියා මා විශ්වාස කරනවා. එතුමා හැම මොහොතේදීම පොදුජන ව්‍යාපාර එක්ක, මහජන අරගළ එක්ක සෘජුවම පෙනී සිටිමින් කැපී පෙනෙන විධියට කටයුතු කළ නායකයෙක්. එතුමා මහජන එක්සත් පෙරමුණේ වර්තමාන නායකතුමා වන ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට දැවැන්ත ශක්තියක් ලබා දුන් වෘත්තීය සමිති නායකයෙක්. ඒ වාගේම ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා සඳහන් කළ ආකාරයට, පසුගිය කාල පරිච්ඡේදයේ යම් යම් දේශපාලන අරගළ ඇති වූ අවස්ථාවේදී වමේ පක්ෂ හා ප්‍රගතිශීලී පක්ෂ අතර සමගිය ඇති කිරීම වෙනුවෙන් එතුමා සුවිශේෂී දායකත්වයක් ලබා දුන්නා. එතුමා කඩුවෙල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයකු විධියට ටික කාලයක් කටයුතු කළා. ඒ වාගේම උත්තරීතර හතරවැනි පාර්ලිමේන්තුව -මෙතෙක් ලංකාවේ අඩුම කාලයක් තිබුණු පාර්ලිමේන්තුව- නියෝජනය කරන්නත් එතුමාට අවස්ථාව ලැබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ කම්කරු ජනතාවට සුවිශේෂී සේවාවක් කළ ගරු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමාගේ අභාවය පිළිබඳව එම පවුලේ සියලු දෙනාට අපේ ශෝකය ප්‍රකාශ කරනවා.

ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා ගැන අපි දැන ගන්නේ දේශපාලන භාවිතය තුළිනුයි. එතුමා ලංකා සමසමාජ පක්ෂයට දැවැන්ත නායකත්වයක් ලබා දුන්නා. මම ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය නියෝජනය කළාට මගේ පියා ලංකා සමසමාජ පක්ෂය නියෝජනය කළ නායකයෙක්. ඒ නිසා සමසමාජ ව්‍යාපාරය සම්බන්ධයෙන් වූ හැඟීම්, දැනීම් අතින් අපට බොහොම ළඟ සබඳතාවක් තිබුණා. එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා ලංකා සමසමාජ පක්ෂය නියෝජනය කරමින් තරුණ නායකයකු විධියටත්, උගත් නීතිඥයකු විධියටත් තුන් කෝරළයේ මිනිසුන් මුහුණ දුන් ප්‍රශ්න සහ අරගළවලදී දක්වපු මැදිහත්වීම අපි මේ අවස්ථාවේදී අගය කළ යුතුයි. මොකද, ලංකාවේ දේශපාලන විවිධත්වය දිහා බලනකොට තුන් කෝරළය කියන්නේ ඉතාම අපූරු, අමුතු තැනක්. දේශපාලනික වශයෙන් නොයෙක් බෙදීම්, ප්‍රශ්න -ගැටලු- තිබුණු තුන් කෝරළය තුළ දේශපාලන භාවිතය තුළදී එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා දැවැන්ත කාර්ය භාරයක් සිද්ධ කළා. එක්දහස් නවසියතිස් ගණන්වලදී සූරියමල් ව්‍යාපාරය නිර්මාණය කළ ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා ඇතුළු කණ්ඩායමෙන් පන්නරය ලැබූ භූමියක් තමයි, තුන් කෝරළය කියන්නේ. එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාට තිබුණු දැනුම, බුද්ධිය හා නිර්ව්‍යාජකමට සමසමාජ ව්‍යාපාරය තුළින් ලැබුණු පන්නරයත් එක්ක එතුමාගේ දේශපාලන ගමන තවත් ආලෝකවත් වුණා. ඉන් පසු උද්ගත වූ යම් යම් කාරණා නිසාවෙන් එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක එකතු වී දේශපාලනය කළා.

තුන් කෝරළයේ මිනිස්සු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාට මොන තරම් ගරු කරනවාද, සලකනවාද කියන කාරණයේ ජීවමාන සාක්ෂිය තමයි, අභියෝග රැසක් මධ්‍යයේ වුණත් අද සාරතී දුෂ්මන්ත මැතිතුමා මේ පාර්ලිමේන්තුව නියෝජනය කිරීම. එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාට තුන් කෝරළයේ මිනිස්සු දක්වන ආදරයේ තරම සාරතී දුෂ්මන්ත මැතිතුමා මේ පාර්ලිමේන්තුව නියෝජනය කිරීම තුළින් පෙන්නුම් කරන බව මම විශ්වාස කරනවා. මොකද, මේ කාල සීමාව තුළදී සාරතී දුෂ්මන්ත මැතිතුමාගේ පාර්ලිමේන්තු ආගමනය සරල ගමනක් නොවෙයි. තුන් කෝරළයේ මිනිස්සු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාට දක්වන ගෞරවයේ සංකේතයක් විධියට තමයි සාරතී දුෂ්මන්ත මැතිතුමා මේ පාර්ලිමේන්තුව නියෝජනය කිරීම මම සිහිපත් කරන්නේ.

අද දින අපි කථා කරන ගරු ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමාගේ, ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාගේ, ගරු සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමාගේ, ගරු පී.බී. දිසානායක මැතිතුමාගේ, ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේ අභාවය පිළිබඳව මගේ සංවේගයත්, මම නියෝජනය කරන ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ සංවේගයත් මේ මොහොතේ ප්‍රකාශ කරමින්, මම නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ස්තුතියි.

[අ.භා. 3.53]

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
**(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)**
**(The Hon. Premnath C. Dolawatte)**

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අප භුක්ති විඳින මානව නිදහස, මානුෂීය අයිතිවාසිකම්, කම්කරු අරගළවල ප්‍රතිඵල ලෙස භුක්ති විඳින කම්කරු අයිතිවාසිකම් ආදි අයිතිවාසිකම් සියල්ල දිනා දීම වෙනුවෙන් අතීතයේ සිටි ජනතාව, ජනතා නායකයන් විශාල පරිශ්‍රමයක් දැරුවා. ඒ වෙනුවෙන් කළ සටන්වලදී, අරගළවලදී ඒ අය දහඩිය කඳුළු වැගිරූ වාර අනන්තයි. එහි ප්‍රතිඵලයක් හැටියට පාර්ලිමේන්තුව නියෝජනය කළ, ඒ සටන්වලට උර දුන් පාර්ලිමේන්තු සටන් සගයන් පස්දෙනෙකු සිහි කරන අවස්ථාවයි, මෙය. මෙවැනි මොහොතක එතුමන්ලා ගැන කථා කිරීමට අවස්ථාවක් ලබා ගැනීමට හැකි වීම මා ලද භාග්‍යයක් කොට සලකනවා.

උතුරු මැද පළාත් සභාවේ සභානායකවරයාව සිටියදී අභාවප්‍රාප්ත වූ ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමාත්, පී.බී. දිසානායක මැතිතුමාත්, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ නීතිඥතුමාත්, සෝමවීර චන්ද්‍රසිරි නම් වූ කම්කරු නායකයාත්, එච්.ආර්. මිත්‍රපාල හිටපු අමාත්‍යතුමාත් අපි අද ගෞරවයෙන් සිහිපත් කරනවා; එතුමන්ලාගේ අභාවයන් වෙනුවෙන් අපගේ ශෝකය පළ කරනවා. දීර්ඝ වෙලාවක් ගත නොහැකි වුණත්, එතුමන්ලා විසින් මනුෂ්‍ය ප්‍රජාවේ ඉදිරි දියුණුව වෙනුවෙන්, මානුෂීය පැවැත්ම වෙනුවෙන් කරන ලද මෙහෙය, දායකත්වය මම මේ අවස්ථාවේ ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා.

විශේෂයෙන්ම පී.බී. දිසානායක මැතිතුමා වෙනුවෙන් මේ අවස්ථාවට සහභාගි වී සිටින පවුලේ සැමටත්, ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමා වෙනුවෙන් සහභාගි වී සිටින පවුලේ සැමටත්, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ නීතිඥතුමා වෙනුවෙන් සහභාගි වී සිටින, එතුමාගේ පවුල නියෝජනය කරන සැමටත් අපි අපගේ ශෝකය මේ අවස්ථාවේ පළ කරනවා. ඒ අයගේ ඥාතිවරුන් මේ රට වෙනුවෙන්, මේ දැය වෙනුවෙන් කරන ලද මෙහෙය අපි මේ අවස්ථාවේ ගෞරවයෙන් සිහිපත් කරනවා.

විශේෂයෙන්, අපට ආශ්‍රය නිශ්‍රය කරන්න පුළුවන් වෙච්ච, අපට දැනිච්ච සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමා සම්බන්ධයෙන් මා වචන කීපයක් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. කඩුවෙල මා උපන් ප්‍රදේශය තුළ පසුගිය කාලය පුරාවට විශාල වශයෙන් කළ දේශපාලන අරගළ හරහා අපි එතුමාව දැන හැඳිනගත්තා. මහජන එක්සත් පෙරමුණ සහ වාමවාදී දේශපාලන කණ්ඩායම ඉදිරියට ගෙන යන්න, අප ජයග්‍රහණය කළ අවස්ථාවල වාගේම පරාජිතව සිටි අවස්ථාවලදීත්, කළ සටන්වලදීත් සෝමවීර චන්ද්‍රසිරි මහත්මයා එක්ක අප උරෙන් උර ගැටී, එකතු වී වැඩ කළා කියන කාරණය මා සිහිපත් කරන්නේ බොහොම ආදරයෙන් යුතුවයි. එතුමාගේ අභාවය වෙනුවෙන්, එතුමාගේ පවුලේ සාමාජිකයන්ටත් මා මේ අවස්ථාවේදී ශෝකය පළ කරන අතරම, එතුමා විසින් සමාජය වෙනුවෙන් කරන ලද මෙහෙය සම්බන්ධයෙන් අපගේ ගෞරවය ද පුද කරන්න කැමැතියි.

මා මිත්‍ර නීතිඥ ගරු සාරතී දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමාගේ පියාණන් වන එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා ගැනත් මම විශේෂයෙන් කියන්න ඕනෑ. අප එතුමා හඳුනා ගත්තේ සාරතී දුෂ්මන්ත මැතිතුමා හරහායි. අපි දුෂ්මන්ත මැතිතුමා ගැන කථා කරන කොට එතුමාගේ පියා ගැනත් නිරන්තරයෙන් කථා කරනවා. විශේෂයෙන්ම දුෂ්මන්ත මැතිතුමාගේ හැසිරීම තුළින්, එතුමාගේ නායකත්වය තුළින් අපි එතුමාගේ පියා දකිනවා; කියවනවා. එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේ දේශපාලන ප්‍රවාහය, එතුමාගේ දේශපාලන කියැවීම සුවිශේෂීයි. එතුමා තමන්ගේ දේශපාලන ගමන ලංකා සමසමාජ පක්ෂයෙන් ආරම්භ කරලා, පළමුවැනි පළාත් සභාවේ විපක්ෂ නායකයා වෙලා, ඉන් අනතුරුව දීර්ඝ දේශපාලන ගමනක් ආවා. දේශපාලනඥයා ගැන අපේ කියවීම වන්නේ, දේශපාලනඥයා බලයට බෙහෙවින් කෑදර බවයි; බලය අත් නොහරින බවයි. නමුත් දේශපාලනයේ අනාගත දියුණුව වෙනුවෙන් තරුණයන්ට ඉඩ ලබා දෙන්නේ කොහොමද යන්න එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා මොනවට පැහැදිලි කර දුන්නා, තම පුතා දේශපාලන ප්‍රවාහයට එක් කරලා. එතුමාගේ ඒ නායකත්වයේ සලකුණු සහ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් මා එතුමාට ගෞරවය පුද කරන අතරම, එතුමාගේ අභාවය සම්බන්ධයෙන්, එතුමාගේ පවුලේ අයටත් අපගේ ශෝකය ප්‍රකාශ කරනවා. මා හිතවත් නීතිඥ ගරු සාරතී දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමාටත් අපගේ ගෞරවය පුද කරනවා. ඒ වාගේම, අද අප සිහිපත් කරන, අභාවප්‍රාප්ත, ඒ සියලු පාර්ලිමේන්තු සගයන් සමාජයේ ප්‍රගමනය වෙනුවෙන් කරන ලද මෙහෙය සම්බන්ධයෙන් අපේ ප්‍රණාමය පුද කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 3.57]

**ගරු සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு சாரதீ துஷ்மந்த)
(The Hon. Sarathi Dushmantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දින ශෝක යෝජනා ගෙන එමින් සිහිපත් කෙරෙන, ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ මැතිතුමාගේ, ආනන්ද සරත් කුමාර රත්නායක මැතිතුමාගේ, සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමාගේ සහ පී.බී. දිසානායක මැතිතුමාගේ පවුල්වල ඥාති හිතමිත්‍රාදීන් සියලු දෙනාට මා මේ අවස්ථාවේදී අපගේ ශෝකය පළ කර සිටිනවා.

දීර්ඝ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරපු මගේ පියාණන් වන එච්.ආර්. මිත්‍රපාල මැතිතුමාගේ අභාවය වෙනුවෙන් අද දින ගෙන ආ ශෝක යෝජනාව ඉදිරිපත් කරමින් අදහස් දැක්වූ ගරු අග්‍රාමාත්‍යතුමා, එම ශෝක යෝජනාවට එක් වෙමින් අදහස් දැක්වූ හිටපු ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, ගරු සභානායකතුමා, ගරු ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් ඇතුළු පක්ෂ විපක්ෂ සියලු මහජන නියෝජිතයන්ට මේ වෙලාවේ මගේ ගෞරවය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ පියාණන් ක්‍රියාකාරී දේශපාලනය ආරම්භ කළේ ලංකා සම සමාජ පක්ෂයෙන්. හැබැයි, අපේ සීයා -මිත්‍රපාල හිටපු ඇමතිතුමාගේ පියාණන්- එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් වෙලා තමයි ගම් සභාවට තරග කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (DR.) SUREN RAGHAVAN *left the Chair and* THE HON. SPEAKER *took the Chair.*

**ගරු සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு சாரதீ துஷ்மந்த)
(The Hon. Sarathi Dushmantha)

ගරු කථානායකතුමනි, විශේෂයෙන් මගේ පියාණන් සම සමාජ දේශපාලනයට යොමු වුණේ විශ්වවිද්‍යාලයට ගියාට පසුවයි. ඊට පසුව 1980 ගණන්වල ඉඳලාම එතුමා ලංකා සම සමාජ පක්ෂයේ ක්‍රියාකාරී දේශපාලනයේ නිරත වුණා. 1988 වර්ෂයේදී මුලින්ම පළාත් සභාවට ගිය මගේ පියාණන් අතාවුද සෙනෙවිරත්න මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත් වී ගියාට පසුව සබරගමුව පළාත් සභාවේ විපක්ෂ නායක ධුරයට පත් වුණා. ඒ වකවානුව අද වාගේ නොව, දේශපාලනය කිරීමේදී බොහොම අභියෝග එල්ල වුණු කාල සීමාවක්. ගරු කථානායකතුමනි, ඒ බව මෙතැන සිටින ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෝ සියලුදෙනා දන්නවා. විශේෂයෙන්ම මම මේ වෙලාවේ සිහිපත් කරන්නට ඕනෑ, මගේ පියාණන් දේශපාලනය ආරම්භ කරපු වකවානුව තුළ එතුමා එක්ක සම කාලීනව දේශපාලනයේ නියැළුණු උදවිය වන හිටපු අමාත්‍ය අතාවුද සෙනෙවිරත්න මැතිතුමා, හිටපු කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍ය වයි.ජී. පද්මසිරි මැතිතුමා සහ එතුමාගේ සහෝදරයා වූ ලෙස්ලි යටන්වල මැතිතුමා. එතුමා 1989 වර්ෂයේදී හෝ 1990 වර්ෂයේදී හෝ ඝාතනයට ලක් වුණා. එතුමා මගේ පියාණන්ගේ හොඳම

[ගරු සාරතී දුෂ්මන්ත මහතා]

මිත්‍රයා. එතුමාත් නීතිඥවරයෙක්; පළාත් සභා මන්ත්‍රීවරයෙක්. ඒ වාගේ සිදුවීම් වූ, බොහොම අපහසු කාල සීමාවක තමයි මගේ පියාණන් දේශපාලනය කළේ.

ඊට පසුව 1994 වර්ෂයේ සිදු වූ බල පෙරළියේදීත් එතුමා සුවිශේෂී වූ සේවාවන් රාශියක් වමේ කඳවුරට ඉෂ්ට සිද්ධ කළා. ඒ වාගේම, මම මේ අවස්ථාවේ විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ, ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමාගේ වෙළෙඳ හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිවරයා හැටියටත් මගේ පියාණන් සැහෙන කාලයක් කටයුතු කළ බව. ඒ නිසා එතුමා සමඟත් විශාල සම්බන්ධතාවක් මගේ පියාණන්ට තිබුණා. ඒ වාගේම, ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමාත් මම මේ වෙලාවේදී විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. අද අප අතර නොසිටියත්, ආරුමුගන් තොණ්ඩමන් හිටපු ඇමතිතුමාත් සිහිපත් කරන්නට ඕනෑ. එතුමා සමඟත් මගේ පියාණන් විවිධ අමාත්‍යාංශවල කටයුතු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මගේ පියාණන් සමාජවාදී දේශපාලනයෙන් දේශපාලනයට ප්‍රවිෂ්ට වුණා. මම හොඳාකාරව දන්නා දෙයක් තමයි, අවසාන භාගයේ මගේ පියාගේ එකම සහ අවසාන බලාපොරොත්තුව බවට පත් වුණේ තුන්කෝරළයේ ජනතාවගේ ජීවන මට්ටම උසස් කිරීමයි කියන එක. විවිධ මතවාද තුළින් ඉදිරියට යමින්, විශ්වවිද්‍යාලය තුළ වේවා, ඉන් පිටතදී වේවා, ලංකා සමසමාජ පක්ෂයේ දේශපාලන න්‍යායන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලන න්‍යායන් ආදී හැම දේත් එක්කම ඉදිරියට යමින් එතුමා ජනතාවට සේවය කළා. මා විශ්වාස කරන විධියට, අවසානයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ තුන්කෝරළයයි, "මිත්‍රපාල" නාමයයි දෙකක් නොව එකක් කියන තත්ත්වයට පත් වන තැනට මගේ පියාණන්ගේ දේශපාලන කටයුතු කාරණා සිද්ධ වුණා.

ගරු කථානායකතුමනි, තුන්කෝරළය ගත්තාම, එය අදටත් සැහෙන ප්‍රශ්න තිබෙන ආසන තුනක්. කෑගල්ල දිස්ත්‍රික්කයේ ආසන නවයෙන් ආසන තුනක් තමයි තුන්කෝරළය කියන්නේ. ඒවා නම්, රුවන්වැල්ල, දැරණියගල සහ යටියන්තොට.

අපේ කෑගල්ල දිස්ත්‍රික්කයේ සියයට 51ක භූමි ප්‍රමාණයක තිබෙන්නේ තුන්කෝරළය. දැරණියගල ආසනයේ අවසාන නිවසේ ඉඳලා -අන්තිම ගෙදර ඉඳලා- ශ්‍රී පාදයේ උඩ මලුවට තිබෙන්නේ කිලෝමීටර 9යි. සැහෙන විශාල ආසනයක්. යටියන්තොට ආසනයත් එහෙමයි. මේ ආසනවලට තිබුණු, අදටත් තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, සංවර්ධනයේදී අනෙකුත් ආසනවලට බෙදන හැන්දෙන්ම මේ ආසනවලටත් බෙදන එක. ඒ නිසා සංවර්ධනය පැත්තෙන් ගත්තාම මේ ආසන ටිකක් පස්සට යනවා. ඒ දුරස්ථභාවය අවම කරන්න සැහෙන වැඩකොටසක් මගේ පියාණන් ඒ කාලයේ ඉෂ්ට සිද්ධ කළා. හිටපු හැම ආණ්ඩුවලදීම එතුමාට ඒ කටයුත්ත කරන්න පුළුවන්කම ලැබුණා.

ගරු වාසුදේව නානායක්කාර අමාත්‍යතුමා මතක් කළා, කිතුල් නිෂ්පාදකයන්ට පසුගිය කාල සීමාව තුළ තිබුණු ප්‍රායෝගික ප්‍රශ්න පිළිබඳව. විශේෂයෙන්ම අපේ පළාතේ කිතුල් වගා කරන නිසා මම විශේෂයෙන් ඒ ගැන මතක් කරන්නට ඕනෑ. එම වගාකරුවන්ට තිබුණු ප්‍රායෝගික ප්‍රශ්න විසඳන්න මගේ පියාණන් මේ පාර්ලිමේන්තුව තුළදී අණ පනත් වෙනස් කරන්න මූලිකත්වය අරගෙන කටයුතු කළා. ඒ සඳහා මගේ පියාණන්ට වර්තමාන මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාත් එදා උදව් උපකාර කළ බව මා මතක් කරන්න ඕනෑ. මගේ පියාණන් දේශපාලනයේ තනතුරුවල හැම දාම ඉන්න හිතුවේ නැහැ. මාව දේශපාලනයට යොමු කරලා එතුමා ක්‍රියාකාරී දේශපාලනයෙන් ඉවත් වුණා; මැතිවරණවලට ඉදිරිපත් වීම නැවැත්වුවා. අද අපේ රටේ බොහෝ වෙලාවට එවැනි තත්ත්වයක් අපි දකින්නේ නැහැ. එතුමා අවසානය වන තෙක් දැරණියගල ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරයා හැටියට සිටියා. එතුමාට ස්වාධීන දේශපාලන ගමනක් තිබුණා. "අපි දේශපාලනය කරන්නේ තනතුරු පසුපස යන්න නොවෙයි, ජනතාවට සේවය කරන්න" කියන කාරණාව තමයි මගේ පියාණන් මට හැම විටම කිව්වේ. තනතුරු ලැබුණත්, නැතත් ජනතාවට සේවය කිරීම අංක එක හැටියට තිබෙන කර්තව්‍යය බව තමයි මගේ පියාගේ මුවින් හැම දාම පිට වුණේ. මොන ප්‍රශ්න, අභියෝග, බාධක ආවත් එතුමා ඒ ලබා දුන් පන්නරය තුළ තමයි අපේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාව නියෝජනය කරමින් මට අද පාර්ලිමේන්තුවට එන්න පුළුවන්කම ලැබුණේ කියලා මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

කෑගල්ල දිස්ත්‍රික්කයේ දේශපාලන ගෝල බාලයෝ සැහෙන පිරිසක් නිර්මාණය කරන්න එතුමාට පුළුවන්කම ලැබුණා. මම පෞද්ගලිකව දන්නා කාරණයක් තමයි, දේශපාලනය කරන්න අපහසු වකවානුවක් තුළ එතුමා අපේ තුන්කෝරළේ තැළෙන පෑගෙන මිනිසුන් වෙනුවෙන් අවිස්සාවේල්ල අධිකරණයේ හැම දාම නොමිලයේ පෙනී සිටියා කියන එක. ඒ කරගෙන ආපු කටයුත්ත නිසා තුන්කෝරළයේ ජනතාවගේ එතුමා සමඟ දැඩි සම්බන්ධතාවක් පැවතුණා. අපට අදටත් ගරුත්වය ඇතුළු හැම දේම ලැබෙන්න හේතුව ඒ සම්බන්ධතාව හා මගේ පියාගේ දේශපාලන ව්‍යාපාරය. මම හිතන්නේ එතුමාගේ සමකාලීනයෝ අදත් පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒ සියලුදෙනාටත් මම ස්තුතිවන්ත වනවා, ඒ කාල සීමාවල එතුමාට ලබා දුන් සහයෝගය පිළිබඳව. මට මතකයි අන්තිම කාලයේ මගේ පියාණන් නිවසට වෙලා සිටියත්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්මත වුණු ගමන්ම එම පනතේ ආකෘතියක් මුද්‍රණය කරලා අපේ නිවසට ආපු සියලුදෙනාටම ලබා දුන්නා. අණ පනත් පිළිබඳව මෙන්ම, නීතිය පිළිබඳව තිබෙන දැනුම එක්ක තමයි ඒ සියල්ලටම මැදිහත් වෙන්න එතුමාට පුළුවන්කම ලැබුණේ.

පාර්ලිමේන්තුව තුළදී වාගේම, අපේ ප්‍රදේශයේ, ඒ වාගේම රූපවාහිනී වාද-විවාද හැම එකකම වාගේ එතුමා හොඳ කථිකයෙක්. මට මතකයි එක් වරක් අය වැය විවාදයේ පළමු කථාව ආරම්භ කළේ මගේ පියාණන්. ඒ වකවානුව තුළ එතුමා අපේ පක්ෂයේ ප්‍රධාන කථිකයෙක් වුණා. මට තවම මතකයි, මගේ පියාණන් පාර්ලිමේන්තුව තුළ තම මංගල කථාව කරන කොට විරුද්ධ පක්ෂයෙන් බාධා විශාල ප්‍රමාණයක් ආවා. එවිට එවකට හිටපු කථානායකතුමාට සිද්ධ වුණා, මංගල කථාව කරන මන්ත්‍රීවරයාගේ කථාවට බාධා කරන්න එපා කියලා පාර්ලිමේන්තුව ඇතුළේ ප්‍රකාශ කරන්න. මගේ පියාට දේශපාලන වශයෙන් බොහෝ අත් දැකීම් තිබුණා. එතුමා ජනතාව වෙනුවෙන් සැහෙන වැඩකොටසක් කළා. ඒක තුන්කෝරළේ මිනිසුන්ට අමතක වෙලා නැහැ. එතුමාගේ දේශපාලන භාවිතයෙන් අපට ලබා ගත හැකි බොහෝ ආදර්ශ තිබෙනවා.

අද ශෝක යෝජනා ඉදිරිපත් කර තිබෙන අනෙකුත් සියලු මන්ත්‍රීවරුන් පිළිබඳව කළ කථාබහ මම අහගෙන සිටියා. මගේ පියාණන් මිය යනකොටත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයකුව සිටියා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආසන සංවිධායකවරයා හැටියටයි සිටියේ. එතුමා අනුගමනය කළ දර්ශනයක් තිබුණා. එතුමා ලංකා සමසමාජ පක්ෂයෙන් දේශපාලනය ආරම්භ කළා. එතුමා කවදාවත් ලංකා සමසමාජ පක්ෂයෙන් ඉවත් වුණේ නැහැ. මම හිතන හැටියට බොහොම සීමිත පිරිසක් තමයි මේ කාරණාව ගැන දන්නේ. එතුමා 1993 පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වෙලා කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වැඩිම මනාප ලබා ගත්තා. ඒත් එක්කම වාගේ

2000 වර්ෂයේ පාර්ලිමේන්තු මහ මැතිවරණයක් පැවැත්වුණා. විශේෂයෙන්ම අතාවුද සෙනෙවිරත්න මැතිතුමා පාර්ලිමේන්තුවට ආවාට පසු මගේ පියාණන් පළාත් සභාවේ එතුමාට දීපු අමාත්‍ය ධුරය අතහැර පාර්ලිමේන්තුවට ආවා; ඒ අවුරුද්දක කාල සීමාවට පාර්ලිමේන්තුවට ආවා. හැබැයි, එතුමාට ඊළඟට තිබුණු මහ මැතිවරණය ජයග්‍රහණය කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඊට පසුව පක්ෂය විසින් නැවත වතාවක් එතුමාව පළාත් සභාවේ මන්ත්‍රීකමට පත් කළා. මොකද, එතුමා 1993දී වැඩිම මනාප ලබාගත් මහජන නියෝජිතයා වීම නිසා. මගේ පියාණන් නැවත පළාත් සභාවට ආවාට පසු මට මතක විධියට 2001 නැවත වතාවක් පාර්ලිමේන්තු මහ මැතිවරණයක් තිබුණා. මගේ පියාණන් එම මැතිවරණයට ඉදිරිපත් නොවෙන්නයි සිටියේ. හැබැයි, ගෙදරටම ගෙනැල්ලා nomination papers අත්සන් කළා. ඒ කාලයේ චන්ද්‍රිකා මැතිනිය තමයි නාම යෝජනා එව්වේ. සමසමාජ පක්ෂයෙන් හිතුවේ මගේ පියාණන් සමසමාජ පක්ෂයෙන් අයින් වෙලා නාම යෝජනා අත්සන් කළා කියලා. එම මැතිවරණයෙන් වමේ කඳවුරේ සියලුදෙනා පරාජයට පත් වුණා. ඊට පසු ලංකා සමසමාජ පක්ෂයේ පක්ෂ සාමාජිකත්වයෙන් සහ මන්ත්‍රීකමෙන් නෙරපුවාය කියා මගේ පියාට ලිපියක් මඟින් දැනුම් දුන්නා. ඕනෑ නම්, මගේ පියාණන්ට තිබුණා නඩු කියලා ඉතිරි අවුරුදු තුන පළාත් සභාවේ ඉන්න. හැබැයි, පක්ෂයට තිබුණු ගෞරවය නිසා මගේ පියාණන් කාටවත් කිසිවක් කියන්නේ නැතිව අවුරුදු තුනක් ඉතිරිව තියෙද්දීත් පළාත් සභා මන්ත්‍රී ධුරයෙන් ඉවත් වුණා. එහෙම ඉවත් වෙලා 2004දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරයා හැටියට ආපසු මැතිවරණයට ඉදිරිපත් වුණා.

වංචාව, දූෂණය, නාස්තිය ගැන කථා කරන කොට අපේ රටේ සහ අපේ දිස්ත්‍රික්කයේ බොහෝ චරිත පිළිබඳව කථා කරනවා. නමුත් මගේ පියාගේ ජීවිතය දෙස බැලුවාම මූලික වශයෙන්ම මට පෙනෙන කාරණයක් තමයි, අදටත් කෑගලු දිස්ත්‍රික්කයේ කාටවත් මගේ පියාට ඇඟිල්ලක් දිගු කර "හොරා" කියා කියන්නට පුළුවන්කමක් නැහැ කියන එක. එතුමා දේශපාලනයෙන් කිසිම දෙයක් හම්බ කළේ නැහැ. නීතිඥ වෘත්තියේ උපරිම මට්ටමට පැමිණ සිටියදී තමයි මගේ පියාණන් අමාත්‍ය ධුරය භාර ගැනීම සිද්ධ වන්නේ. මේ නිසා අධිකරණයට සම්බන්ධ වන්න තිබෙන අපහසුතාව මත මගේ පියා 2000 වර්ෂයේ පමණ සිට නීතිඥ වෘත්තියේ යෙදුණේ නැහැ.

මම මීට වඩා දීර්ඝ වශයෙන් අදහස් දක්වන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අද කථා කළ සියලුදෙනාටම මම ස්තුතිවන්ත වෙනවා. අපි බලාපොරොත්තු වන්නේ නිර්මල දේශපාලනයක්. වංචාව, දූෂණය, නාස්තිය නොමැති දේශපාලනයක්. ඒ නිසා මගේ පියා ගෙන ගිය ඒ වැඩ පිළිවෙළ අපි අනිවාර්යයෙන්ම ඉදිරියට රැගෙන යනවාය කියන කාරණය මතක් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන අභාවප්‍රාප්ත ගරු ආනන්ද රත්නායක, ගරු ආර්.ආර්.ඩබ්ලිව්. රාජපක්ෂ, ගරු සෝමවීර චන්ද්‍රසිරි, ගරු පී.බී. දිසානායක සහ ගරු එච්.ආර්. මිත්‍රපාල යන මහත්වරුන්ගේ අභාවයන් පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනා අනුමත කරමින් මම ද ඒ සමඟ එකතුවීමට කැමැත්තෙමි. අද දින රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපතක් ශෝකයට පත් එම පවුල්වල අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට මම නියෝග කරමි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 4.11ට, 2022 මාර්තු 08 වන අඟහරුවාදා පූ.භා. 10.00 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி. ப. 4.11 மணிக்கு பாராளுமன்றம், 2022 மார்ச் 08, செவ்வாய்க்கிழமை மு.ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Parliament adjourned accordingly at 4.11 p.m. until 10.00 a.m. on Tuesday, 08th March, 2022.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මීන් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர்  தமது உரையின்  இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.